# වාර්ෂික වාර්තාව සහ ගිණුම්

# 2014

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# දැක්ම

" එතෙර වෙළඳපොළ සඳහා නිපුනත්වයෙන් පිරි මිනිස් සම්මත සැපයීමේ ලොව හොඳම තේරීම බවට ශ්‍රී ලංකාව පත්වීම"

# මෙහෙවර

" දේශීය ආර්ථිකයට දායක වෙමින් හා සියළුම පාර්ශවකරුවන්ගේ යහපත සුරක්ෂිත කරමින්, ජනතාවට තම කුසලතාවන්ගෙන් එතෙර රැකියා වෙළඳපොළෙහි යහපත් ප්‍රතිලාභ ලැබිය හැකි කාර්යක්ෂම හා සමානත්වයෙහන් යුතු මාර්ගයන් බිහිකිරීම"

# සංඥාපනය

-------------

අදාල කාල පරිච්ඡේදය තුල විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභ සාධන අමාත්‍යතුමන් විසින් ප්‍රතිපත්ති තීරණ ක්‍රියාවට නැංවීමෙහිලා සිදු කරන ලද මග පෙන්වීම වෙනුවෙන් මාගේ ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි අන්තර්ගත අරමුණු ක්‍රියාත්මක කිරීමේදී විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභ සාධන අමාත්‍යාංශයේ ලේකම්තුමන්,කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය, කාර්යාංශයේ නිලධාරීන් සහ අනෙකුත් කාණ්ඩවලට අයත් සේවක සේවිකාවන්,බලයලත් විදේශ රැකියා නියෝජිතායතන විසින් දක්වන ලද සහයෝගය වෙනුවෙන් මාගේ ස්තුතිය පිරිනැමීමට කැමැත්තෙමි.

ආර්.කේ.ඔබේසේකර
සභාපති
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# පටුන


| | | |
|---|---|---|
| 1. | වාර්ෂික වාර්තාව | 1 |
| 2. | මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශනය | 30 |
| 3. | විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 31 |
| 4. | ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 32 |
| 5. | හිමිකම් වෙනස්වීම් පිලිබඳ ප්‍රකාශනය -සමූහය | 34 |
| 6. | හිමිකම් වෙනස්වීම් පිලිබඳ ප්‍රකාශනය -කාර්යාංශය | 35 |
| 7. | වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති හා ගිණුම් සඳහා සටහන් | 36 |
| 8. | විගණකාධිපති වාර්තාව | 63 |
| 9. | විගණකාධිපති වාර්තාවේ කරුණු පිළිබඳව කාර්යාංශයේ නිරීක්ෂණ | 87 |

❖ **කාර්යාංශය සංස්ථාපනය කිරීම**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය 1994 අංක 4 දරන පණතින් සංශෝධිත, 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ ප්‍රතිපාදන යටතේ සංස්ථාපනය කරන ලද අතර 2009 අංක 56 දරන නවතම සංශෝධනයෙන් 2010.11.22 දින සිට විදේශ රැකියා ප්‍රවර්ධන සහ සුභසාධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

❖ **කාර්යාංශයේ පරමාර්ථ**

2009 අංක 56 දරන පණතින් සංශෝධිත කාර්යාංශයේ පරමාර්ථ පූර්වෝක්ත පණතේ 15 වන වගන්තියෙන් දක්වා තිබේ. ඒ අනුව ප්‍රධාන පරමාර්ථ වන්නේ විදේශ රැකියා කටයුතුවලට සහය දෙමින් හා නියාමනය කරමින් ශ්‍රී ලංකාවෙන් පිටතදී ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය හා ආරක්ෂාව තහවුරු කිරීම. ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ රැකියා ප්‍රවර්ධනය හා සංවර්ධනයයි.

❖ **අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්**

2014 වර්ෂය තුළ 2014.01.01 දින සිට 2014.06.14 දින දක්වා පහත සඳහන් අධ්‍යක්ෂවරු විසින් මණ්ඩලය නියෝජනය කරන ලදී.

| | | |
|---|---|---|
| 1 | අමල් සේනාලංකාධිකාර මහතා | සභාපති |
| 2 | රොඩ්නි එම් පෙරේරා මහතා | අධ්‍යක්ෂ |
| 3 | ජී.ඩී.සී. ඒකනායක මිය | අධ්‍යක්ෂ |
| 4 | අශෝකා අලවත්ත මිය | අධ්‍යක්ෂ |
| 5 | සුසිල් රණසිංහ මහතා | අධ්‍යක්ෂ |
| 6 | එම්.පී.පතිරණ මහතා | අධ්‍යක්ෂ |
| 7 | එම්.ඉසඩ්.එම්.මන්සූර් මහතා | අධ්‍යක්ෂ |
| 8 | එල්.ඒ.ආර්.එන්.පෙරේරා මහතා | අධ්‍යක්ෂ |
| 9 | රොහාන් සෝමවංස මහතා | අධ්‍යක්ෂ |
| 10 | බී.පී.නියදඩුපොල මහතා | අධ්‍යක්ෂ |
| 11 | ඒ.ආර්.බී.නිහ්මඩීන් මහතා. | අධ්‍යක්ෂ |

2014 වර්ෂය තුළ 2014.06.15 දින සිට පහත සඳහන් අධ්‍යක්ෂවරුන් මණ්ඩලය නියෝජනය කරනු ලැබීය.

| | | | |
|---|---|---|---|
| 1. | අමල් සේනාලංකාධිකාර මහතා | - | සභාපති |
| 2. | ජී.ඩී.සී. ඒකනායක මිය | - | අධ්‍යක්ෂ |
| 3. | අශෝකා අලවත්ත මිය | - | අධ්‍යක්ෂ |
| 4. | එස්. ඒ.ඒ.පෙරේරා මහතා | - | අධ්‍යක්ෂ |
| 5. | සුසිල් රණසිංහ මහතා | - | අධ්‍යක්ෂ |
| 6. | එම්.පී.පතිරණ මහතා | - | අධ්‍යක්ෂ |
| 7. | එච්.එම්.එස්.බණ්ඩාර මහතා | - | අධ්‍යක්ෂ |
| 8. | එල්.ඒ.ආර්.එන්.පෙරේරා මහතා | - | අධ්‍යක්ෂ |
| 9. | බී.පී.නියදඩුපොල මහතා | - | අධ්‍යක්ෂ |
| 10. | ඒ.ආර්.බී.නිහ්මඩීන් මහතා. | - | අධ්‍යක්ෂ |
| 11. | එස්.ඊ.රත්නායක මහතා | - | අධ්‍යක්ෂ |

2014 වර්ෂය තුළ මණ්ඩල රැස්වීම් 11ක් පැවැත්වූ අතර මණ්ඩල පත්‍රිකා 177ක් මණ්ඩලයට ඉදිරිපත් කර ඇත.

❖ **විගණන සහ කළමණාකරණ කමිටු**

2014 වර්ෂයේ දී කමිටුව ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කරනු ලැබුයේ 2011 සහ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වර්ෂ සඳහා විගණකාධිපති විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ සහ කෝප් වාර්තා සහ වෙනත් කැපී පෙනෙන විගණන ඡේද සමාලෝචනය, පුහුණු මධ්‍යස්ථාන පරීක්ෂාව ,ප්‍රසම්පාදන කටයුතු සහ 2011 සිට 2013 දක්වා වාර්ෂික කාර්ය සාධන වාර්තා සම්බන්ධයෙනි.

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය 2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය වෙනුවෙන් තම වාර්ෂික වාර්තාව සහ 2014 වර්ෂය සඳහා කාර්යාංශයේ මූල්‍ය වාර්තා ඉදිරිපත් කර සිටියි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,විදේශ සේවා නියුක්ති කර්මාන්තයේ ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයන් සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට වසර 29ක සේවයක් මේ වන විට සම්පූර්ණ කර ඇත.

**ප්‍රතිපත්තිමය කාර්යයන්**

කාර්යංශය විසින් වර්ෂය තුළ සමාලෝචනය කළ ප්‍රතිපත්තිමය කාර්යයන් පහත බලගැන්නුම් ක්ෂේත්‍රයන් යටතේ වර්ග කළ හැකිය.

- ❖ යහ පාලනය සහ විදේශ සේවා නියුක්ති කර්මාන්තය නියාමනය කිරීම
- ❖ විගමනික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල් ආරක්ෂා කිරීම සහ බල ගැන්වීම
- ❖ සංක්‍රමණය සහ සංවර්ධනය
- ❖ ව්‍යාපාර උපාය මාර්ග ධෛර්යමත් කිරීම සඳහා ඒකාබද්ධ සම්පත් උපයෝජනය

## ❖ යහ පාලනය සහ විදේශ සේවා නියුක්ති කර්මාන්තය නියාමනය කිරීම

බලතල පැවරීම, අනුමැතිය දීම, ගිවිසුම් ලියාපදිංචි කිරීම, විමර්ෂණ, නීති යන අංශ සහ ප්‍රතිග්‍රාහක රටවල් සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම විදේශ සේවා නියුක්ති කර්මාන්තයේ රෙගුලාසි හා බැඳුණු ප්‍රධාන කටයුතු වේ. ඉහත අංශයන් මගින් සමාලෝචනය කරනු ලබන වර්ෂය තුළ පහත සඳහන් කටයුතු ඉටු කරන ලදී.

- **බලපත්‍ර නිකුත් කිරීම සහ අවලංගු කිරීම**

1985 වර්ෂයේ අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්නි කාර්යංශ පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව කාර්යංශය හැරුනු විට අන් කවර හෝ පුද්ගලයෙකු මෙම පනත යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් දරන්නේ නම් මිස, විදේශ සේවා නියුක්ති නියෝජිතායතනයක් පවත්වාගෙන නොයා යුතුයි.
බලපත්‍ර නිකුත් කිරීමේ අංශය උක්ත පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම සහ අවලංගු කිරීම හා සම්බන්ධ රාජකාරි ඉටුකර තිබේ. එම අංශයේ කාර්ය සාධනය පහත පරිදි වේ.

| | **2014 වර්ෂය** | **2013 වර්ෂය** |
|---|---|---|
| නිකුත් කළ නව බලපත්‍ර සංඛ්‍යාව | 101 | 108 |
| අලුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | 998 | 926 |
| බලපත්‍ර නියෝජිතයන් සඳහා පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 09 | - |
| ඉෆ්තාර් උත්සවය සැමරීම | - | 01 |
| බලපත්‍ර අවලංගු කිරීම | 14 | - |
| තිළිණ ප්‍රදාන උත්සව සංවිධානය කිරීම | 01 | - |

- **රැකියා ඇනවුම් සඳහා අනුමැතිය ලබා දීම සහ බලපත්‍ර නියෝජිතායතනවලට ලබා දෙන අනුමැතිය පිළිබඳ දැන්වීම් පළ කිරීම**

| | **2014 වර්ෂය** | **2013 වර්ෂය** |
|---|---|---|
| අනුමත කළ රැකියා ඇණවුම් ගණන | 6,184 | 6,326 |
| අනුමත කළ රැකියා පුරප්පාඩු ගණන | - | 504914 |
| අනුමත කළ (පුවත්පත්) දැන්වීම් ගණන | 3,232 | 3,583 |
| අලුත් කළ රැකියා ඇණවුම් ගණන | 3,274 | 2,979 |

- **අවසාන (පිටත්වීමේ) අනුමැතිය ලබා දීම සහ අනාගත සංක්‍රමණිකයන් ලියාපදිංචි කිරිම**

| | **2014 වර්ෂය** | **2013 වර්ෂය** |
|---|---|---|
| අනාගත සංක්‍රමණික සේවකයන් වෙත ලබා දුන් පිටවීමේ අනුමැති ගණන | 177,896 | 181,937 |
| ස්වයං (පුද්ගල) ලියාපදිංචි වීම් | 117,054 | 109,245 |

- **සේවා නියුක්ති කොන්ත්‍රාත් ලියාපදිංචිය**

විගමණික සේවකයන්ගේ රැකියා ගිවිසුම අත්සන් කිරීමට පෙර බලපත්‍රලාභී නියෝජිතයා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා ඉදිරියේදී එකී ගිවිසුමේ අඩංගු කොන්දේසි කියවා පැහැදිලි කර දීමට පියවර ගෙන තිබේ. කොන්දේසි ගිවිසුම් 180,775 ක් 2014 වසර තුල අනුමත කර ඇත.

- **නීතිය බලාත්මක කිරිම**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විමර්ෂණ අංශය විදේශ සේවා නියුක්ති කටයුතුවල අවභාවිතයන් මූලෝත්පාටනය කිරීමේ සහ භාවිතයන් වර්ධනය කිරීමේ අරමුණු පෙරදැරිව 2014 වර්ෂයේ කටයුතු පවත්වාගෙන යනු ලැබේ.

විමර්ෂණ අංශයේ කාර්යසාධනය පහත පරිදි වේ.

| | 2014 වර්ෂය | 2013 වර්ෂය |
|---|---|---|
| වර්ෂය තුල ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | 3,272 | 3,510 |
| වර්ෂය තුළ සමථයට පත්කළ පැමිණිලි සංඛ්‍යාව | 3,614 | 2,774 |
| සිදු කළ වැටලීම් සංඛ්‍යාව | 138 | 115 |
| කටයුතු නිම කළ පරික්ෂණ ගොනු සංඛ්‍යාව | - | 98 |
| කැඳවීම් කිරීම සහ වරෙන්තු ක්‍රියාත්මක කිරීම | 887 | - |
| නීති විරෝධී බඳවාගැනීම් සහ මිනිස් ජාවාරම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 03 | - |

- **නෛතික කටයුතු**

සමාලෝචිත වර්ෂය තුළ නීති අංශය විසින් පහත සඳහන් රාජකාරි ඉටු කරන ලදී.

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත යටතේ වැරදි සිදුකළ පුද්ගලයන්ට විරුද්ධව ක්‍රියාමාර්ග කෙටුම්පත්කර ගොනු කිරීම.

- විදේශ සේවා නියුක්ති ව්‍යාපාරයෙහි නියුක්ත අවසරලත් විදේශ රැකියා නියෝජිතයන් සහ බලය නොලත් පුද්ගලයන් විසින් සිදු කරනු ලබන රැවටීම් සහ නොමඟ යැවීම්වලට හසු වූශ්‍රී ලාංකික සේවා නියුක්තිකයන් මෙන්ම විදේශ රැකියා සොයන්නන් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම.

- විවිධ පාර්ශවයන් විසින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට විරුද්ධව පවරනු ලබන නඩු වෙනුවෙන් අධිකරණයේ, විනිශ්වය සභා සහ කොමිෂන් සභාවල පෙනී සිටීම.

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අනෙකුත් අංශ සඳහා නීති උපදෙස් ලබා දීම, රජයේ නිලධාරින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් (නීතිය බලාත්මක කිරීම) පැවැත්වීම.

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙනුවෙන් නෛතික ලේඛණ සකස් කිරීම සහතික කිරීම.

**නීති අංශයේ කාර්යසාධනය පහත දැක්වේ.**

| අංශය/ ක්‍රියාකාරකම | 2014 වර්ෂය | | 2013 වර්ෂය | |
|---|---|---|---|---|
| | භෞතිකමය වශයෙන් | මූල්‍යමය වශයෙන් (රු.) | භෞතිකමය වශයෙන් | මූල්‍යමය වශයෙන් (රු.) |
| **නීති අංශය** | | | | |
| • **අධිකරණයේ පෙනී සිටීම** | | | | |
| නව නඩු පැවරීම් සංඛ්‍යාව | 270 | - | 143 | - |
| විසඳීමට ඇති නඩු සංඛ්‍යාව | 3,031 | - | 2,908 | - |
| අවසන් කළ නඩු සංඛ්‍යාව | 141 | - | 122 | - |
| අධිකරණයේ විභාග වන නඩු සංඛ්‍යාව | 3,150 | - | 3,576 | - |
| නඩු මාර්ගයෙන් විසඳීම | - | 41,888,207 | - | 1,433,688 |
| දඩ පැනවීම් | - | 1,544,000 | - | 1,195,000 |
| පනවන ලද දඩයෙන් 75%ක් බැගින් සේවක සුභසාධනයට (සේ.සු.සා.අ.) මාරු කිරීම | - | 1,158,000 | - | 896,25 |
| • **අංශවල කටයුතු සඳහා නීති සහාය ලබා දීම** | | | | |
| බලපත්‍ර අලුත් කිරීම සඳහා ඉදිරිපත් කළ වාර්තා සංඛ්‍යාව | 1,318 | - | 1,284 | - |
| සම්පූර්ණ කළ රක්ෂණ ගෙවීම් ගොනු සංඛ්‍යාව | 379 | - | 284 | - |
| කල්බදු ගිවිසුම් සහ අනෙකුත් ගිවිසුම් සකස් කිරීම /සහතික කිරීම | 45 | - | 16 | - |
| අනෙකුත් සංවිධාන විසින් පවත්වන ලද නීති වැඩමුළු සංඛ්‍යාව | 19 | - | - | - |
| මානව හිමිකම් කොමිෂන් සභාවේ සහ සමාන අනෙකුත් සංවිධාන ඉදිරියේ පෙනී සිටිමින් අවශ්‍ය තොරතුරු අවශ්‍ය අවස්ථාවලදී ලබා දීම | 10 | - | - | - |
| පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 04 | - | - | - |

## ❖ විගමණික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල් සුරක්ෂිත කිරීම සහ බලගැන්වීම

- **ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයන් සහ ඔවුන්ගේ පවුල් වෙනුවෙන් සිදුකරන ලද සුභසාධක වැඩසටහන්**

ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සුභ සාධනය වෙනුවෙන් කාර්යාංශයේ සුභසාධන අංශය විසින් පහත සඳහන් වැඩසටහන් පවත්වන ලදී.

| | 2014 වර්ෂය | | 2013 වර්ෂය | |
|---|---|---|---|---|
| | ගණන | මුදල් ප්‍රමාණය රුමිලියන. | ගණන | මුදල් ප්‍රමාණය රුමිලියන. |
| රක්ෂණ වන්දි ගෙවීම් | 2,728 | 161.93 | 2,784 | 130.52 |
| විගමණික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට විශේෂ මූල්‍ය සහනාධාර ලබා දීම | 69 | 3.847 | 163 | 9.21 |
| විගමණික ශ්‍රමිකයන්ගේ පවුල්වල දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම | 3,064 | 57.9 | - | - |
| ආබාධිත විගමණික ශ්‍රමිකයන් සඳහා නිවාස ඉදි කිරීම | 4ක් සම්පූර්ණයි<br>15ක් ඉදිවෙමින් පවති | 1.2<br>2.33 | 13<br>(ඉදිවෙමින් පවතී) | 2.3 |
| විගමණික ශ්‍රමිකයන්ගේ රෝහල් ගාස්තු ගෙවීම | - | - | 125 | 0.21 |
| විගමණික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට බස් ගාස්තු සහ ආහාරපාන ලබා දීම | 452 | 0.067 | 475 | 0.066 |
| විගමණික ශ්‍රමිකයන්ගේ විශේෂ හැකියාවන් සහිත දූ දරුවන්ට මූල්‍ය අනුග්‍රහය ලබා දීම (දරුදිරිය) | 1,587 | 0.753 | 2008 | 15.15 |
| විගමණික හා පෙරළා පැමිණි ශ්‍රමිකයන් විසින් ලබාගත් ණය සඳහා පොලී ගෙවීමට මූල්‍ය උපකාර ලබා දීම | 627 | 0.691 | 542 | 0.561 |
| විගමණික ශ්‍රමිකයන්ගේ පවුල්වලට වෛද්‍ය පහසුකම් සැළසීම සඳහා වෛද්‍ය කඳවුරු පැවැත්වීම | 805<br>(පුද්ගලයන් සංඛ්‍යාව) | 0.461 | - | - |

**ළමා ආරක්ෂණ වැඩසටහන්**

මෙම වැඩසටහන් යටතේ ළමුන් 300ක් අර්ථලාභය ලබන අතර රු.මිලියන 1.54ක් වැය කර ඇත.

- **කටුනායක ගුවන් තොටුපල කවුළු සහ සහන පියස සුභ සාධන මධ්‍යස්ථානය සහ සුභ සාධන සරණ මධ්‍යස්ථානය හරහා ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයන්ට සුභ සාධන පහසුකම් සැළසීම**

  ශ්‍රී ලාංකික දිළිඳු සේවා නියුක්තිකයන්ට සුභසාධන සහ වෙනත් පහසුකම් සැපයීමේ අරමුණු පෙරදැරිව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සේවා මධ්‍යස්ථාන 04ක් කටුනායක ගුවන් තොටුපල සහ සහන පියස සුභසාධන සරණ මධ්‍යස්ථානයේ දින 365 තුල පැය 24 පුරා ක්‍රියාත්මකව පවතී.

  තම සේවා ස්ථානයේ පැන නැගුණු විවිධ ගැටලු හේතුවෙන් ශ්‍රී ලංකාවට පෙරළා පැමිණි ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයන්, පැමිණීමේ පර්යන්තයේ සේවයේ යොදවා ඇති කාර්යාංශයේ සේවක මණ්ඩලය විසින් පිළිගනු ලැබ,ඔවුනට ගමනාගමන පහසුකම්, ආහාර සහ නවාතැන්, රෝහල්ගත කිරීම් වැනි අවශ්‍ය සුභසාධන පහසුකම් සැපයීම සඳහා සහන පියස සේවකයන් වෙත භාර දෙනු ලැබේ.

  පෙරළා පැමිණෙන්නන් ගුවන් තොටුපල සිට “සහන පියස” වෙත ප්‍රවාහනය කිරීමට ආසන 26 බස් රථය,ගිලන් රථය සහ වෑන් රථ දෙකක් යොදවා ඇත.
  2014 වර්ෂය තුල මුලු අර්ථලාභීන් ගණන 8,549 ක් විය(නැවත පැමිණෙන සහ විදේශගත වූ පුද්ගලයින්)

  රෝගී වූ මගීන් ශ්‍රී ජයවර්ධනපුර රෝහල, ජාතික රෝහල සහ මානසික රෝහල හෝ තම පදිංචි ස්ථානයට ආසන්නතම රෝහල වෙත සහන පියස මධ්‍යස්ථානයට අනුයුක්ත වෛද්‍ය නිලධාරින්ගේ නිර්දේශය මත යොමු කරනු ලැබේ. ශ්‍රී ජයවර්ධනපුර රෝහලට ඇතුළත් කළ ආගමනික ශ්‍රමිකයන්ගේ ගෙවීම් කාර්යාංශය මගින් දරනු ලැබේ.

| | **2014 වර්ෂය** | **2013 වර්ෂය** |
|---|---|---|
| ආහාර සහ නවාතැන් සපයනු ලැබූ සේවා නියුක්තිකයන් සංඛ්‍යාව | - | 11,448 |
| තම නිවාස සහ බස් නැවතුම් ස්ථාන වෙත ප්‍රවාහන පහසුකම් සපයන ලද විගමනිකයින් සංඛ්‍යාව | 169 | 260 |
| රෝහල්ගත කළ පෙරළා පැමිණි ශ්‍රමිකයන් සංඛ්‍යාව | 197 | 179 |
| බස් ගාස්තු ලබා දුන් පෙරළා පැමිණි ශ්‍රමිකයන් සංඛ්‍යාව | 5,374 | 7,753 |

මෙම සේවාවන් හැර, පිටත්ව යෑමට පෙර කාර්යාංශයේ ලියාපදිංචි වූ පුද්ගලයින්ගෙන් කෙනෙක් මියගියහොත් එම පුද්ගලයාගේ මෘත දේහය ගුවන් තොටුපලෙන් භාරගැනීමේදී අවමගුල්වියදම් වශයෙන් රු.30,000 ක් ගෙවනු ලැබේ.

තම නේවාසික ස්ථානයට තනිවම යා නොහැකි කාන්තා මගීන් සඳහා දුරකථන පණිවුඩ මගින් හෝ විදුලි පණිවුඩ සහ පොලිස් පණිවුඩ හරහා සම්බන්ධ වීමට පියවර ගෙන ඇත.

ඉහත පහසුකම සලසා දීම වෙනුවෙන් කාර්යාංශය පහත සඳහන් පරිදි වියදම් දරා ඇත.

| විස්තරය | 2014 වර්ෂය | 2013 වර්ෂය |
|---|---|---|
| | වටිනාකම (රු.) | වටිනාකම (රු.) |
| බස් ගාස්තු (විගමණික ශ්‍රමිකයන්) | 5,767,500 | 6,902,198 |
| ආහාර වේල් - මගීන් (උදැසන//දිවා/ රාත්‍රී ආහාර/ තේ) | 585,867 | 555,768 |
| ඉන්ධන වියදම් සහ වාහන නඩත්තුව | 5,742,708 | 3,128,020 |
| අනෙකුත් සුභසාධන කටයුතු (ළදරු ඇඳුම්, සබන්, ළදරු කිරිපිටි ආදිය) | 157,999 | 1,302,465 |
| ගුවන් තොටුපලෙන් භාර ගන්නා මෘත දේහ සඳහා අවමංගල්‍ය කටයුතු වෙනුවෙන් දැරූ වියදම් | 5,025,500 | 2,813,500 |
| එකතුව | **17,279,574** | **14,701,951** |

- **මත්තල ගුවන් තොටුපල කවුළු සහ සහන පියස සුභසාධන සරණ මධ්‍යස්ථානය හරහා ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයන්ට සුභ සාධන පහසුකම් සැලසීම**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් නීතිය බලගැන්වීමේ අභිලාෂයෙන් මත්තල සුභසාධන සරණ මධ්‍යස්ථානය හැරුණු විට ගුවන් තොටුපල පිටවීම් පර්යන්තයේ සහ පැමිණීමේ පර්යන්තයේ කවුලු දෙකක් ක්‍රියාත්මක කරනු ලැබේ.

ගුවන් තොටුපල අංශයේ කළමනාකරුගේ ඍජු අධීක්ෂණය යටතේ ගුවන් තොටුපල සහ සුභසාධන මධ්‍යස්ථානය පාදක කරගත් කාර්ය මණ්ඩලය දින 365 තුල පැය 24 පුරා රාජකාරියේ නියුක්තව සිටිති.

- **ගුවන් තොටුපල පිටවීම් පර්යන්තයේ කාර්යයන්/ රාජකාරි**

ප්‍රවේශ ශාලාවේ කවුළුවේ (වම්පස) සේවයේ යොදවා ඇති නිලධාරීන් විසින් ගමන් බලපත්‍ර දරණ සියලුම ශ්‍රී ලාංකික මගීන් පරීක්ෂා කර ලියාපදිංචිය සත්‍යාපනය කරනු ලැබේ. පුද්ගලික සබඳතා මත රැකියා සඳහා පිටත්ව යන පුද්ගලයන් ආපසු පැමිණෙන අවස්ථාවේදී මෙම කවුළුවේදී ලියා පදිංචිය සඳහා පහසුකම් සළසා ඇත.(නිවාඩු සඳහා ලංකාවට පැමිණි පසු)

- **සුභ සාධන මධ්‍යස්ථාන, සුභ සාධන සරණ මධ්‍යස්ථානයේ කටයුතු/ ක්‍රියාකාරිත්වය**

  තමන් සේවයට බඳවාගත් රටවලදී මුහුණ දුන් විවිධ ගැටලු හේතුවෙන් ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයන්ට ගමන් වියදම්, ආහාර සහ නවාතැන්, වෛද්‍ය ප්‍රතිකාර, රෝහල්ගත කිරීම් ආදිය කාර්යාංශයේ සුභසාධන සරණ මධ්‍යස්ථානය මගින් සලසා ඇත.

- **ඉහත පහසුකම් සැලසීම වෙනුවෙන් කාර්යාංශය දරණ ලද වියදම්**

| විස්තරය | 2014 වර්ෂය (රු) | 2013 වර්ෂය (රු) |
|---|---|---|
| බස් ගාස්තු (විගමණික ශ්‍රමිකයන්) | 3,400 | 1,700 |
| ආහාර -මගීන් (උදෑසන/දිවා/රාත්‍රී ආහාර/ තේ) | 550 | 440 |
| ඉන්ධන වියදම් සහ වාහන නඩත්තු (රු) | 1,310,860 | 1,109,296 |
| **එකතුව** | 1,314,810 | 1,111,436 |

- **ශ්‍රී ලංකා දූත.මණ්ඩල සහ සත්කාරක රටේ අනෙකුත් බලධාරීන්ගේ සහය ඇතිව ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයන්ට ආරක්ෂාව සහ සහනය සැලසීම**

කාර්යාංශයේ විදේශ සම්බන්ධතා අංශය (1) සහ විදේශ සම්බන්ධතා අංශය (11) හරහා කාර්යාංශය විසින් පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

එතෙර පරිපාලන සහ විදේශ සබඳතා අංශය ශ්‍රමය ලබාගන්නා රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල ශ්‍රම අංශයේ කටයුතු සම්බන්ධීකරණය සහ එහි කාර්යසාධනය සමාලෝචනය කිරීමේ අරමුණ ඇතිව පිහිටුවා ඇත.

වර්තමානයේ, විදේශ සම්බන්ධතා අංශය අතිරේක සාමාන්‍යාධිකාරීගේ අධීක්ෂණය යටතේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, කළමනාකරු, සහ සහකාර කළමනාකරුවන් සහ විධායක නිලධාරින් 4 දෙනෙකු (විධායක) ඇතුළු 20 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයකින් සමන්විතව ක්‍රියාත්මක වේ.

- **එතෙර පරිපාලන අංශයේ (OAD) සහ විදේශිය සබඳතා අංශයේ (FR) ප්‍රධාන කාර්යයන්**

  1. විගමනික ශ්‍රමිකයන් සම්බන්ධයෙන් විදේශිය ප්‍රතිපත්ති සකස් කිරීමට සහය දීම සහ ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

  2. එතෙර සේවක සුභසාධන අරමුදල අධීක්ෂණය සහ පාලනය

| **විස්තරය** | **වටිනාකම රු. (මිලියන)** |
|---|---|
| ආදායම් එකතු කිරීම | 788.172 (2014 ඔක්. දක්වා) |
| වියදම් | 753.442 (2014 ඔක්. දක්වා) |

සමාලෝචිත වර්ෂය තුල එතෙර සේවක සුභසාධන අරමුදල් කමිටු රැස්වීම් දොළහක් (12ක්) පවත්වන ලදී.

3. ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවල ශ්‍රම අංශයන් ශක්තිමත් කිරීම සහ හැකියා වර්ධනය

2014 වර්ෂය තුල එතෙර ශ්‍රී ලංකා දූත මණ්ඩලවල ශ්‍රම ඒකකයේ විවිධ මට්ටම්වල නිලධාරීන් 47 දෙනෙකු උපදේශකවරු, පළමු ලේකම්, දෙවන ලේකම්,තෙවන ලේකම්, ශ්‍රම ලිපිකරුවන් සහ සුළු සේවකයන් වශයෙන් පත් කර ඇත. ඉන් නිලධාරීන් 27 දෙනෙකුට සේවා දීර්ඝ ලබා දී ඇත.

4. දූත මණ්ඩලවලදී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය

සම්බන්ධ උපදේශනය සමාලෝචිත වර්ෂය තුල ශ්‍රී ලංකා දූත මණ්ඩල මගින් අලුත් කිරීම් සහ මුල් වතාවට ලියාපදිංචි වීම් 6,810ක් සිදු කර ඇත.

5. විදේශයන්හි අතරමං වූ ශ්‍රී ලාංකිකයන් නැවත සියරට පමුණුවීම

| | **සියරට පමුණුවීම් ගණන** | **දැරූ පිරිවැය (රු.මිලියන)** |
|---|---|---|
| රක්ෂණ වැඩපිළිවෙල යටතේ | 850 | 25.198 |
| සේවක සුභසාධන අරමුදල යටතේ | 242 | 9.29 |
| **එකතුව** | **1092** | **34.488** |

6. ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයන්ගේ අවමංගල්‍යයන් සම්බන්ධයෙන් සහය වීම හා මෘත දේහ ශ්‍රී ලංකාවට භාර දීම ඇතුලු කාර්යයන්හි නියුක්ත වීම.

එතෙර සේවය අතරතුර මිය ගිය ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් මරණ සඳහා වන්දි, හිඟ වැටුප් සහ අනෙකුත් හිඟ මුදල්, මරණකරු වෙනුවෙන් ගෙවන වන්දි මුදල් ආදිය ලබා ගැනීමට සහය වීම.

මූලික අවමංගල්‍ය දීමනාව වන රු.10,000.00 හෝ රු. 30,000.00 මුදල, මෘත දේහය ශ්‍රී ලංකාවට රැගෙන ආ පසු ළඟම ඥාතීන්ට ගෙවීම.

- ශ්‍රී ලංකාවට ගෙන ඒමට සහය දුන් මෘත දේහ ගණන 22
  දැරූ මුළු පිරිවැය 4.95 (ශ්‍රී ල.රු.මි.)

- සේවක සුභසාධන අරමුදල යටතේ අවමංගල්‍ය දීමනා(මෘත දේහ ගණන) 247
  දැරූ මුළු පිරිවැය 5.025 (ශ්‍රී ල.රු.මි.)

7. දැනට ශ්‍රමය ලබා ගන්නා රටවල් සහ අනාගතයේ ශ්‍රමය ලබා ගැනීමට අපේක්ෂිත රටවල් සමග රැකියා අවස්ථා විස්තාරණය සහ ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයන්ගේ සුභසාධනය සම්බන්ධයෙන් දූත මණ්ඩල යෙදවීම

| දූත මණ්ඩල | ගණන | සහභාගි වූ ගණන | පිරිවැය (ශ්‍රී ල. රු.මි.) |
|---|---|---|---|
| පිටත් කිරීම් | 36 | 190 | 20.062 |
| පැමිණීම් | 11 | 127 | 2.208 |
| **එකතුව** | **47** | **317** | **22.27** |

8. ඕමානයේ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ සුභසිද්ධිය උදෙසා ඕමානය සමග අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම

විදේශ සබඳතා 11 අංශයේ කාර්යසාධනය පහත පරිදි වේ.

| ක්‍රියාකාරකම | ප්‍රගතිය | මුළු වියදම |
|---|---|---|
| ලබා ගත් විශ්වසනීයතා වාර්තා සංඛ්‍යාව | 11 | - |
| සහාය බලාපොරොත්තුවෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට පැමිණි පුද්ගලයන්ට බස්ගාස්තු ගෙවීම | 90 | 68,500 |
| ආසන්නතම ඥාතීන්ට ආහාර පාන සැපයීම | 824 | 137,110 |
| පැමිණිලි ලැබීම් | 1,320 | |
| අවසන් කළ පැමිණිලි (ස්වයං ලියාපදිංචි සේවකයන්) | 369 | |
| අවසන් කළපැමිණිලි ( නියෝජිතායතන විසින් ලියාපදිංචි සේවකයින්) | 1,264 | |
| සත්කාරක රටවල්වල සිට ආපසු පැමිණි අයට ඇ.ඩො. 1000ක තැන්පතු ආපසු ලබා දීම | 693 | 83,134,000 |

- **පැමිණිලි ලැබීම් සහ විසඳුම් ලබා දීම**

කාර්යාංශයේ සමථ අංශය මගින් පැමිණිලි භාර ගැනීම හා විසඳුම් ලබා දීම සිදු කෙරේ.
අංශයේ කාර්යසාධනය පහත පරිදි වේ.

**පැමිණිලි සමථයට පත් කිරීම**

| | 2014 වර්ෂය | 2013 වර්ෂය |
|---|---|---|
| ලැබුණු පැමිණිලි ගණන | 7,213 | 9,231 |
| කටයුතු අවසන් කළ පැමිණිලි ගණන | 6,577 | 8,447 |
| වන්දි ගෙවූ අවස්ථා ගණන | 434 | 447 |
| වන්දි වශයෙන් ගෙවූ ප්‍රමාණය (රු) | 20,677,805 | 21,608,238 |

- **අනෙකුත් සුභසාධන වැඩසටහන්**

**උනන්දුව දක්වන පාර්ශවයන්/ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරින් සුරක්ෂිත විදේශගතවීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම**

මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම (ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවාවන් සහ සුරක්ෂිත ශ්‍රම විගමනය පිළිබඳව උතුරු හා නැගෙනහිර පළාත් ඇතුළුව)

| | 1කාර්තුව | 2කාර්තුව | 3කාර්තුව | 4කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| වැඩසටහන් ගණන | 01 | 0 | 09 | 02 | 12 |
| වියදම (රු.මි.) | 0.60 | 0 | 0.58 | 0.021 | 1.201 |

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දිස්ත්‍රික් නිලධාරින් ඇතුලු රජයේ නිලධාරින්ගේ සේවාවන් සහ සුරක්ෂිත ශ්‍රම විගමණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ/ හැකියා ප්‍රවර්ධන වැඩසටහන් මෙහෙයවීම.

| | 1කාර්තුව | 2කාර්තුව | 3කාර්තුව | 4කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| වැඩසටහන් ගණන | 03 | 05 | 10 | 07 | 25 |
| වියදම (රු.මි.) | 0.02 | 0.10 | 0.005 | 0.042 | 0.167 |

දිස්ත්‍රික් නිලධාරින්ට පැවරු කාර්යයන් පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම

| | 1කාර්තුව | 2කාර්තුව | 3කාර්තුව | 4කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| වැඩසටහන් ගණන | 03 | 24 | 14 | 20 | 61 |
| වියදම (රු.මි.) | 0.06 | 0.02 | 0.84 | 0.05 | 0.97 |

**සේවක සුභසාධන අරමුදල යටතේ විගමනික ශ්‍රමිකයන්ගේ පවුල්වලට සහාය දීම**

විගමණික ශ්‍රමිකයන්ගේ දරුවන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීමට ශිෂ්‍යත්ව/ මුල්‍ය සහය ලබා දීම

| | 1කාර්තුව | 2කාර්තුව | 3කාර්තුව | 4කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| ප්‍රතිලාභ ගණන | 0 | 0 | 0 | 02 | 02 |
| වියදම (රු.මි.) | 0 | 0 | 0 | 0.015 | 0.015 |

**විගමණික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

රටවිරුවෝ සංවිධාන බලගැන්වීම සහ අවශ්‍ය අවස්ථාවලදී ග්‍රාම නිලධාරි මට්ටමේ හෝ සමෘද්ධි කලාප මට්ටමේ සමාජ පිහිටුවීම (හැකියා වර්ධනය සහ පුහුණුව සඳහා ද්‍රව්‍ය ආධාර/ උපදේශනය සහ උපකරණ සැපයීම)

| | 1කාර්තුව | 2කාර්තුව | 3කාර්තුව | 4කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| වැඩසටහන් සංඛ්‍යාව | 40 | 36 | 226 | 94 | 396 |
| වියදම (රු. මි.) | 0.51 | 0.088 | 3.394 | 0 | 3.992 |

රටවිරු පවුල්වල සංවර්ධනය සඳහා වූ වැඩසටහන පිළිබඳව නීති උපදෙස් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම (ග්‍රාම නිලධාරින් ඇතුලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල නිලධාරින් සඳහා වැඩසටහන්)

| | 1කාර්තුව | 2කාර්තුව | 3කාර්තුව | 4කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| වැඩසටහන් ගණන | 05 | 11 | 41 | 349 | 406 |
| වියදම (රු.මි.) | 0.049 | 0.11 | 0.90 | 10.351 | 11.41 |

රටවිරු පවුල්වල සුභසිද්ධිය සඳහා තොරතුරු, අධ්‍යාපනය සහ සන්නිවේදනය (IEC) ද්‍රව්‍ය සම්බන්ධ සංවර්ධන වැඩසටහන්

| | 1කාර්තුව | 2කාර්තුව | 3කාර්තුව | 4කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| උපකරණ ගණන | 40,000 | 0 | 0 | 0 | 40,000 |
| වියදම (රු.මි.) | 0.158 | 0 | 0 | 0 | 0.158 |

විගමණික ශ්‍රමිකයන්ගේ (පාසල් යන) දරුවන් සඳහා ඔවුන්ගේ අධ්‍යාපනික කාර්ය සාධනයන් වර්ධනය කිරීම පිණිස දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

| | 1කාර්තුව | 2කාර්තුව | 3කාර්තුව | 4කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| වැඩසටහන් ගණන | 04 | 06 | 18 | 14 | 42 |
| වියදම (රු.මි) | 0.08 | 0.048 | 0.102 | 0 | 0.23 |

රටවිරු පියස ව්‍යාපෘතිය හරහා රටවිරුවන් සඳහා නිවාස ඉදිකිරීම (සමෘද්ධි අධිකාරිය සමග ඒකාබද්ධව), රටවිරු පියස ප්‍රතිලාභින්ගේ ණය පියවීමේ වැඩසටහන.

| | 1කාර්තුව | 2කාර්තුව | 3කාර්තුව | 4කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| නිකුත් කළ ණය | 1,161 | 2,542 | 2,624 | 1,929 | 8,256 |
| නිම කළ නිවාස ගණන | | 448 | 914 | 1,921 | 3,283 |
| වියදම (රු. මිලියන)<br>(සමෘද්ධි අධිකාරිය විසින් ණය නිකුත් කරන ලදී) | | | | | |

පවුල් පසුබිම් වාර්තා හා බැඳුණු ගැටලු සම්බන්ධයෙන් නිර්දේශිත පවුල් සඳහා උපදේශනය ලබා දීම

| | 1කාර්තුව | 2කාර්තුව | 3කාර්තුව | 4කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| ප්‍රතිලාභින් සංඛ්‍යාව(ගමන් වියදම්) | | | 32 | 32 | 64 |
| වියදම (රු.මි.) | | | 0.74 | 0.114 | 0854 |

දිස්ත්‍රික් නිලධාරින්ගේ නිල ජංගම දුරකථන බිල්පත් ගෙවීම

| | 1කාර්තුව | 2කාර්තුව | 3කාර්තුව | 4කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| දිස්ත්‍රික් නිලධාරින් ගණන | 837 | 993 | 0 | 993 | 2823 |
| වියදම (රු.මි.) | 1.28 | 1.03 | 0 | 0.65 | 2.96 |

**විගමණික ශ්‍රමිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් අතර ලිංගාශ්‍රිත රෝග, එච්.අයි.වී. සහ ඒඩ්ස් වැලැක්වීම.**

රටවිරුවෝ සංවිධානයේ සාමාජිකයන් සඳහා ගම් මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

| | | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| වැඩසටහන් සංඛ්‍යාව | 0 | 0 | 37 | 10 | 47 |
| වියදම (රු. මිලියන) | 0 | 0 | 0.047 | 0 | 0.047 |

විගමණික ශ්‍රමිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ යහපැවැත්ම සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම.

(මත්ද්‍රව්‍ය / දුම්වැටි නිවාරණ වැඩසටහන් ඇතුළු පවුල් යහ පැවතුම් වැඩසටහන් ක්‍රියාත්මක කරමින් ප්‍රීතිමත් පවුල් සංකල්පය ඔවුන් අතර ප්‍රවර්ධනය කිරීම.)

| | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| වැඩසටහන් සංඛ්‍යාව | 623 | 441 | 3,552 | 0 | 4,606 |
| වියදම (රු.මිලියන) | 0 | 0 | 0 | 0 | 0 |

**සාර්ථක විගමණික ශ්‍රමිකයන් / පවුල් හඳුනාගැනීම ඇගයීම සහ ප්‍රවර්ධනය**

හඳුනාගත් පුද්ගලයන්

| | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| පුද්ගලයන් සංඛ්‍යාව | 23 | 0 | 17 | 330 | 370 |
| වියදම (රු. මිලියන) | 0 | 0 | 0 | 0 | 0 |

ලේඛණ සාර්ථකත්වය

| | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| සාර්ථකත්ව සංඛ්‍යාව | 23 | 0 | 17 | 330 | 370 |
| වියදම (රු.මිලියන) | 0 | 0 | 0 | 0 | 0 |

**විගමණික ශ්‍රමිකයන්ට ප්‍රතිස්ථාපනය සඳහා සහය වීම**

ආපසු පැමිණෙන්නන්ට ස්වයං රැකියා ආරම්භ කිරීමට සහය වීම

| | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| ප්‍රතිලාභී සංඛ්‍යාව | 100 | 334 | 1,405 | 232 | 2,071 |
| වියදම (රු.මිලියන) | 0 | 0 | 0.027 | 0 | 0 |

ආපසු පැමිණි ශ්‍රමිකයන් හට උපදේශක සහය සැපයීම / අපේක්ෂිත අයදුම්කරුවන් පුහුණු කිරීම

| | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| ප්‍රතිලාභී සංඛ්‍යාව | 100 | 334 | 1,405 | 232 | 2,071 |
| වියදම (රු.මිලියන) | 0 | 0 | 0.027 | 0 | 0 |

සපයන ලද ආධාර පිළිබඳ පසුවිපරම

| | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| වැඩසටහන් සංඛ්‍යාව | 0 | 334 | 65 | 39 | 438 |
| වියදම (රු.මිලියන) | 0 | 0 | 0 | 0 | 0 |

සමෘද්ධි අධිකාරිය හරහා ආපසු පැමිණි ශ්‍රමිකයන් හට ස්වයං රැකියා ණය සැපයීම (ක්ෂේත්‍ර පරීක්ෂණ ඇතුළත්ව)

| | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| අයදුම්පත් සංඛ්‍යාව | 43 | 1,213 | 1,322 | 594 | 3,172 |
| ආරම්භ කළ ව්‍යාපෘති | 43 | 132 | 346 | 59 | 580 |
| වියදම (රු.මිලියන) | 0 | 0 | 0 | 0 | 0 |

රැකියා ස්ථානයේදී ගැටළුවලට මුහුණ දී ඇති විගමණිකයන් සඳහා සුබසාධන සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. (දැඩි ගැටළු සහගත තත්ත්වයන්ට ලක්වූවන්ට සඳහා විශේෂ ප්‍රතිස්ථාපන ස්වයං රැකියා සහ නිවාස ලබා දීම.)

| | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| වැඩසටහන් සංඛ්‍යාව | 01 | 01 | 0 | 0 | 02 |
| වියදම (රු.මිලියන) | 0.025 | 0.35 | 0 | 0 | 0.375 |

## ❖ සංක්‍රමණය සහ සංවර්ධනය

- **දකුණු කොරියාවට ශ්‍රී ලාංකිකයින් බඳවාගැනීම**

රැකියා අවසරපත්‍ර ක්‍රමයක් යටතේ ශ්‍රමිකයන් දකුණු කොරියාවට යැවීම සඳහා ශ්‍රී ලංකා රජය දකුණු කොරියා සමූහාණ්ඩුව සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත.

**බඳවාගැනීම් අංශයේ කාර්ය සාධනය**

බඳවාගැනීම් අංශය විසින් පහත ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ.

රැකියා අවසරපත්‍ර ක්‍රමය යටතේ බඳවාගැනීම් අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- ➢ රැකියා අපේක්ෂිතයින් තෝරා ගැනීම
- ➢ කොරියන් භාෂා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ➢ කොරියන් භාෂා විභාග පැවැත්වීම
- ➢ දකුණු කොරියාවට ශ්‍රමිකයන් යැවීම

| | 2014 | 2013 |
|---|---|---|
| දකුණු කොරියාවෙන් ලැබී ඇති ගිවිසුම් සංඛ්‍යාව | 4,416 | 4,891 |
| දකුණු කොරියාවෙන් ලැබී ඇති ගිවිසුම් සංඛ්‍යාව නැවත ඇතුළත් කිරීම | 115 | 524 |
| රැකියා අපේක්ෂිතයින් විසින් අත්සන් කරන ලද ගිවිසුම් සංඛ්‍යාව (සාමාන්‍ය) | 3,625 | 4,002 |
| අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළ ගිවිසුම් සංඛ්‍යාව (සාමාන්‍ය) | 130 | 120 |
| රැකියා අපේක්ෂිතයින් විසින් අත්සන් කරන ලද ගිවිසුම් සංඛ්‍යාව (නැවත ඇතුළත් කළ) | 127 | 507 |
| අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළ ගිවිසුම් සංඛ්‍යාව (නැවත ඇතුළත් කළ) | 09 | 25 |
| රැකියා අපේක්ෂිතයින් විසින් අත්සන් කරන ලද ගිවිසුම් සංඛ්‍යාව (විශේෂ) | 648 | 749 |
| අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළ ගිවිසුම් සංඛ්‍යාව (විශේෂ) | 07 | 15 |
| රැකියා පෙර පුහුණුව ලැබූ රැකියා අපේක්ෂිතයින් සංඛ්‍යාව | 3,505 | 3,903 |
| නිර්දේශිත බැංකු ණය සංඛ්‍යාව | 1,147 | 1,141 |
| දකුණු කොරියාව වෙත පිටත්ව ගිය සංඛ්‍යාව | 4,120 | 4,323 |
| දකුණු කොරියාව වෙත පිටත්ව ගිය සංඛ්‍යාව (නැවත ඇතුළත් කිරීම) | 185 | 522 |

- **විගමන අපේක්ෂිතයින් පුහුණු කිරීම**

| ගෘහස්ථ ගෘහ පාලනය හා රැකබලා ගැනීමේ පුහුණුව | **2014** පුහුණු කළ පුද්ගලයන් සංඛ්‍යාව | **2013** පුහුණු කළ පුද්ගලයන් සංඛ්‍යාව |
|---|---|---|
| මැද පෙරදිග (සිංහල) ගෘහ සේවය | 11,225 | 18,054 |
| සාක්ෂරතා | 712 | 1,993 |
| ඊශ්‍රායලය | 1,186 | 1,597 |
| සිංගප්පූරුව | 359 | 563 |
| සයිප්‍රස් | 538 | 593 |
| පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් | 06 | 06 |
| ජාතික වෘත්තීය සුදුසුකම සම්පූර්ණ කළ | 7,985 | 4,101 |
| දින පහේ පුහුණු වැඩසටහන් | | |
| • පංති සංඛ්‍යාව | 1,430 | 1,400 |
| • සහභාගී වූ සංඛ්‍යාව | 42,810 | 45,565 |

- **සැලසුම් අංශය**

අංශයේ විෂය පථය

- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ ඒකබද්ධ සැලැස්ම සකස් කිරීම, කාර්තු වශයෙන් හා වාර්ෂිකව සැලසුම් කළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රගතිය අධීක්ෂණය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය තුළ තත්ත්ව සහතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.

පැවරී ඇති ක්‍රියාකාරකම් සහ ඒවායේ කාර්යය

| | ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|---|
| (a) | **ISO 9001 : 2008 තත්ත්ව කළමනාකරණ ක්‍රමවේදය අධීක්ෂණය** | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ සේවා ලාභීන්ට විශිෂ්ට ගුණාත්මක සේවාවක් ලබාදීමේ අරමුණ පෙරදැරිව විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ප්‍රධාන කාර්යාලය හා එහි සියළු ශාඛා 2012.11.06 සිට 2015.11.05 දක්වා බලපැවැත්වෙන පරිදි වාර්ෂික විගණන පරීක්ෂණවලින් අනතුරුව මෙම 2014 වසරේ නැවත අලුත් කිරීමට යටත්ව ISO 9001 : 2008 සහතිකය දිනාගනු ලැබිය. |
| | • අඛණ්ඩ වැඩිදියුණුව පිළිබඳ වි.සේ.නි.කා. කාර්යමණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | දැනුවත් කිරීමේ වැඩසටහන්- 33 |
| | | තෝරාගත් ප්‍රධාන කාර්යාල සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව - 01 |
| | | කළමනාකරණ සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව - 02 |
| | • කාර්යමණ්ඩල අභිප්‍රේරණ වැඩසටහන් | වැඩසටහන් සංඛ්‍යාව - 03 |
| | • වාර්ෂික තත්ත්ව විගණන පැවැත්වීම ISO 9001 : 2008 ප්‍රධාන කාර්යාල හා උප කාර්යාල | අභ්‍යන්තර විගණන - 26 (ප්‍රධාන කාර්යාල 2 උප කාර්යාල 24) |
| | | තුන්වන පාර්ශව විගණන - 01 |
| (b) | **වාර්ෂික ඵලදායිතා වර්ධන වැඩසටහන් (5S සංකල්පය මෙහෙයවීම)** | 5S සංකල්පය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ බත්තරමුල්ල කාර්යාලය, ගුවන් තොටුපල ඒකකය, සහන පියස හා ප්‍රාදේශීය කාර්යාල 07 දිස්ත්‍රික් කාර්යාල 12 හා පුහුණු මධ්‍යස්ථානවල ක්‍රියාත්මක කරනු ලබයි. |
| | • ඵලදායිතා වර්ධනය පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීම | වැඩසටහන් සංඛ්‍යාව - 04 |

| | | |
|---|---|---|
| | 5S වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, මෙහෙය වීම හා ඇගයීම | සියළු කොට්ඨාශවල ඵලදායිතා තත්ත්ව වර්ධන කව පිහිටුවීම<br>ක්ෂේත්‍ර පරීක්ෂණ - 30<br>රත්නපුර පළාත් කාර්යාලය 2012/2013 ජාතික ඵලදායිතා සම්මානය කුඩා පරිමාණ සේවා අංශය වෙනුවන් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් 2014 සැප්තැම්බර් 4 වන දින දිනාගනු ලැබීය. |
| (c) | **සංවිධාන සැලසුම් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම** | |
| | • වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට රැස්වීම් පැවැත්වීම | 2015 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සලැස්ම සකස් කරන ලදී. |
| | • ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරිත්වය සමාලෝචනය සඳහා රැස්වීම් පැවැත්වීම | ක්‍රියාකාරිත්වය ඇගයීම සඳහා අංශ ප්‍රධානීන් සහ ඉහළ කළමනාකාරිත්වයේ සහභාගිත්වයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනු ලැබීය - 03 |
| (d) | **මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමට පහසුකම් සැපයීම** | |
| | • ප්‍රගති සමාලෝචනය සඳහා රැස්වීම් පැවැත්වීම | වාර්තාවේ දක්වා ඇති ක්‍රියාකාරකම්හි ප්‍රගතිය සමාලෝචනය සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා අමාත්‍යාංශයේ ඉහළ කළමනාකාරිත්වයේ සහභාගිත්වයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනු ලැබීය.<br>රැස්වීම් - 07 |

## ❖ ව්‍යාපාර උපාය මාර්ග ධෛර්යමත් කිරීම සඳහා ඒකාබද්ධ සම්පත් උපයෝජනය

2014 වර්ෂයේ සංවිධාන ඉලක්ක ළගා කර ගැනීම සඳහා පරිපාලන හා මානව සම්පත්, මූල්‍ය, මිලදී ගැනීම්, නඩත්තු, ප්‍රවාහන, තොරතුරු තාක්ෂණ, අභ්‍යන්තර විගණන හා පර්යේෂණ යන අංශ සහය ලබා දෙන ලදී. උක්ත අංශයන්හි කාර්ය සාධනය පහත දැක්වේ.

**පරිපාලන හා මානව සම්පත් සංවර්ධන කාර්යමණ්ඩල තොරතුරු**

| | කාර්යමණ්ඩල තොරතුරු | ස්ථිර | කොන්ත්‍රාත් | අනියම් | තාවකාලික |
|---|---|---|---|---|---|
| 2013 වර්ෂය | සංඛ්‍යාව | 821 | 248 | 16 | 03 |
| 2014 වර්ෂය | සංඛ්‍යාව | 1,026 | 70 | 16 | 05 |

**බඳවාගැනීම්**

2014 වර්ෂයේ සිදු කරන ලද බඳවාගැනීම්

| ශ්‍රේණිය | තනතුර | බඳවාගැනීමේ පදනම | බඳවාගැනීමේ සංඛ්‍යාව |
|---|---|---|---|
| | මූල්‍ය කළමනාකරණ උපදේශක | කොන්ත්‍රාත් | 01 |
| M - VI | මාධ්‍ය නිලධාරී | ස්ථිර | 01 |
| M - VI | සම්බන්ධීකරණ නිලධාරි | ස්ථිර | 01 |
| - | අරාබි භාෂා පරිවර්තක | කොන්ත්‍රාත් | 01 |
| S - IV | පොදු සහකාර | කොන්ත්‍රාත් | 17 |
| | ගෘහ පාලන පුහුණුකරු | කොන්ත්‍රාත් | 03 |
| | උපදේශක | පැවරුම් | 03 |
| S - IV | රියදුරු | කොන්ත්‍රාත් | 04 |
| S - VI | රියදුරු සහයක | කොන්ත්‍රාත් | 01 |
| S - VI | කාර්යාල සහයක | කොන්ත්‍රාත් | 21 |

**2014 වර්ෂයේ ස්ථිර කාර්යමණ්ඩලයට බඳවාගත් කොන්ත්‍රාත් පදනම මත සේවය කළ සේවකයින්**

- පොදු සහකාර - 135
- ක්ෂේත්‍ර සහකාර - 22
- රියදුරු - 38
- රියදුරු සහයක - 01
- කාර්යාල සහයක - 16
- විදුලි කාර්මික - 02
- වායුසමීකරණ ශිල්පී - 02

**කාර්යමණ්ඩල ඉවත් වීම් - ඉල්ලා අස්වීම් පිළිබඳ තොරතුරු - 2014**

| ශ්‍රේණිය | තනතුර | බඳවාගත් සංඛ්‍යාව |
|---|---|---|
| M - VI | සම්බන්ධීකරණ නිළධාරී | 01 |
| M - VI | අරාබි භාෂා පරිවර්තක | 02 |
| S - IV | පොදු සහකාර | 06 |
| S - IV | සුභසාධන සහකාර | 01 |
| S - IV (A) 1 | ක්ෂේත්‍ර සහකාර | 01 |

**අනෙකුත් නිලධාරීන් ඉවත් වීම් - 2014**

| ශ්‍රේණිය | තනතුර | හේතුව |
|---|---|---|
| M - II | අතිරේක සාමාන්‍යාධිකාරී | විශ්‍රාමයාම |
| M - VI | කළමනාකරු | විශ්‍රාමයාම |
| M - VI | පරිපාලන නිලධාරී | විශ්‍රාමයාම |
| M - VI | පද්ධති විශ්ලේශක | නිවාඩු |
| | අරාබි භාෂා පරිවර්තක | කොන්ත්‍රාත් කාලය අවසන් වීම |
| S - II | පොදු සහකාර | වැඩ තහනම් කිරීම |
| S - IV | පොදු සහකාර | කොන්ත්‍රාත් කාලය අවසන් වීම |
| S - IV | සුබසාධන සහකාර | මිය යාම |
| S - IV (A) 1 | ක්ෂේත්‍ර සහකාර | වැඩ තහනනමට ලක්වීම |
| S - VI | කාර්යාල සහයක | කොන්ත්‍රාත් කාලය අවසන් වීම |

අභ්‍යන්තර උසස් කිරීම් - 2014

| තනතුර | ශ්‍රේණිය | උසස් කළ නිළධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| කළමනාකරණ පුහුණු | S-I | 14 |
| කාර්යාල කාර්ය සහයක | S-I | 29 |
| පරිගණක දත්ත ක්‍රියාකරු | S-II | 08 |
| සුභසාධන සහකාර | S-II | 25 |
| පොදු සහකාර | S-II | 26 |

**කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම - 2014**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| උපදේශක | 02 |
| සම්බන්ධීකාරක | 01 |
| භාෂා පරිවර්තක | 09 |
| ගුවන් ගමන් විධායක | 02 |
| පොදු සහකාර | 137 |
| ක්ෂේත්‍ර සහකාර | 20 |
| ගුවන් ප්‍රවේශපත්‍ර සහකාර | 01 |

| | |
|---|---|
| ගෘහ පාලන පුහුණුකරු | 01 |
| රියදුරු | 14 |
| කාර්යාල සහයක | 09 |
| විදුලි කාර්මික / වැද්දුම්කරු | 02 |
| වායුසමීකරණ ශිල්පී | 02 |

පුහුණු වැඩසටහන් / වැඩමුළු සඳහා සහභාගී වූ නිළධාරීන් පිළිබඳ තොරතුරු

| | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|
| පුහුණු වැඩසටහන් | 1,513 |
| වැඩමුළු | 28 |

සේවා නියුක්තිකයන් සඳහා 2014 වසරේ ලබා දුන් පුහුණු පහසුකම් සඳහා වැය වූ මුදල රු. 5,052,030/= .

* දර්ශනපති මට්ටම දක්වා අධ්‍යාපනය සඳහා සේවකයින් සඳහා මූල්‍ය සහය ලබා දීමට ප්‍රතිපාදන ලබා දීම
* වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කිරීම
* කම්කරුවන් සපයන රටවල් සමග සුහදතාවය ගොඩනගා ගැනීමේ චාරිකා

### ❖ සෞඛ්‍ය වියදම් ප්‍රතිපූර්ණය

සෞඛ්‍ය වියදම් ප්‍රතිපූර්ණය සඳහා සේවකයින්ට 2014 වසරේ සපයන ලද මුදල රු. 27,460,862.51 කි.

### ❖ කාර්යමණ්ඩල ණය යෝජනා ක්‍රමය

2014 වර්ෂය තුළ දී පහත සඳහන් සේවාවන් මෙම අංශය විසින් සපයනු ලැබීය.

| | ලබා දුන් ණය සංඛ්‍යාව | ප්‍රමාණය (රු.) |
|---|---|---|
| ආපදා ණය | 393 | 69,814,229.00 |
| වාහන ණය | 63 | 30,804,000.00 |
| නිවාස ණය පොලිය ප්‍රතිපූර්ණය (ඉල්ලීම් සංඛ්‍යාව) | 704 | 7,113,141.87 |
| ක්ෂණික ණය | 94 | 2,995,383.00 |
| උත්සව අත්තිකාරම් | 758 | 3,790,000.00 |

❖ **කාර්යමණ්ඩලය සඳහා ප්‍රවාහන පහසුකම්**

ප්‍රදේශ පහක් වෙත ප්‍රවාහන පහසුකම් සපයනු ලැබේ. (මතුගම,රත්නපුර,නිට්ටඹුව,කොටුව සහ හොරණ) 2014 වර්ෂය තුළ ප්‍රවාහන වියදම රු.11,664,288/-

❖ **දිවා සුරැකුම් මධ්‍යස්ථාන ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම**

2014 වර්ෂය තුළ කාර්ය මණ්ඩල සේවකයින්ගේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ගාස්තු ප්‍රතිපූර්ණය සඳහා රු. 202,050/- ක මුදලක් කාර්යමණ්ඩල සුභසාධනය යෝජනා ක්‍රමය යටතේ වැය කර ඇත.

**ප්‍රසම්පාදන අංශය**

- භාණ්ඩ හා සේවා නිසි කලට ප්‍රසම්පාදනය
- සැපයුම්කරුවන් වාර්ෂිකව ලියාපදිංචි කිරීම
- ගුවන්තොටුපල කවුළු සම්බන්ධ කටයුතු
- උපයෝජිත වත්කම් බැහැර කිරීම
- සුදුසු රක්ෂණාවරණ ක්‍රමයක් යටතේ විදේශ සේවා නියුක්ති කාර්යංශයේ වත්කම් ආරක්ෂා කිරීම
- සැපයුම්කරුවන් සඳහා ගෙවීම් කිරීම
- කාර්යමණ්ඩල නිල ඇඳුම් සහ අනෙකුත් කාර්යමණ්ඩල උපකරණ සඳහා ප්‍රතිපාදන ලබා දීම
- පුහුණු මධ්‍යස්ථාන සහ කලාප ප්‍රාදේශීය කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයට අවශ්‍ය දේපල අත්පත් කර ගැනීම

## නඩත්තු අංශය

2014 වසර තුල ගොඩනැගිලි කාර්යාල උපකරණ, උපයෝගීතා සේවා හා උපයෝගිතා බිල්පත් පියවීමට අදාළ සියළු කටයුතු සිදු කිරීම හා අධීක්ෂණය කිරීම නඩත්තු අංශය විසින් සිදු කරයි.

## මුදල් අංශය

ආදායම් රැස්කිරීම, බිල්පත් ගෙවීම, අරමුදල් ආයෝජනය කිරීම, ගල්ෆ් යුද වින්දිතයන්ට වන්දි ගෙවීම වැනි කටයුතු කාර්යාංශයේ මුදල් අංශය සතු වගකීම් අතර වේ.

## තොරතුරු තාක්ෂණ අංශය

### වැඩසටහන් සංවර්ධන අංශය

මෙම ඒකකය පද්ධති විශ්ලේෂක වරයෙකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර පරිගණක වැඩසටහන් කරුවන් හත් දෙනෙකුගෙන් සමන්විත වේ. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අනෙකුත් අංශයන්හි විවිධ වූ අවශ්‍යතා අනුව පරිගණක වැඩසටහන් නිර්මාණය කිරීම හා පවත්වාගෙන යාමේ වගකීම මෙම ඒකකය වෙත පැවරී ඇත. අන්තර්ජාලය, ජාල පාදක පද්ධති සහ කුඩා වපසරි ජාලකරණ කටයුතු හා ඒ සම්බන්ධ වැඩිදියුණු කිරීම් වැඩසටහන් සංවර්ධන අංශය මගින් සිදු කරනු ලබයි. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිල වෙබ් අඩවිය (www.slbfe.lk) පවත්වාගෙන යනු ලබන්නේ මෙම ඒකකය මගිනි.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කර ඇති තොරතුරු තාක්ෂණ පද්ධතිය එහි දීප ව්‍යාප්ත පුහුණු මධ්‍යස්ථාන සහ ප්‍රාදේශීය කාර්යාල සමග පමණක් නොව ශ්‍රී ලංකා තානාපති කාර්යාල 16 ක කම්කරු අංශය සමග ද සම්බන්ධ කර ඇත. මෙම කාර්යාංශයේ නියමිත කටයුතු මේ වන විට තොරතුරු තාක්ෂණ පද්ධති සමග සම්බන්ධ කර ඇත.

### දෘඩාංග ඒකකය

ශ්‍රී ලංකා විදේශ නියුක්ති කාර්යාංශයේ දෘඩාංග ඒකකය කාර්මික නිලධාරින් 5 දෙනෙකුගෙන් සමන්විත වන අතර කාර්යාංශයේ ජාල කටයුතු හා පරිඝණක නඩත්තු කිරීම් සියල්ල සිදු කරනු ලබයි. කාර්යාංශයේ ජාල පද්ධතිය හා ඊට අදාළ ගැටලු මතු වන අවශ්‍ය විටෙක ඒවා නිසි පරිදි ක්‍රියාත්මක කරවීමේ වගකීම මීට පැවරේ. මෙම අංශයේ නිසි කටයුතු සිදු කිරීම නිසා, බාහිර සේවා සපයන්නන් සඳහා වියදම් කිරීමට වන විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි කර ගැනිමටත් සේවා කිසිදු බාධාවකින් තොරව කර ගෙන යාමට හැකි වි ඇත.

### තොරතුරු තාක්ෂණ අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය

යටිතල පහසුකම් සංවර්ධනය සියළුම පුහුණු මධ්‍යස්ථාන සහ ප්‍රාදේශීය කාර්යාල ප්‍රධාන කාර්යාලයේ ස්ථාපනය කර ඇති ප්‍රධාන පාලකයට සම්බන්ධ කර ඇත. මෙම ජාල පහසුකම් මගින් පුහුණු මධ්‍යස්ථන සහ ප්‍රාදේශීය කාර්යාල එකිනෙකට සම්බන්ධව ක්‍රියාත්මක වන සෘජු සම්බන්ධතා පද්ධතියක් ක්‍රියාත්මක කර ඇත. තානාපති කාර්යාලවල කම්කරු අංශයන් ප්‍රධාන කාර්යාලයේ පිහිටා ඇති පාලකය සමග අන්තර්ජාලය හරහා සම්බන්ධ කර ඇති අතර ජාල පාදක සෘජු සම්බන්ධතා ක්‍රමයක් ක්‍රියාත්මක කර ඇත.

මෙම වැඩිදියුණු කිරීම තුළින් අප දේශීය නියෝජිත ආයතන සහ විදේශීය නියෝජිත ආයතන සඳහා අන්තර් ජාලය මගින් බඳවා ගැනීම් සඳහා පහසුකම් සලසා දී ඇත.

ශ්‍රී ලංකාවෙන් පිටත දී බඳවාගන්නා ශ්‍රී ලාංකික කම්කරුවන් හඳුනාගැනීම සඳහා ජෛවමිතික අයදුම්පත් ක්‍රියාත්මක කරනු ලැබීය.

ලියාපදිංචි විගමණික ශ්‍රමිකයන්ගේ සංචාරක චර්යා අධ්‍යයනය සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුව සමග එක්ව දත්ත හුවමාරු කර ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන ලදී.

## අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර කළමනාකරණ පාලනය සහ ක්‍රියාකාරිත්වයන් ඇගයීම, නීති රෙගුලාසි, කළමනාකරණ ප්‍රතිපත්ති, වගවීම් පිළිබඳ දර්ශන, සදාචාරමය තත්ත්වයන් සහ යුතුකම් සම්බන්ධ අදාලත්වයන් ප්‍රචාරණය තීරණය කරනු ලබන්නේ අභ්‍යන්තර විගණන අංශය මගිනි.
අභ්‍යන්තර පාලනයේ වෙන්ව පවතින අංශයක් වන මෙම අංශය පිහිටුවා ඇත්තේ අභ්‍යන්තර පාලනය හොඳින් සකස්වී ඇත්ද යන්න සහ විධිමත්ව ක්‍රියාත්මකවේද යන්න පිරික්සුම සඳහාය.

අභ්‍යන්තර විගණන අංශය මගින් මෙහෙයවනු ලබන විගණන වර්ග:

අනුකූලතා විගණන, කළමනාකරණ විගණන සහ ක්‍රියාරිත්වය සම්බන්ධ විගණන වේ.

අනුකූලතා විගණන මගින් ආයතනයේ නීති, රෙගුලාසි, කළමනාකරණ ප්‍රතිපත්ති සහ විධිවිධානවලට අනුකූලව කටයුතු කර ඇති ප්‍රමාණය මෙන්ම යුතුකම් වගකීම් සහ වගවීම්වලට අනුකූලව ඇත්ද යන්න පරීක්ෂා කරයි.

මෙහෙයුම් විගණනය යනු ප්‍රතිඵල, ක්‍රියාවලි නිමවුම් සහ යෙදවුම් වෙන් වෙන්ව ඇගයීම තුළින් රජයේ මෙහෙයුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති ඵලදායීව, කාර්යක්ෂමව, සදාචාරාත්මකව, ලාභදායීව නීති, රෙගුලාසි, කළමනාකරණ ප්‍රතිපත්ති, වගකීම් යුතුකම් රාමුව තුළ ක්‍රියාත්මකව ඇත් ද යන්න පිළිබඳව ඇගයීමයි.කාර්යාංශයේ ඵලදායීත්වය, කාර්යක්ෂමතාවය, ආචාරධාර්මිකත්වය සහ ලාභදායිත්වය ඇගයීම තුළින් වඩා යහපත් රාජ්‍ය සේවයක් සහ වගවීම සහ පාලනය සඳහා දායක වීමට කාර්යංශයට අවස්ථාව උදාවේ.

ඇගයීමට ලක්කිරීමේ අරමුණ වන්නේ ප්‍රතිඵල, නිමැවුම්, ක්‍රියාවලි සහ යෙදවුම් සම්බන්ධ කරුණු මෙන්ම ඒවා නිවැරදි කිරීම මගින් කාර්යක්ෂමතාවය, ඵලදායිතාවය, ආචාරධර්මිකත්වය සහ ලාභදායිත්වය ළඟා කර ගැනීමයි.

අභ්‍යන්තර විගණන අංශයේ සියලුම සාමාජිකයින් අභ්‍යන්තර පාලකයින් වශයෙන් ඔවුන්ගේ වගකීම ඉටුකරන අතරම ගුණාත්මක විගණන සේවාවක් සහතික කිරීම උදෙසා පහත ප්‍රධාන මූලධර්ම හයක් අනුව ඔවුන්ගේ පරීක්ෂණ පවත්වා ඇත.

1. රුචිකත්ව පාලනය
2. අපක්ෂපාතීත්වය හා ඉලක්කගත බව
3. වෘත්තීය කුසලතා
4. රහස්‍යභාවය හා අධිකාරිත්වය
5. ආචාරධර්මවලට අනුකූලබව
6. අදාල අභ්‍යන්තර විගණන මූලධර්ම සහ භාවිතයන්ගේ දූරාවලිය

අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථය පහත පරිදි වේ.

(අ) ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මෙහෙයවීම
(ආ) සම්පත් ඵලදායී, කාර්යක්ෂම හා විධිමත් භාවිතය පිළිබඳ සහතික වීම
(ඇ) ස්ථාපිත ප්‍රතිපත්ති, විධිවිධාන සහ නීතිරීති වලට අනුකූල බව සහතික වීම
(ඈ) ආයතනයේ වත්කම් සහ දේපල සියළුම ආකාරයේ වංචා දූෂණ සහ අක්‍රමිකතාවන්ගෙන් ආරක්ෂා කිරීම
(ඉ) වගවීම් ක්‍රියාවලිය සහ ගිණුම් දත්ත සහ තොරතුරුවල විශ්වාසනීයත්වය සහ ඒකාග්‍රතාවය සහතික කිරීම



අභ්‍යන්තර විගණන ඒකකය අභ්‍යන්තර විගණක වරයකු යටතේ පාලනය වන අතර කණිෂ්ඨ විධායක නිළධාරීන් තිදෙනෙකු සහ ලිපිකරු සේවයේ නිළධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

සමාලෝචිත වර්ෂයේදී මෙම නිළධාරීන් හඳුනාගත් විවිධ ප්‍රදේශයන්හි පරීක්ෂණ 75 ක් පවත්වා ඇත. 2014 වසරේ පවත්වන ලද විගණන රැස්වීම් හතරක් සඳහා අභ්‍යන්තර විගණන ඒකකය කැඳවුම්කරු ලෙස කටයුතු කර ඇත.

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ එහි පරිපාලිත සමාගම
## 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

| | | 2014 දෙසැම්බර් 31 දිනට | | 2013 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|
| | | භාණ්ඩය | කාර්යාංශය | භාණ්ඩය | කාර්යාංශය |
| වත්කම | සටහන් | රු. | රු. | රු. | රු. |
| **ජංගම නොවන වත්කම්:** | | | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 1 | 1,153,608,709 | 1,063,946,997 | 1,184,612,033 | 1,101,854,036 |
| විලම්බිත බදු වත්කම් | | 229,695 | | 52,143 | - |
| සේවක ණය | | 259,807,901 | 259,807,901 | 223,072,116 | 223,072,116 |
| නියෝජිත සමාගමේ ආයෝජන | | 0 | 5,000,000 | - | 5,000,000 |
| මූල්‍ය වත්කම්/ භාණ්ඩාගාර බැඳුම්කර & ස්ථාවර තැන්පත් | 3 | 4,070,789,903 | 3,951,514,903 | 1,010,679,247 | 891,404,247 |
| ඉතා සියුම් මෘදුකාංග බලපත්‍රය | | 10,544,625 | 10,544,625 | | |
| නොනිමි වැඩ - ගොඩනැගිලි (හෝමාගම, රත්නපුර) | 2 | 65,698,831 | 65,698,831 | 17,504,284 | 17,504,285 |
| ජංගම නොවන වත්කම් මුළු ප්‍රමාණය | | **5,560,679,664** | **5,356,513,257** | **2,435,919,823** | **2,238,834,683** |
| **ජංගම වත්කම් :** | | | | | |
| අතැති තොග | 4 | 14,346,167 | 13,972,607 | 9,959,628 | 9,889,278 |
| විවිධ ණයගැතියෝ | 5 | 1,593,261,121 | 1,582,946,875 | 1,628,108,549 | 1,627,066,790 |
| විවිධ තැන්පත් | | 7,720,204 | 6,204,755 | 6,197,663 | 6,082,263 |
| භාණ්ඩාගාර බැඳුම්කර & ස්ථාවර තැන්පත් කෙටිකාලීන ආයෝජන | 3 | 2,966,966,381 | 2,966,966,381 | 3,482,444,094 | 3,482,444,094 |
| සේවක ණය | 6 | 55,008,735 | 53,174,094 | 54,640,788 | 53,012,511 |
| විවිධ වූ අත්තිකාරම් | | 130,011,868 | 129,158,794 | 13,868,187 | 13,868,187 |
| මුදල් සහ මුදල් වලට සමාන දෑ | 7 | 1,914,824,883 | 1,893,024,624 | 3,566,639,527 | 3,544,159,292 |
| මුළු ජංගම වත්කම | | **6,682,139,359** | **6,645,448,130** | **8,761,858,437** | **8,736,522,415** |
| මුළු වත්කම | | **12,242,819,023** | **12,001,961,387** | **11,197,778,260** | **10,975,357,097** |
| **සමකොටස් හා බැරකම්:** | | | | | |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | | | |
| උපචිත අරමුදල | 10 | 4,058,803,699 | 3,935,321,308 | 3,605,562,888 | 3,518,644,853 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 49,522,346 | 41,713,346 | 49,522,346 | 41,713,346 |
| මුළු සමකොටස් ප්‍රමාණය | | **4,108,326,045** | **3,977,034,654** | **3,655,085,234** | **3,560,358,199** |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| විදේශගත සේවක සුබසාධන අරමුදල | | 3,238,273,605 | 3,238,273,605 | 3,085,022,159 | 3,085,022,159 |
| පාරිතෝෂිත ප්‍රතිපාදන (දිගුකාලීන) | | 175,072,840 | 172,384,934 | 134,851,459 | 133,020,147 |
| විලම්බිත විදේශාධාර හා ප්‍රදාන | | 777,591 | 777,591 | 777,591 | 777,591 |
| පොලී ගෙවිය යුතු ණයගැනීම් | | 5,822,029 | - | 2,297,263 | - |
| රක්ෂණ අරමුදල | | 0 | - | 9,458,929 | - |
| විශේෂ ආපදා අරමුදල | | 500,000 | - | 500,000 | - |
| | | **3,420,446,065** | **3,411,436,130** | **3,232,907,401** | **3,218,819,897** |
| **ජංගම බැරකම්** | | | | | |
| බදු ගෙවීම් | | 264,654,263 | 261,891,507 | 153,507,884 | 147,888,745 |
| ඒජන්සි ණයගැතියෝ | | 296,835,013 | 297,778,313 | 237,475,697 | 238,740,947 |
| සමුච්චිත වියදම් | | 123,463,949 | 162,290,403 | 105,921,930 | 121,488,279 |
| සුළු ණයගැතියෝ & ණයගැනීම් | 8 | 1,010,078,183 | 898,751,329 | 943,519,721 | 837,740,383 |
| විදේශ ශ්‍රමික දායකත්ව | | 6,572,054 | 6,572,054 | 6,110,128 | 6,110,128 |
| කුවේට් වන්දි - ගෙවිය හැකි | | 2,975,504,815 | 2,975,504,815 | 2,822,217,375 | 2,822,217,375 |
| බලපත්‍ර ගාස්තු - කලින් ගෙවූ | | 7,731,000 | 7,731,000 | 13,551,066 | 13,551,066 |
| පාරිතෝෂිත ප්‍රතිපාදන | | 2,971,182 | 2,971,182 | 4,865,090 | 4,865,090 |
| බැංකු අයිරා | 9 | 26,236,454 | - | 22,616,733 | 3,576,988 |
| | | **4,714,046,913** | **4,613,490,603** | **4,309,785,624** | **4,196,179,001** |
| මුළු බැරකම් ප්‍රමාණය | | **8,134,492,978** | **8,024,926,733** | **7,542,693,025** | **7,414,998,898** |
| මුළු සමකොටස් හා බැරකම් | | **12,242,819,023** | **12,001,961,387** | **11,197,778,260** | **10,975,357,097** |

පිටු අංක 36 සිට 62 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල වැදගත්ම කොටසකි.

මෙම ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය වගකීම් දරයි.

අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2015.07.24 වන දින අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබන ලදී.

එම්.ඒ.ඩී.චන්ද්‍රවංශ
නි. සාමාන්‍යාධිකාරි (මුදල්)

නන්දපාල වික්‍රමසූරිය
සභාපති

ජී.එන්.ජයසූරිය
අධ්‍යක්ෂක

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ එහි පරිපාලිත සමාගම
## 2014.12.31 න් අවසන් වසර සදහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| | සටහන් | 2014.12.31 දිනෙන් අවසන් වූ වසර | | 2013.12.31 දිනෙන් අවසන් වූ වසර | |
|---|---|---|---|---|---|
| | | ඛාණ්ඩය | කාර්යාංශය | ඛාණ්ඩය | කාර්යාංශය |
| | | රු. | රු. | රු. | රු. |
| ආදායම | | | | | |
| මෙහෙයුම් ආදායම | 20 | 1,907,256,776 | 1,849,093,352 | 1,588,465,523 | 1,541,310,327 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 21 | 1,630,245,094 | 1,612,244,631 | 1,351,184,832 | 1,329,876,868 |
| | | 3,537,501,870 | 3,461,337,983 | 2,939,650,355 | 2,871,187,195 |
| සේවක පිරිවැය | 22 | (837,924,560) | (819,464,418) | (687,473,024) | (670,992,410) |
| ආයතනික වියදම් | 22 | (301,765,670) | (293,547,351) | (251,114,457) | (244,483,733) |
| මෙයෙහුම් පිරිවැය | 22 | (274,351,406) | (259,826,613) | (255,686,419) | (245,020,772) |
| දැන්වීම් හා ප්‍රචාරක කටයුතු | 22 | (201,447,662) | (201,133,337) | (84,302,488) | (82,030,721) |
| ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් | 22 | (105,742,296) | (98,677,993) | (52,148,591) | (45,648,305) |
| සේවක සුභසාධන අරමුදල් වියදම් | 22 | (1,356,295,660) | (1,372,116,594) | (1,282,727,235) | (1,273,294,305) |
| වියදමට වැඩි ආදායම් අතිරික්තිය -බදු පෙර | | 459,974,615 | 416,571,678 | 326,198,141 | 309,716,949 |
| බදු | | (123,333,676) | (116,640,070) | (91,571,807) | (86,720,746) |
| විලම්බිත බදු වෙනස් කිරීම | | 177,552 | | | |
| වියදම පරයන ආදායම් අතිරික්තය - කාල සීමාව තුල | | 336,818,492 | 299,931,608 | 234,626,334 | 222,996,203 |
| වෙනත් විස්තීරණ ආදායම් | | | | | |
| විනිමය වාසිය/ පාඩුව - විදේශ මෙහෙයුම් යොදාගැනීම | | 35,197,591 | 35,520,118 | 11,601,352 | 11,649,013 |
| ආයුසණකමය වාසිය / පාඩුව - විශ්‍රාමික සැලසුම් | | 9,638,178 | 9,638,178 | 8,503,555 | 8,503,555 |
| වෙනත් විස්තීරණ ආදායම් | | 44,835,769 | 45,158,296 | 20,104,907 | 20,152,568 |
| මුළු විස්තීරණ (වියදම්)/ආදායම - කාලසීමාව සඳහා | | 381,654,260 | 345,089,904 | 254,731,241 | 243,148,771 |

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා එහි නියෝජිත සමාගම
## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2014.12.31 දිනෙන් අවසන් වූ වසර | | 2013.12.31 දිනෙන් අවසන් වූ වසර | |
|---|---|---|---|---|
| | බාණ්ඩය | කාර්යාංශය | කාණ්ඩය | කාර්යාංශය |
| | රු. | රු. | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහ** | | | | |
| මෙහෙයුම් වලින් උපයාගත් මුදල් | 1,136,598,197 | 1,128,555,245 | (1,269,769,301) | (1,280,763,674) |
| ක්ෂයවීම් | 158,212,816 | 151,311,039 | 162,510,196 | 158,364,034 |
| පොලී ආදායම | (479,323,131) | (465,823,481) | (388,505,200) | (372,287,978) |
| පාරිතෝෂිත ප්‍රතිපාදන | 57,381,846 | 56,525,254 | 25,488,012 | 25,097,342 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලත් මුදල | (3,853,869) | - | (2,138,393) | - |
| ප්‍රත්‍යාගණන සංචිතය | (7,809,000) | - | - | - |
| විනියම ලාභ පාඩු | 35,197,591 | 35,520,118 | 11,601,352 | 11,649,013 |
| ගෙවූ බදු | (5,002,237) | (2,637,308) | (49,310,896) | (46,571,811) |
| විලම්බිත බදු වැඩිවීම | - | | (120,145) | |
| විලම්බිත බදු වත්කම් | (177,552)<br>- | | (52,143) | |
| 2014 වසර සඳහා ගැලපුම | 71,623,219 | 71,623,217 | 2,150,402 | 2,502,940 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලත් ශුද්ධ මුදල** | **962,847,880** | **975,074,084** | **(1,508,146,116)** | **(1,502,010,135)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහ** | | | | |
| ආයෝජන ආදායම | 465,978,238 | 452,523,316 | 377,322,921 | 361,105,699 |
| සේවක ණය සඳහා පොලිය | 13,344,892 | 13,300,164 | 11,182,279 | 11,182,279 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලත් මුදල | (10,544,625) | (10,544,625) | 2,138,393 | - |
| ස්ථාවර වත්කම් වල ආයෝජන | (128,617,228) | (113,145,071) | (486,066,826) | (480,215,404) |
| ගොඩනැගිලි ඉදිකිරීම | (48,194,547) | (48,194,546) | - | - |
| දිගුකාලීන ආයෝජන | (3,060,110,656) | (3,060,110,656) | 3,298,800,702 | 3,311,800,702 |
| ආයෝජන කටයුතු සඳහා භාවිත ශුද්ධ මුදල | **(2,768,143,925)** | **(2,766,171,417)** | **3,203,377,469** | **3,203,873,276** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ගලන** | | | | |
| ගෙවූ පාරිතෝෂිත මුදල් | (9,711,794) | (9,711,794) | (3,988,401) | (3,988,401) |
| ඒකාබද්ධ අරමුදලට බැරකල අරමුදල් | - | - | - | - |
| විශේෂ ආපදා අරමුදල | 500,000 | | 500,000 | |
| පොලී ගෙවිය යුතු ණය | 5,822,029 | | 2,297,263 | |
| රක්ෂණ අරමුදල | - | | 9,458,929 | |
| කොන්ත්‍රාත් ගිවිසුම් ලියාපදිංචි පද්ධතිය | 153,251,446 | 153,251,446 | | |
| මූල්‍ය කටයුතු සඳහා භාවිතා කළ ශුද්ධ මුදල | **149,861,681** | **143,539,652** | **8,267,791** | **(3,988,401)** |
| ශුද්ධ (අඩුවීම)/ වැඩිවීම - මුදල් හා මුදල් වලට සමාන දෑ | **(1,655,434,364)** | **(1,647,557,681)** | **1,703,499,144** | **1,697,874,740** |
| කාල සීමාව ආරම්භයේ | 3,544,022,793 | 3,540,582,305 | 1,840,523,648 | 1,842,707,566 |
| (අඩුවීම)/ වැඩිවීම | (1,655,434,364) | (1,647,557,681) | 1,703,499,145 | 1,697,874,740 |
| කාල සීමාව අවසානයේ | **1,888,588,429** | **1,893,024,624** | **3,544,022,793** | **3,540,582,305** |

## සටහන: 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
## මෙහෙයුම් වලින් ඉපයූ මුදල්

| | | |
|---|---|---|
| ශුද්ධ ලාභය - බදු පෙර සහ අතිවිශේෂිත අයිතම | **459,974,615** | **416,571,678** |
| කාරක ප්‍රාග්ධන වෙනස්කම් | - | |
| අතැති තොග අඩුවීම | (4,386,539) | (4,083,329) |
| උපචිත වියදම් වැඩිවීම | 17,542,019 | 40,802,124 |
| තැන්පත් වැඩිවීම | (1,522,541) | (122,492) |
| කෙටිකාලීන ආයෝජන අඩුවීම | 515,477,713 | 515,477,713 |
| විවිධ ණයගැතියන් වැඩිවීම | 66,558,462 | 61,010,946 |
| සාමාජිකයන්ගේ දායකත්වය වැඩිවීම | 461,926 | 461,926 |
| ණයගැතියන් අඩුවීම | 34,847,428 | 44,119,915 |
| සේවක ණය අඩුවීම | (367,947) | (161,583) |
| අත්තිකාරම් අඩුවීම | (116,143,681) | (115,290,607) |
| නියෝජිතායතන ණයගැතියන් වැඩිවීම | 59,359,316 | 59,037,366 |
| කුවේට වන්දි වැඩිවීම | 153,287,440 | 153,287,440 |
| සේවා ණය වැඩිවීම | (36,735,785) | (36,735,785) |
| පූර්ව ගෙවූ බලපත්‍ර ගාස්තු වැඩිවීම | (5,820,066) | (5,820,066) |
| | **676,623,582** | **711,983,568** |
| | **1,136,598,197** | **1,128,555,245** |

# ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය සහ එහි පරිපාලිත සමාගම

## 2014.12.31 දිනෙන් අවසන් වූ වසර සඳහා හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

බාණ්ඩය

| | සමුච්චිත අරමුදල | ඒකාබද්ධ අරමුදලට මාරුකළ අරමුදල් | ලැබීමට නියමිත සමකොටස් | රඳවාගත් ඉපයීම් | එකතුව රු. |
|---|---|---|---|---|---|
කාර්යාංශයේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය ට අනුව, රැකියා සඳහා ස්වයංව විදේශගත වී ඇති ශ්‍රී ලාංකික දේශිය අංශය විසින් ගෙවන ලද ලියාපදිංචි ගාස්තු සඳහා ජාතිය ගොඩනැගීමේ බද්ද හා වැට් බදු සහන ප්‍රදානය කිරීමට පියවර ගෙන ඇත. 2014 වසරේ දී ශ්‍රීලංකා විදේශ නියුක්ති කාර්යාංශය එමගින් සපයන ලද සුබසාධන කටයුත්තක් ලෙස රු. 16,867,594 වියදම් කර ඇත.

## 25. වෙනත් ගණුදෙනු

විදේශ රැකියා ලොතරැයි ජයග්‍රාහකයන් සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආරම්භ කළ ස්ථාවර තැන්පත් ගිණුම් 07 ක් අවසන් ගිණුම් වල දක්වා නොමැත.

<u>ස්ථාවර තැන්පත් ගිණුම් අංක</u>

20001-90-14730

20001-90-14985

20001-90-15027

20001-90-15051

20001-90-15078

20001-90-15094

20001-90-15892

### බැංකු ගිණුම් අංක **1650** සිදුකල හඳුනානොගත් හර කිරීම්

පහත දැක්වෙන වෙක්පත් දෙකෙහි අගයන් ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ ගිණුම් අංක 1650 ට හර කර ඇත. ඉහත චෙක්පත් අස්ථානගත වූ පසු ව්‍යාජ අත්සන් යොදා බැංකුවට ඉදිරිපත් කර තිබේ.

| චෙක්පත් අංක | හරකරන ලද දිනය | වටිනාකම - රු. |
|---|---|---:|
| 239481 | 11.09.2009 | 400,000.00 |
| 239482 | 12.10.2009 | 400,000.00 |

මෙම කරුණ සම්බන්ධව මිරිහාන පොලිසියේ වංචා විමර්ශන අංශයට පැමිණිල්ලක්කර ඇති අතර ඔවුන් විසින් පරීක්ෂණ පවත්වමින් පවතී. මේ කාරණය සම්බන්ධයෙන් කඩුවෙල මහේස්ත්‍රාත් උසාවියේ ද නඩුවක් විභාග වෙමින් පවතී.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதியின் திணைக்களம்
Auditor General's Department

මගේ අංකය / எனது இல. / My No. YS/G/SLBFE/1/14/04 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2015 දෙසැම්බර් දින.

සභාපති,
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය.

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හා එහි පරිපාලිත සමාගමේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් හා සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 18(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කාර්යාංශයේ සභාපති වෙත 2015 අගෝස්තු 11 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදයන්හි දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

#### 2.1.1 සමූහයේ මතය

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදයන්හි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 2.1.2 කාර්යාංශයේ මතය

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2. 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සමූහය

1996 අප්‍රේල් 18 දිනැති සංදේශය අනුව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 96/1019/107/028 මඟින් 1996 ඔක්තෝබර් 06 දින අනුදත් ප්‍රාග්ධනය වූ රු.මිලියන 100 ක් සහිතව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති නියෝජිත (පෞද්ගලික) සමාගම, සංස්ථාපනය කර තිබූ අතර නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය වූ රු.5,000,040 න් රු.මිලියන 5 ක් කාර්යාංශයේ ආයෝජනයක් වශයෙන් ලබාගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කෙරේ.

අ) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි 15(ඉ) වගන්තිය ප්‍රකාරව කාර්යාංශයට ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකිකයින් බඳවා ගැනීමට බලය ලැබී තිබුණු අතර කාර්යාංශයට අනුබද්ධිතව පිහිටුවා තිබූ පරිපාලිත සමාගම මඟින් එහි සාංගමික ව්‍යවස්ථාවලියෙන් උක්ත අරමුණ ඉටුකිරීම සඳහාම සමාගමක් පිහිටුවා තිබුණි. එලෙස එකම අරමුණ උදෙසා කාර්යංශයට අමතරව සමාගමක් පිහිටුවීමේ අවශ්‍යතාවය විගණනයට ගැටළු සහගත වේ.

ආ) එම පරිපාලිත සමාගමෙන් 2009 වර්ෂයට පසු කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණු අතර 2014 දෙසැම්බර් 31 දිනට රු.3,510,033 ක ලාභාංශයක් ලැබිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ලාභාංශයක් ප්‍රකාශයට පත්කර නොතිබුණි.

ඇ) රක්ෂණය කිරීමේ පළපුරුද්දක් නොමැතිව තිබියදී පරිපාලිත සමාගම වෙත විගමනිකයන් රක්ෂණය කිරීමේ කටයුතුවල නියෝජිත ආයතනය ලෙස කටයුතු කිරීමට ඉඩසලසා තිබුණි.

ඈ) කාර්යාංශය විසින් 2012 වර්ෂයේදී රු.මිලියන 20 ක ණය මුදලක් සමාගම වෙත ලබා දී තිබුණු අතර කාර්යාංශය විසින් රක්ෂණ සමාගම වෙත ගෙවනු ලබන රක්ෂණ වාරික මුදලින් එම ණය මුදල් පියවා ගැනීම සිදුකර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී දේශීය ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු හිඟ බදු මුදල් ගෙවීම සඳහා තවත් අතිරේක ණය මුදලක් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමකට අනුව 2014 අගෝස්තු 19 දින රු.මිලියන 20 ක ණය මුදලක් සමාගම වෙත කාර්යාංශය විසින් ගෙවා තිබුණි.

### 2.2.1 සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගනුදෙනු හෙළිදරව් නොකිරීම

ගෘහස්ථ නොවන සේවාවන්ට විදේශගත වන ශ්‍රමිකයන් සඳහා අවශ්‍යවන වෛද්‍ය වාර්තා ලබා ගැනීමට ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය විසින් වෛද්‍ය මධ්‍යස්ථානයක් සමඟ ගිවිසුමකට එළඹ, එය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිල්ල, ගෘහ භාණ්ඩ ඇතුළු අනෙකුත් මූලික යටිතල පහසුකම් සපයා දෙනු ලබන අතර අදාළ වෛද්‍ය මධ්‍යස්ථානයේ සම්පූර්ණ දළ ආදායමෙන් සියයට 30 ක මුදලක් ඒජන්සිය වෙත ලබා දෙනු ලැබේ. යථෝක්ත ගනුදෙනුව සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 ප්‍රකාරව හෙළිදරව් කර නොතිබුණි.

## 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - කාර්යාංශය

### 2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01

මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කළයුතු මූලික තොරතුරු හා අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පිළිබඳ ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07

---

අදාළ ආකෘතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි. මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. පෙර වර්ෂයේ ගැලපීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපීමේදී රු.36,609 ක් වැඩියෙන් සටහන් කර තිබුණි.

ii. කාරක ප්‍රාග්ධන සංචලනයන් ගැලපීමේ දී රු.36,735,785 ක දිගුකාලීන සේවක ණය අදාළ කර ගෙන තිබුණි.

iii. සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව පාරිතෝෂික ගෙවීම රු.9,711,794 ක් වුවත්, ලෙජරය අනුව රු.9,168,874 ක් මුදලින් ගෙවා තිබුණි. ඒ අනුව මූල්‍ය කටයුතුවලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.542,920 ක් අඩුවෙන් දක්වා තිබුණි.

ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08

---

ඉකුත් වර්ෂවලට අදාළ වැරදි නිවැරදි කිරීම් අතීතානුයෝගීව ගලපා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ප්‍රතිෂ්ඨාපනය කිරීමට කටයුතු නොකර රු.71,586,550 ක වැරදි නිවැරදි කිරීම් ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගලපා තිබුණි.

ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12

---

විලම්භිත බදු හා ආදායම් බදු සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16

---

යම් වත්කමක අපේක්ෂිත තත්ත්වය පූර්ව ඇස්තමේන්තුවලට සාපේක්ෂව වෙනස් වන්නේ නම් වත්කමක අවශේෂ වටිනාකම, ප්‍රයෝජනවත් ජීවිත කාලය, ක්ෂය කිරීමේ ක්‍රමය අවම වශයෙන් සෑම මුදල් වර්ෂයක් අවසානයේම සමාලෝචනය කළ යුතු වුවත් පිරිවැය රු.2,029,472,463 ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19

-----------------------------------

සමාලෝචිත වර්ෂය තුළ ආයුගණක තක්සේරුව මත ලාභය ගණනය කිරීමේ දී (Gain on activation) පාරිතෝෂික සඳහා ගෙවීම රු.9,711,794 ක් සැලකිල්ලට ගෙන නොතිබුණි.

උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20

-----------------------------------

2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයෙහි විලම්භිත විදේශාධාර හා ප්‍රදාන යටතේ දක්වා තිබූ රු.777,591 ක ප්‍රදානයේ ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳ අවශ්‍ය ගැලපීම් සිදු කර නොතිබුණි.

ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 36

-----------------------------------

නිශ්චිත කාලයකට වරක් වත්කම්වල හානිකරණ තත්වයක් පෙන්වයි නම් එම වත්කම්වල පොත්වල අගය හා වෙළඳපල අගය සංසන්දනය කර පොත්වල අගය වෙළඳපල අගයට වඩා අඩුනම් එම වෙනස් ප්‍රමාණය කපා හැරීම සිදු කල යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි.

එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38

-----------------------------------

අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය වන ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39

-----------------------------------

ආයෝජනවල අගයන් ක්‍රමක්ෂය කරන ලද අගයට මූල්‍ය ප්‍රකාශනවල පෙන්විය යුතු වුවත්, රු.8,559,105,769 ක් වූ ආයෝජන සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**2.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) සමාලෝචිත වර්ෂයට අදාළව ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.3,899,535 ක් අඩුවෙන් දක්වා තිබුණි.

ආ) අබුඩාබි තානාපති කාර්යාලයේ කම්කරු සුභසාධන අංශයේ සිදු වී ඇති එමිරේට්ස් ඩිරාම් 29,295 ක් වූ (ආසන්න ලෙස රු.1,058,276) මුදල් වංචාව සම්බන්ධයෙන් කළ යුතු ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි.

**2.3.3 නොසැසඳූ පාලන ගිණුම්**

--------------------------

මූල්‍ය ප්‍රකාශන හා ඒ සමඟ ඉදිරිපත් කළ උපලේඛන අනුව වත්කම් ගිණුම් 05 ක හා වගකීම් ගිණුම් 02 ක පිළිවෙලින් රු.8,108,532 ක් හා රු.2,534,377 ක නොසැසඳීම් නිරීක්ෂණය වූ අතර ඒවා හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.3.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

-------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට ගෙවිය යුතු කුවේට් වන්දි අරමුදල් වටිනාකම රු.2,975,504,815 ක් වුවද එහි වත්කම්වල වටිනාකම රු.2,829,570,793 ක් විය. එම අරමුදල හා වත්කම අතර රු.145,934,022 ක වෙනසක් නිරීක්ෂණය විය

ආ) විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල පිහිටුවා ඇති කම්කරු සුභසාධන අංශවලට අදාළ මුදල් ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.81,987,794 ක් වුවද ධූතමණ්ඩල විසින් සහතික කල මුදල් පොත්වලට අනුව ශේෂය රු.84,728,193 ක් විය. මෙම වෙනස ජර්නල් සටහන් පිටපත් කිරීමේදී සිදුවී තිබුණද එම වැරදි නිවැරදි කිරීමේ කටයුතු කර නොතිබුණි.

### 2.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

-----------------------------------

වටිනාකම රු. 150,219,284 ක් වූ ශේෂ 06 ක් පරීක්ෂා කිරීම සඳහා උපලේඛණ හා තහවුරු කිරීම් ලේඛණ විගණනයට ඉදිරිපත් නොවීය.

### 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) 2003 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විදේශ දූත මණ්ඩල සුහසාධන අංශ විසින් අයකර මහාභාණ්ඩාගාරය හරහා කාර්යාංශයට ප්‍රේෂණ කරනු ලැබූ කම්කරු කොන්ත්‍රාත් ගිවිසුම් ගාස්තුවලින් රු.1,185,548,646 ක මුදලක් තවදුරටත් මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතුව තිබුණි.

ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 02 ඉක්ම වූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු රු. 583,680 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඇ) විදේශ රැකියා නියෝජිත ආයතන 144 කින් සමාලෝචිත වර්ෂය අවසානයට අයකර ගත යුතුව පැවති රු.368,750 ක මුදලක් 2015 ජුනි වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඈ) විදේශ රැකියා නියෝජිත ආයතන විසින් ලියාපදිංචිය සඳහා අයදුම් කිරීමට 2008 - 2013 කාල පරිච්ඡේදයේදී ලබා දී තිබූ රු.4,930,000 ක් වූ බලපත්‍ර ගාස්තු ආපසු ගෙවීමට කටයුතු නොකර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් ආදායමට ගෙන තිබුණි.

ඉ) ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය විසින් 2006 ජුනි සිට 2007 ජනවාරි දක්වා කොරියානු විගමණිකයින් වෙත ආපසු ගෙවිය යුතු රු.18,350,000 ක් වූ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරඃනොතිබුණි.

ඊ) ඒකාබද්ධ ශේෂ පත්‍රයට අනුව කාර්යාංශයට ලැබියයුතු රු.1,210,968 ක් වූ තැන්පතු සම්බන්ධව කිසිදු පසුවිපරමක් කර නොතිබුණි.

උ) සමාලෝචිත වර්ෂය අවසානයට වසර 6 ක කාලයක් තිස්සේ විගමනිකයින්ගේ පැමිණිලි /ආරවුල් සමතයකට පත්කර ගැනීම සඳහා නියෝජිත ආයතන විසින් එකතුව රු.19,886,101 ක් තැන්පත් කර තිබූ අතර, එම ශේෂයන් නිරවුල් කිරීමට 2015 ජුනි වන විටත් කටයුතු කර නොතිබුණි.

ඌ) 2009 සිට 2013 දක්වා රක්ෂණ වන්දි ලෙස රක්ෂණ ආයතනයෙන් ලද මුදලින් රු.3,455,474 ක මුදලක් අදාළ විගමනිකයින්ට ගෙවීමට කාර්යාංශය විසින් පියවර ගෙන නොතිබුණි.

**2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| අ) | 1985 අංක 21 දරන විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත 15 වන වගන්තිය | අරමුණුගත නොවූ ව්‍යාපෘතියක් වෙනුවෙන් 2013 හා සමාලෝචිත වර්ෂවල රු.134,484,433 ක් වැය කර තිබුණි. |
| ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | i. මුදල් රෙගුලාසි 371(2) | තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කටයුත්ත නිමකල වහාම පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට රු.3,698,704 ක නිරවුල් නොවූ ශේෂයක් පැවති අතර එම ප්‍රමාණයෙන් රු.1,999,500 ක් 2015 පෙබරවාරි 28 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. |
| | ii. මුදල් රෙගුලාසි 395(ඇ) | කාර්යාංශයේ හා විදේශ තානාපති කාර්යාලවල කම්කරු සුභසාධන අංශවල පවත්වා ගෙන යනු ලබන බැංකු සැසඳුම් ප්‍රකාශයන් ඊළඟ මාසයේ 15 දිනට පෙර පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| iii. මුදල් රෙගුලාසි 757 | **i.** විදේශ තානාපති කාර්යාලවල පවත්වා ගෙන යනු ලබන කාර්යාංශයේ කම්කරු සුභසාධන අංශ 12 ක හා කාර්යාංශයේ පුහුණු මධ්‍යස්ථාන සහ පළාත් කාර්යාලවල සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| | **ii.** පුහුණු මධ්‍යස්ථානවල තිබූ පාවිච්චියට ගත නොහැකි ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ඒකක 521 ක් අපහරණය කිරීමට විගණන දිනය වූ 2015 මාර්තු 31 දින වන විටද කටයුතු කර නොතිබුණි. |
| ඇ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.11 ඡේදය | සමාලෝචිත වර්ෂයේ දී වාහන 51 ක් කාර්යාංශයේ ධාවනය සඳහා යොදාගෙන තිබුණද මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. |
| ඇ) 1999 පෙබරවාරි 26 දිනැති අංක 02/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 ඡේදය | රේඛීය අමාත්‍යාංශයේ ලේකම් නිර්දේශ කිරීමකින් තොරව 2013, 2014 හා 2015 පෙබරවාරි දක්වා කාර්යාංශයේ නිලධාරීන් සඳහා රු.854,611 ක ජංගම දුරකථන 101 ක් මිලදී ගෙන තිබුණි. |
| ඉ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 (viii) ඡේදය | කළමනාකරණ තනතුරක ඇතිවන පුරප්පාඩු පිරවීම අනුප්‍රාප්තික සැලැස්මකට අනුව කළයුතු නමුත් කාර්යාංශයට එවැනි සැලැස්මක් නොමැතිවීම හේතුවෙන්, පුරප්පාඩු වන තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් පත්කිරීමට නොහැකි වී තිබුණි. |

| | |
|---|---|
| 8.3.9 ඡේදය | රාජ්‍ය ව්‍යාපාර විසින් රේඛීය අමාත්‍යාංශයේ හෝ අනෙකුත් රාජ්‍ය ආයතනවල වියදම් නොදැරිය යුතු බවට උපදෙස් දී තිබියදී අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරීන් 04 දෙනෙකුගේ රු.88,790 ක ජංගම දුරකථන ගාස්තු නිරවුල් කර තිබුණි. |
| ඊ) 2011 පෙබරවාරි 11දිනැති අංක පීඊඩී/57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 06 ඡේදයේ (iii) උප වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව කාර්යාංශය විසින් සංගීත වැඩමුළුවක් සඳහා රු.1,000,000 ක මුදලක් අනුග්‍රාහකත්වයක් ලෙස ගෙවා තිබුණු අතර විද්‍යාලයක ආදි ශිෂ්‍ය සංගමය වෙත රු.1,000,000 ක් පරිත්‍යාග කර තිබුණි. |
| උ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 5.4.12 ඡේදය | වැට් බදු ආවරණය කිරීම සඳහා මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 වන දින හෝ ඊට පෙර එකී ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| ඌ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොත අංක 19 | අළුත්වැඩියා වියදම් රු.200,000 ට වැඩි නම් ඒ සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාළව අවස්ථා 06 කදී රු.1,536,646 ක අළුත්වැඩියා සඳහා අදාළ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| එ) 2010 සැප්තැම්බර් 01 දිනැති අංක පීඑෆ්/එෆ්එස්/05(viii) දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛයේ 3.3 ඡේදය | අන්තර්ජාල පහසුකම් ලබාගැනීමට අවශ්‍ය උපකරණ හා උපාංග මිලදී ගැනීමේ පිරිවැය නිලධාරීන් විසින් පෞද්ගලිකව දැරිය යුතු වුවද කාර්යාංශයේ නිලධාරීන් 66 දෙනෙකු සඳහා ඩොංගල් කාර්යාංශයේ මුදලින් මිලදී ගෙන තිබුණි. |

2.3.2 (ii) ඡේදය

රජයේ වියදමින් බිල්පත් නිරවුල් කරනු ලබන ජංගම දුරකථනවල අංක, ආයතනයේ අභ්‍යන්තර දුරකථන නාමාවලියට ඇතුළත් කළයුතු වන බවට උපදෙස් දී තිබුණද, කාර්යාංශයේ මාණ්ඩලික නිලධාරින්ගේ ජංගම දුරකථන අංක පමණක් දුරකථන නාමාවලියට ඇතුළත් කර තිබුණි.

ඒ) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 04/0427/020/002 හා 2004 මැයි මස 12 වැනි දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය

නියැදි පරීක්ෂණයට අනුව සමාලෝචිත වර්ෂය තුළ ප්‍රචාරණය හා ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව රු.30,909,020 ක මුදලක් රාජ්‍ය නොවන මාධ්‍ය ආයතන වෙත ගෙවා තිබුණි.

ඔ) 2014 නොවැම්බර් 22 දිනැති අංක පිආර්ඊ/2015/43 දරන මැතිවරණ කොමසාරිස්ගේ ලිපිය ඡේද අංක 05 (ii)

i. බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවල 2014 දෙසැම්බර් 01 සිට 2015 ජනවාරි 31 දක්වා රටවිරු සංවිධාන බලගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කාර්යාංශ සේවයේ නියුක්ත නිලධාරීන් 116 දෙනෙකු බදුල්ල පළාත් කාර්යාලයට අනුයුක්ත කර කුළී පදනම මත වාහන 10 ක් සපයා තිබු අතර එම කාලය වෙනුවෙන් නිලධාරීන්ට වැටුප් හා දීමනා ලෙස රු.4,314,111 ක් හා වාහන කුලී ගාස්තු රු.5,125,824 ක් වශයෙන් එකතුව රු.9,439,935 ක් මැතිවරණ කොමසාරිස්ගේ ලිපියට පටහැනිව ගෙවා තිබුණි.

ii. චක්‍රලේඛයට පටහැනිව ජනාධිපතිවරණ කාල සීමාවේදී කාර්යාංශයේ සුබසාධන අංශය විසින් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව අවස්ථා 02 කදී රටවිරුවන් 43 දෙනෙකුගේ නිවාස ණය ඉල්ලුම්පත් කොළඹ දිස්ත්‍රික් සහකාර සමෘද්ධි කොමසාරිස් වෙත ඉදිරිපත් කර තිබුණි.

ඡේදඅංක 07 (i)

චක්‍රලේඛ විධි විධානවලට පටහැනිව ජනාධිපතිවරණය සඳහා නාම යෝජනා කැඳවා ඇති කාල සීමාව තුළ, කාර්යාංශයට නිලධාරින් 13 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.

## 2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

ජපානයේ කම්කරු සුභසාධන අංශයට කම්කරු සුභසාධන නිලධාරි තනතුරක් අනුමත කර නොතිබූ අතර 2012 සිට 2014 දක්වා අනුමත නොවූ තනතුරක් සඳහා එකතුව රු.10,521,835 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1. මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ බදු පෙර මූල්‍ය ප්‍රතිඵලය රු.459,974,615 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.326,198,141 ක අතිරික්තයක් වුයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.133,776,474 ක් හෙවත් සියයට 41 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. මෙම වර්ධනයට ආදායමේ වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2. කාර්යාංශයට එරෙහිව හෝ කාර්යාංශය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි.

විදේශ සේවා නියුක්ති කාර්යාංශයට එරෙහිව සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට බාහිර පාර්ශවයන් හා කාර්යාංශ නිලධාරින් විසින් නඩු 15 ක් ගොනු කර තිබූ අතර නඩු 04 ක් සඳහා කාර්යාංශය විසින් බැරකමක් ලෙස හඳුනාගෙන ඇති වටිනාකම රු.1,348,596 කි. ඒ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය.

### 4.1 කාර්යයසාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) කාර්යාංශයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව ව්‍යාපෘති 7 ක මූල්‍ය ප්‍රගතිය සියයට 46 සිට සියයට 94 දක්වා වූ පරාසයක පැවති අතර ව්‍යාපෘති 08 ක් කාර්යාංශය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද ව්‍යාපෘති 05 ක අපේක්ෂිත ඇස්තමේන්තුගත වියදමට වඩා තථ්‍ය වියදමේ වැඩිවීම සියයට 82 ත් සියයට 170 ත් අතර වූ පරාසයක විය.

ආ) විදේශීය සුභසාධන අංශයේ සමාලෝචිත වර්ෂයේ වියදම් විශ්ලේෂණය පහත දැක්වේ.

| වියදම් වර්ගය | මුදල රු. | ප්‍රතිශතය |
|---|---|---|
| විදේශීය දූත මණ්ඩලවල සිටින කාර්යාංශයේ කාර්ය මණ්ඩලයේ සෘජු වියදම් | 419,300,801 | 57.63 |
| විගමණිකයන් වෙනුවෙන් දරන ලද සෘජු වියදම | 232,978,562 | 32.02 |
| අනෙකුත් කාර්ය මණ්ඩල සුභසාධන ක්‍රියාකාරකම් | 75,281,190 | 10.35 |
| | 727,560,553 | 100.00 |

සමස්ථ විදේශීය සේවක සුභසාධන අංශය විසින් එහි විගමණික සේවක සුභසාධනය වෙනුවෙන් සියයට 32 ක පමණ අඩු පිරිවැයක් දරා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට නොවිසඳී ඇති පැමිණිලි සංඛ්‍යාව 7,556 ක් ද ආරක්ෂිත නිවාසවල රඳවා ඇති රැඳවියන් සංඛ්‍යාව 431 ක්ද මියගිය සංඛ්‍යාව 315 ක් සහ බන්ධනාගාරගතව, පොලිස් අත්අඩංගුවේ හා රෝහල්ගතව 75 දෙනෙකු සිටින බව නිරීක්ෂණය විය. මෙම හේතුන් නිසා එම විගමනික ප්‍රජාවගේ ගැටළු වෙනුවෙන් කාර්යාංශයේ දායකත්වය ඉතාම අවම තත්වයක පවතින බව නිරීක්ෂණය විය.

ඇ) ජපානයේ කම්කරු සුභසාධන අංශය වෙත සමාලෝචිත වර්ෂයේ රු.6,342,582 ක අග්‍රිමයක් නිකුත් කර තිබුණු අතර ඉන් රු.5,385,002 ක මුදලක් වැයකර තිබුණි. එය කාර්යාංශයේ කාර්යය මණ්ඩලය වෙනුවෙන් රු.5,098,056 ක් හා විගමණික ශ්‍රමිකයන්ගේ සුභසාධනය වෙනුවෙන් රු.286,946 ක් යොදවා තිබුණි. මේ අනුව විගමණික ශ්‍රමික සුභසාධනය වෙනුවෙන් සියයට 4 ත් සියයට 6 ත් අතර ප්‍රමාණයක් වැය කර තිබු අතර 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ජපානයට විදේශගත වු ලියාපදිංචි ශ්‍රමිකයන් 337 දෙනෙකු වන අතර පැමිණිලි සංඛ්‍යාව 30 ක් විය.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

අ) අභ්‍යන්තර විගණන වාර්තාවන්ට අනුව අබුඩාබි හා ලෙබනන් දූත මණ්ඩලවල කම්කරු සුභසාධන අංශවල කටයුතුවල මූල්‍ය පාලනය දුර්වල තත්වයක පවතින බවත් භෞතික වත්කම් උපයෝජනය සහ කාර්යසාධනය ප්‍රමාණාත්මක නොවන බවත් වාර්තා වී තිබුණි.

ආ) නිලධාරින් 31 දෙනෙකු වෙත ලබා දි තිබු රු. 2,352,771ක ණය මාස 11 සිට මාස 110 දක්වා හිඟ හිට තිබුණි.

ඇ) සමාලෝචිත වර්ෂයේ රු.3,757,661 ක් ආර්ථික සේවා ගාස්තු වශයෙන් ගෙවා තිබුණු අතර එම මුදල වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගෙන ඇතත් එම ගෙවීම ආදායම් බදු ගණනයේ දී බදු බැරක් අඩුවීමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත සඳහන් කරුණු අනාවරණය විය.

අ) විගමනික ශ්‍රමිකයින් 10 දෙනෙකු සඳහා ගෙවිය යුතු වු රු. 2,065,000 ක මුදල සඳහා රක්ෂණ වන්දි මුදල් ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය වෙත 2013 වර්ෂයේ ලැබී ඇතත්, කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම මුදල් අදාළ වන්දි හිමියන්ට නිදහස් කිරීමට විධිමත් පියවර ගෙන නොතිබුණි.

ආ) 1990 වර්ෂයේ දී ඉරාකය විසින් කුවේට් ආක්‍රමණය කිරීමෙන් එහි රැකියාවන්හි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ට සිදු වූ ආපදාවන්ට වන්දි ගෙවීම සඳහා එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසමෙන් ලැබී ඉතිරිවී තිබූ රු.2,975,504,815 ක මුදල අදාළ ශ්‍රමිකයින් වෙත ගෙවා අවසන් කිරීමට විධිමත් වැඩපිළිවෙලක් කාර්යාංශය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

ඇ) ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 95 ක් වූ සී/ස කහගොල්ල ඉංජිනේරු සේවා සමාගමට අයත් ඉඩමක් 99 අවුරුදු බදු පදනම මත ලබා ගැනීම සඳහා කාර්යාංශය විසින් 2013 වර්ෂයේ රුපියල් මිලියන 20 ක අත්තිකාරමක් සී/ස රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවට ගෙවා තිබුණි. අංක 10/2013 (M-01) හා 2013 ජනවාරි 17 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව රු.මිලියන 20 ක් ගෙවා ගොඩනැගිලිවල හා ඉඩමේ නිරවුල් භුක්තිය භාරගන්නා ලෙස දන්වා තිබුනද ඉඩමේ නිරවුල් භුක්තිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඈ) විගමනික ශ්‍රමිකයන් සඳහා කාර්යාංශය විසින් පවත්වාගෙන ගොස් තිබූ අර්ථසාධක අරමුදල් යෝජනා ක්‍රමය වර්තමානයේ අක්‍රිය තත්ත්වයේ පවතින අතර සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කාර්යාංශය විසින් රඳවා ගෙන තිබූ විගමනිකයින් 1620 කට අයත් රු.6,572,054 ක දායක මුදල මුදාහැරීමට කටයුතු කර නොතිබුණි.

**4.4** අරමුණුවට පටහැනි ගෙවීම්

---------------------------

කාර්යාංශය විසින් රටවිරු ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.84,527,351 ක් දරා තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ) මැතිවරණය පවත්වනු ලැබූ කාල සීමාව වූ අප්‍රේල් හා දෙසැම්බර් මාසවල වියදම් පිළිවෙලින් රු.17,731,248 ක් හා රු.17,148,865 ක් ලෙස සියයට 151.7 කින් හා සියයට 143 කින් වැඩි වී තිබූ අතර මැයි හා නොවැම්බර් මාසවල දී වියදම සාමාන්‍ය වියදමට සාපේක්ෂව සියයට 46 කින් හා සියයට 43 කින් වැඩි වී තිබුණි. මුළු වියදමින් වවුචර් 10 කට අදාළව රු.10,800,750 ක් වූ සියයට 13 ක් ව්‍යාපෘතියට අදාළ නොවන ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් වැය කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් තමා දැනුවත්ව නොසිටි බව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රචාරක හා විදේශ සම්බන්ධතා) විසින් දන්වා තිබුණි.

ආ) රටවිරු බක්මහ උළෙල සඳහා පෝස්ටර්, ප්‍රදර්ශණ පුවරු, බැනර් මුද්‍රණය කිරීමට ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව රු.6,014,450 ක් ගෙවීම් කර තිබුණු අතර ඉන් රු.1,399,975 ක් වටිනා පෝස්ටර් කාර්යාංශ සභාපතිවරයාගේ අනුමැතිය ලැබීමට ප්‍රථම මුද්‍රණය කර බෙදා හැර තිබුණි. තවද එහි සජීවී රූපවාහිනී විකාශය සඳහා මිල ගණන් කැඳවීමකින් තොරව රු.1,399,975 කට පෞද්ගලික මාධ්‍ය ආයතනයක් තෝරා ගෙන ගෙවීම් කර තිබුණි.

ඇ) මාතර දිස්ත්‍රික් රටවිරු සව්බල ගැන්වීමේ වැඩසටහන සඳහා රු.4,844,000 ක පිරිවැය ඇස්තමේන්තුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණද එම පිරිවැය ඇස්තමේන්තුව තුළ ඇතුළත් නොවූ රු.2,048,850 ක් වූ කුඩ හා ටී ෂර්ට් 1600 ක් මිලදී ගෙන බෙදාහැර තිබූ අතර බෙදාහැරීම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. තවද 2014 අප්‍රේල් 08 දින දකුණු පළාත් සභා මැතිවරණය පැවති කාලය ආසන්නයේ කුඩ හා ටී ෂර්ට් එම ප්‍රදේශයේ බෙදා හැර තිබූ අතර කාර්යාංශයේ අරමුණුවලට පටහැනි ගෙවීමක් බව විගණනයේ දී නිරීක්ෂණය විය.

## 4.5 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) කාර්යාංශයේ සමාලෝචිත වර්ෂයට අදාළ රු.5,301,873 ක වියදම් ගිණුම්ගත කර තිබුණද එම ගනුදෙනු සම්බන්ධයෙන් මතභේදාත්මක තත්වයක් පවතින බැවින් එම ගණුදෙනුවලට අදාළ චෙක්පත් භාරදීම් සිදුකර නොතිබුණි.

ආ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.4,667,368 ක් වූ වියදම් මැතිවරණ කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු සීමා කරන ලද කාල පරිච්ඡේදයට අදාළ වූ බැවින් ගෙවීම් කර නොතිබුණි.

ඇ) ලෙබනනයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ කම්කරු සුබසාධන අංශයේ උපදේශකවරයෙකු ලෙස කොන්ත්‍රාත් පදනමට පත්කර තිබූ නිලධාරියෙකු වෙත පත්වීමේ ලිපිය ප්‍රකාරව මාසයකට ප්‍රවාහන දීමනාව ලෙස ඇ.එ.ජ.ඩොලර් 350 ක් හිමි වුවද ඊට අතිරේකව ඇ.එ.ජ.ඩොලර් 2,793.32 ක් කුළී රථ ගාස්තු ප්‍රතිපූර්ණය කර තිබුණි. තවද උක්ත නිලධාරියාට සහ පවුලේ අයට මිල ගණන් කැඳවීමකින් තොරව උපරිම දින 14 ක් හෝටලයක නවාතැන් පහසුකම් සැපයීමට කටයුතු කර තිබුණු අතර එම කාල සීමාවට අමතරව දින 14 ක් හෝටලයේ නවාතැන් ගැනීම හේතුවෙන් ඇමරිකානු ඩොලර් 2,450 ක් වැඩිපුර ගෙවා තිබුණි. 2014 පෙබරවාරි 10 දිනැති හිටපු කම්කරු අංශ ප්‍රධානිගේ ලිපිය ප්‍රකාරව ඇමරිකානු ඩොලර් 1,500 ක මාසික කුලියකට නිවසක් සපයා දීමට

එකඟ වී තිබියදී, අමතර දින 14 ක් හෝටලයක නවාතැන් ගෙන තිබුණි. මෙම නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් ඩොලර් 5,050 ක චෙක්පතකින් ගෙවීම් කර තිබුණද හෝටලය මඟින් ඉදිරිපත් කර තිබූ රිසිට් පත්‍රය අනුව ලෙබනන් පවුම්වලින් මුදල් ලද බවට සහතික කර තිබුණි.

**4.6** දෘෂ්‍ය අක්‍රමිකතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) කාර්යාංශයේ අරමුණුගත කාර්යයක් නොවූ මාධ්‍යවේදීන් දැනුවත් කිරීම සඳහා පැවති වැඩමුළු 02 කට සහභාගීවන මාධ්‍යවේදීන්ට ත්‍යාග ලෙස ප්‍රදානය කිරීම සඳහා රු.479,000 ක් වූ ඩොන්ගල් 175 ක් මිලදී ගෙන තිබුණි.

ආ) 2014 අප්‍රේල් 27 හා 29 යන දිනයන්හිදී විදේශ රැකියා පිළිබඳ දැනුවත් කිරීම් පා ගමන ගම්පහ හා කොළඹදී පැවැත්වීමේ දී එයට සහභාගීවන 5200 දෙනෙකුට ආහාර සැපයීම වෙනුවෙන් රු.2,854,000 ක් ද ටී ෂර්ට් හා තොප්පි මිලදී ගැනීම වෙනුවෙන් රු.3,627,000 ක් ද ගෑස් පිරවූ බැලූන් 3000 ක් හා බැනර් 30 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.925,304 ක් ද වශයෙන් රු.7,406,304 ක් පෞද්ගලික ආයතන වෙත ගෙවා තිබුණි. මේ සඳහා අනුමත වැඩ සටහනක් හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද ලබා ගෙන නොතිබුණු අතර ක්‍රමවත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කර නොතිබුණි. තවද උක්ත ගෙවීම්වලට අදාළව ඉදිරිපත් කර තිබූ ලේඛන පිළිගත නොහැකි වූ අතර මිලදී ගැනීම් විධිමත් පරිදි කාර්යාංශ ගබඩාව හරහා සිදු කර නොතිබීමෙන් එම භාණ්ඩ කාර්යාංශයට ලැබුණු බවටද සාක්ෂි නොවීය.

ඇ) 2014 මැයි 09 දින හම්බන්තොට දිස්ත්‍රික්කයේ විදේශ රැකියා අපේක්ෂකයින් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමේ ප්‍රචාරක කාර්යය වෙනුවෙන් රු.1,713,600 ක් සැලසිනේ ආයතනයට ගෙවා තිබුණද මෙවැනි වැඩසටහනක් පැවැත්වූ බවට සනාථ වන කිසිදු ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් නොවීය.

ඈ) හාලි ඇළ විගමණික සම්පත් මධ්‍යස්ථානයට මුල්ගල තැබීමේ උත්සවයේ වියදම් වෙනුවෙන් සභාපතිගේ මූල්‍ය බලතල සීමාව ඉක්මවා රු.12,612,500 ක් අනුමත කර තිබූ අතර එම මුදලින් රු.9,157,060 ක් වැය කර ඇති බව දක්වා තිබුණද ඉන් රු.8,048,648 ක් උක්ත කාර්යයට යොදවා නොතිබුණි.

ඉ) සංක්‍රමණික දින සැමරුම වෙනුවෙන් උතුරු, නැගෙනහිර, සබරගමුව හා මධ්‍යම පළාත් 04 හි තෝරාගත් රටවිරු පවුල් 9375 ක පාසල් දරුවන් 11,000 කට පාසල් පොත් හා උපකරණ කට්ටල බෙදා දීමේ ආධාර වැඩසටහන සඳහා

සැපයුම් කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකම රු.16,550,100 ක් පළාත් 04 වෙනුවෙන් ප්‍රසම්පාදන 04 ක් යටතේ කොටස්කර ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීම නිසා අමාත්‍යාංශ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැර වී තිබුණු බව නිරීක්ෂණය විය.

ඊ) නාය යෑමෙන් විපතට පත් මීරියබැද්ද, කොස්ලන්ද ප්‍රදේශයේ රටවිරු පවුල්වලට සහන සැලසීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී අධ්‍යක්ෂ මණ්ඩල පූර්ව අනුමැතියකින් තොරව රු.1,000,000 ක් බදුල්ල විගමණික සම්පත් මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරි වෙත බැංකු අණකරයකින් ගෙවා තිබුණි.

උ) කොළඹ දිස්ත්‍රික්කයේ අවදානම් හා හැකියා සංගණනය හා පුහුණු වැඩමුළුව වෙනුවෙන් ලබාගන්නා ලද රු.1,985,100 ක අත්තිකාරම් මුදල පියවීමට ඉදිරිපත් කරන ලද ජර්නල් වවුචරය මගින් සාවද්‍ය තොරතුරු පදනම්ව කාර්යාංශයේ මුදල් අයථා පරිහරණය කර තිබූ බවට අභ්‍යන්තර විගණන අංශයෙන් සිදුකරනු ලැබූ පරීක්ෂණයේදී අනාවරණය වී තිබුණි. තවද පිආර්ඊ/2015/43 හා 2014 නොවැම්බර් 22 දිනැති මැතිවරණ කොමසාරිස්ගේ ලිපියේ ඡේද අංක 05(i) ට පටහැනිව 2015 ජනාධිපතිවරණ කාල සීමාව තුළ මෙම වියදම් දරා තිබුණි.

## 4.7 ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) 2004 වර්ෂයේ ස්ථාපිත කර තිබූ රු.60,831,694 ක් වටිනා මලාපවහන පද්ධතිය සඳහා නැවත 2009 වර්ෂයේ රු.492,796 ක උපකරණ ලබාගෙන තිබූ අතර එය ප්‍රයෝජනයට නොගෙන අනාරක්ෂිතව ගබඩාවේ තබා තිබුණි.

ආ) 1999 හා 2009 වර්ෂවල මිලදීගත් වාහන 05 ක් නිශ්කාර්යව පැවති අතර 2009 වර්ෂයේ මිලදී ගන්නා ලද වාහන 02 ක් ඌන උපයෝජිත තත්වයේ තිබුණි.

## 4.8 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) කාර්යාංශය විසින් ගාල්ල දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය සඳහා ඉදිකිරීම් කටයුතු අවසන් නොකළ ගොඩනැගිල්ලක් රු.300,000 ක මාසික කුලියට, ලබාගෙන තිබුණි. එම බදුකරු ගොඩනැගිලි ඉදිකිරීම් අවසන් කළ පසු රජයේ තක්සේරු වටිනාකම වූ රු.400,000 ක්, ලෙස මාසික බදු කුලිය වැඩිකර තිබුණු අතර කාර්යාංශය විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ එකඟ වූ තීරණය අභිබවා මාසික බදු කුලිය ඉහළ නැංවීමට කටයුතු කර තිබුණි.

ආ) තොරතුරු තාක්ෂණ උපදේශකයෙකුගෙන් හා නිලධාරීන් 24 දෙනෙකුගෙන් සමන්විත තොරතුරු තාක්ෂණ ඒකකයක් කාර්යාංශය තුළ පිහිටුවා තිබියදී, විවෘත වෙළඳපල මිල ගණන් කැඳවා කාර්යාංශයේ වෙබ් අඩවිය නැවත නිර්මාණය කිරීම සඳහා රු.780,000 ක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි.

ඇ) රටවිරු ටැලන්ට් ස්ටාර් ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දරන ලද රු.27,545,985 ක් අදාළ ව්‍යාපෘතිය අත්හැර දැමීම හේතුවෙන් ආර්ථික නොවන වියදමක් ලෙසට විගණනයට නිරීක්ෂණය විය.

ඇ) ගිවිසුම් අත්සන් කිරීමේ කාර්යාල පරිශ්‍රය වෙනුවෙන් ගොඩනැගිල්ලක් බදු ගැනීම් ක්‍රියාවලියේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සලකා බැලිය යුතු කරුණු කෙරෙහි අවධානය යොමු නොකර කටයුතු කිරීම හේතුවෙන් ගොඩනැගිලි දෙකක් සඳහා 2014 දෙසැම්බර් මස සිට 2015 මාර්තු 13 දින දක්වා කාල පරිච්ඡේදයට පිළිවෙලින් රු.2,625,000 ක් සහ රු.1,926,000 ක් කුලී ගෙවීමට කාර්යාංශයට සිදුවී තිබුණි.

**4.9** හඳුනාගන්නා ලද පාඩු

------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) 2011 හා 2012 වර්ෂවලට අදාළව ජාතික රක්ෂණ අරමුදල් භාරයට හා ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය වෙත රක්ෂණ වාරික ලෙස ගෙවා තිබූ රු.218,681,760 ක මුදලෙහි ඇතුළත් රු.23,430,210 ක් වූ යෙදවුම් බදු සහ තංගල්ල විගමනික පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ගෙවන ලද රු.58,549,800 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලෙහි ඇතුළත් රු.5,635,915 ක් වූ වැට් බදු, යෙදවුම් බදු ලෙස අඩුකර ගැනීමට කටයුතු කර නොතිබීමෙන් කාර්යාංශයට රු.29,066,125 ක අලාභයක් සිදු වී තිබුණි.

ආ) අබුඩාබිහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන කාර්යාංශයේ කම්කරු සුභසාධන අංශයේ ලිපිකරු නිලධාරිනිය විසින් 2014 ජුනි 03 සිට 09 දින දක්වා වූ කාල සීමාව තුළදී රැස්කරගන්නා ලද එමිරේට්ස් ඩිරාම් 29,295 ක් වූ (ආසන්න ලෙස රු.1,058,276 ක) මුදල , මුදල් රෙගුලාසි 187(3) ප්‍රකාරව අප්‍රමාදව බැංකු ගත කිරීමට කටයුතු නොකිරීම හා එම ප්‍රමාණයෙන් කම්කරු සුභසාධන අංශයේ මුදල් හිඟයක් පැවතීම සම්බන්ධයෙන් විධිමත් පියවරක් කාර්යාංශය විසින් ගෙන නොතිබුණු අතර යථෝක්ත නිලධාරිනිය කාර්යාංශ සේවයෙන්ද නිදහස් කර තිබුණි.

**4.10 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් කාර්යාංශයේ සම්පත්**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව කාර්යාංශයට අයත් හා කුළී පදනම මත ලබා ගන්නා ලද වාහන 04 ක් අදාළ අමාත්‍යාංශය හා වෙනත් රජයේ ආයතනයක් වෙත ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ඒ වෙනුවෙන් රු.4,126,716 ක් වැය කර තිබුණි.

ආ) කාර්යාංශයේ නිලධාරීන් 10 දෙනෙකු අමාත්‍යාංශයේ හා රජයේ අනෙකුත් ආයතනයක සේවයේ යොදවා තිබුණු අතර 2013 හා 2014 වර්ෂවල පිළිවෙලින් රු.5,425,814 ක් හා රු. 5,637,205 ක් වැටුප් හා වේතන ලෙස ගෙවා තිබුණි.

**4.11 කාර්ය මණ්ඩල පරිපාලනය**

2014 දෙසැම්බර් 31 දිනට කාර්යාංශයට අදාළව කාර්ය මණ්ඩල විස්තර පහත සඳහන් පරිදි වේ.

අ) 2014 දෙසැම්බර් 31 දිනට කාර්යාංශයේ තනතුරු 22 ක් සඳහා 1216 ක ස්ථිර කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණද තථ්‍ය ස්ථිර කාර්ය මණ්ඩලය 1116 ක් වීමෙන් 100 ක පුරප්පාඩු නිරීක්ෂණය වූ අතර අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර කොන්ත්‍රාත් හා ද්විතික පදනම මත පිළිවෙලින් නිලධාරීන් 70 ක් හා 21 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණි.

ආ) අනුමත නොවූ තනතුරු 08 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 167 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර ඒ සඳහා රු.60,188,791 ක මුදලක් 2014 වර්ෂය තුළදී වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

කාර්යාංශය විසින් 2011-2015 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද 2007 දෙසැම්බර් 18 දිනැති අංක පීඊඩී /47 දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය අනුව, ඒ ඒ වර්ෂ අවසානයට සංයුක්ත සැලැස්මේ කාර්යයන් ඉටුකිරීම පිළිබඳ ප්‍රගතිය හා ක්‍රියාත්මක නොවුණු හා මන්දගාමී අංශ පිළිබඳ ඇගයීමක් කර ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් පිළියෙල කර නොතිබුණ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයටද ලක්කර නොතිබුණි.

## 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

---------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) 2013 සැප්තැම්බර් සිට 2014 සැප්තැම්බර් කාල පරිච්ඡේදය තුළ දකුණු කොරියානු රැකියා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා විගමණිකයන්ට ටී ෂර්ට් හා ශීත කබා මිලදී ගැනීම සඳහා රු.මිලියන 20 ක් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 පරිච්ඡේදය ප්‍රකාරව මෙම වියදම් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 28 හා 2014 ජූලි 04 දිනැති මාර්ගෝපදේශ යොමුව 2.14.1 ප්‍රකාර වෙළඳපල මිල සැදහුම් ක්‍රමය අනුගමනය කල හැකි සීමාව රු.මිලියන 5 ක් වුවත්, රු.6,840,000 ක් වූ යථෝක්ත මිලදී ගැනීම් සඳහා එම ක්‍රමය අනුගමනය කර තිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12 පරිච්ඡේදය ප්‍රකාරව ලංසුකරුවන්ගේ පූර්ව සුදුසුකම් පරීක්ෂා නොකිරීම හේතුවෙන් ශීත කබා සඳහා වූ ඇණවුම ලබා දීමට ටෙන්ඩර්කරු අපොහොසත් වී තිබුණි.

ආ) කාර්යාංශය විසින් නිලධාරින්ගේ නිල ඇඳුම් සඳහා සාරි මිලදී ගැනීමේ දී රු.20,563 ක් වැයකර සාරි පිරිවිතරයක් සකස් කර තිබියදී දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් එයින් බැහැරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12 ඡේදයට පටහැනිව වෙනත් ආයතනයක් වූ බදුල්ල දිස්ත්‍රික් රටවිරු ව්‍යවසායකත්ව හා සංවර්ධන සමුපකාර සමිතිය වෙත එකී කොන්ත්‍රාත්තුව ලබා දී තිබුණි. මේ අනුව මුලින් පිළියෙල කල සාරි පිරිවිතරය වෙනුවට වෙනත් පිරිවිතරයක් සහිත සාරි මිලදී ගෙන තිබීම හේතුවෙන් එම වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණු අතර පිරිවිතරයන් වෙනස් කිරීම හේතුවෙන් සාරි මිලදී ගැනීම වෙනුවෙන් රු.1,279,200 ක් වැඩිපුර ගෙවා තිබුණි.

ඇ) 2013 මාර්තු සිට 2014 මාර්තු දක්වා කොරියානු නේවාසික පුහුණුලාභීන්ට ආහාරපාන සැපයීම වෙනුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 21 හා 2012 පෙබරවාරි 23 දිනැති මාර්ගෝපදේශ 3.4 ට පටහැනිව රු.38,306,628 ක් ගෙවා තිබුණි.

ඇ) 2014 මාර්තු සිට 2014 ජූනි දක්වා වූ වැඩසටහන් 28 ක පුහුණුලාභීන් 1,244 ක් සඳහා රු.9,526,603 ක් වූ ආහාර සැපයීම් කොන්ත්‍රාත්තුව ගිවිසුමක් හෝ ප්‍රසම්පාදන කමිටු අනුමැතියකින් තොරව ලබා දී තිබුණි.

ඉ) රු.මිලියන 10 දක්වා වූ මාස 03 ක කාල පරිච්ඡේදයක් සඳහා ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුවට අදාළ ගිවිසුමට එළඹීමේ දී එය වර්ෂයක කාල පරිච්ඡේදයක් ලෙසට ලබා දී තිබූ අතර 2014 ජූලි 04 දිනැති ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය සඳහා වූ අතිරේක 28 හි මාර්ගෝපදේශ 2.14.1 අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව නොසලකා ඒකක මිල පමණක් සැලකිල්ලට ගෙන සැපයුම්කරු තෝරා ගෙන තිබුණි.

ඊ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 ට පටහැනිව සැපයුම්කරු සමඟ ගිවිසුමකට ඇතුලත් නොවී රු.2,127,655 ක් ආහාර සැපයීම සඳහා ගෙවීම් කර තිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

කාර්යාංශයේ අයවැයගත ඇස්තමේන්තුවල නිවැරදිතාව සම්බන්ධයෙන් විගණනයට සෑහීමට පත්විය නොහැකි වූ අතර 2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කාර්යාංශයේ ප්‍රචාරණ වියදම්වල ඇතුළත් රූපවාහිනී වැඩසටහන් සඳහා වියදම සියයට 900 කින් සහ ගුවන් විදුලි වැඩසටහන් සඳහා වියදම සියයට 517 කින් ඉහළ ගොස් තිබුණි. තවද ව්‍යාපාර ප්‍රවර්ධන වියදම්වල වෙළඳපොළ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා වියදම සියයට 394 කින් ද කොරියානු ව්‍යාපෘති වියදම සියයට 203 කින් ඉහළගොස් තිබූ අතර අයවැය ලේඛනය මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බැව් නිරීක්ෂණය විය.

## 5.4 නොවිසඳී ඇති විගණන ජේද

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

අ) මුදල් රෙගුලාසි අංක 371(2) ඇ ඡේදයට පටහැනිව 2003 හා 2004 වර්ෂවල අවස්ථා 10 කදී ලබා දෙන ලද රු. 129,500 ක අත්තිකාරම් මුදල් වසර 10 කට වඩා වැඩි කාලයක් පියවා නොතිබුණි.

ආ) 2009 සැප්තැම්බර් මාසයේ දී ව්‍යාජ ලෙස අත්සන් යොදා ලබාගත් රු.400,000 ක් වූ චෙක්පත් 2 ක හඳුනානොගත් හර ශේෂ ලෙස දක්වා තිබූ අතර එම වංචාව සම්බන්ධයෙන් අප්‍රමාදව කටයුතු කර නොතිබුණි.

ඇ) 2007 හා 2008 වර්ෂවල කොරියාවට ශ්‍රමිකයන් විදේශ ගත කිරීමේදී, විදේශගත නොවූ ශ්‍රමිකයන් 62 ක් සඳහා මිලදීගත් යානාපත්‍ර ආපසු ඔවුනට භාර නොදීම හේතුවෙන් සිදු වූ රු.2,264,660 ක මුල්‍ය පාඩුවක් සම්බන්ධයෙන් කාර්යාංශය විසින් විධිමත් ක්‍රියාමාර්ගයක් අප්‍රමාදව ගෙන නොතිබුණි.

ඈ) සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි විගමනික පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව කතරගම, හෝමාගම, කහගොල්ල, සහ දඹුල්ල විගමනික සම්පත් මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා 2007 වර්ෂයේ සිට 2010 දක්වා කාල සීමාව තුළදී රු.50,372,816 ක මුදලක් වැය කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය තෙක් එම ඉදිකිරීම් ව්‍යාපෘතිවල වැඩ නිමකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කළයුතු වේ.

අ) ගිණුම්කරණය.
ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය.
ඇ) වාහන පරිපාලනය.
ඈ) විදේශ දූත මණ්ඩල මගින් උපයන ආදායම් හා සේවා සැපයුම්.
ඉ) විදේශ රැකියා නියෝජිත ආයතනවල කටයුතු.
ඊ) වත්කම් උපයෝජනය.

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ 2014 දෙසැම්බර් 31 දිනෙන්අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කාර්යාංශයේ නිරීක්ෂණ.**

| විගණකාධිපති වාර්තාව | කාර්යාංශයේ නිරීක්ෂණ |
|---|---|
| **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**<br>---------------------------------------------<br>**2. මූල්‍ය ප්‍රකාශන**<br>------------------<br>**2.1 තත්ත්වාගණනය කළ මතය**<br>------------------------------<br>**2.1.1 සමූහයේ මතය**<br>-------------------<br>මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.<br><br>**2.1.2 කාර්යාංශයේ මතය**<br>---------------------<br>මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ. | |

| | |
|---|---|
| **2. 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සමූහය**<br><br>1996 අප්‍රේල් 18 දිනැති සංදේශය අනුව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 96/1019/107/028 මඟින් 1996 ඔක්තෝබර් 06 දින අනුදත් ප්‍රාග්ධනය වූ රු.මිලියන 100 ක් සහිතව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති නියෝජිත (පෞද්ගලික) සමාගම, සංස්ථාපනය කර තිබූ අතරනිකුත් කළ කොටස් ප්‍රාග්ධනය වූ රු.5,000,040 න් රු.මිලියන 5 ක් කාර්යාංශයේ ආයෝජනයක් වශයෙන් ලබාගෙන තිබුණි.<br><br>මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කෙරේ. | |
| අ) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි 15(ඉ) වගන්තිය ප්‍රකාරව කාර්යාංශයට ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකිකයින් බඳවා ගැනීමට බලය ලැබී තිබුණු අතර කාර්යාංශයට අනුබද්ධිතව පිහිටුවා තිබූ පරිපාලිත සමාගම මඟින් එහි සාංගමික ව්‍යවස්ථාවලියෙන් උක්ත අරමුණ ඉටුකිරීම සඳහාම සමාගමක් පිහිටුවා තිබුණි. එලෙස එකම අරමුණ උදෙසා කාර්යංශයට අමතරව සමාගමක් පිහිටුවීමේ අවශ්‍යතාවය විගණනයට ගැටළු සහගත වේ. | අංක අමප/96/1019/107/028 දරණ කැබිනට් පත්‍රිකාව මඟින් 1996.06.10 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති (පුද්ගලික) සමාගම එන්වී 22504/මිශ්‍ර/96/5 මඟින් සමාගම් රෙජිස්ටාර් යටතේ ලියාපදිංචියට යටත්ව සංස්ථාපනය වී ඇත්තේ පවතින සහ පැවති නෛතික ප්‍රතිපාදනයන්ට අනුකූලවයි. |
| ආ) එම පරිපාලිත සමාගමෙන් 2009 වර්ෂයට පසු කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණු අතර 2014 දෙසැම්බර් 31 දිනට රු.3,510,033 ක ලාභාංශයක් ලැබිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ලාභාංශයක් ප්‍රකාශයට පත්කර නොතිබුණි. | මෙය කාර්යාංශය වෙත නොගෙවා පරිපාලිත සමාගමේ සංවර්ධනය වෙනුවෙන් යොදා ගැනීමට 2016 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. |

| | |
|---|---|
| ඇ) රක්ෂණය කිරීමේ පළපුරුද්දක් නොමැතිව තිබියදී පරිපාලිත සමාගම වෙත විගමනිකයන් රක්ෂණය කිරීමේ කටයුතුවල නියෝජිත ආයතනය ලෙස කටයුතු කිරීමට ඉඩසලසා තිබුණි. | මේ ආකාරයට කටයුතු කිරීම 2015 මාර්තු සිට නතරකර ඇති අතර වර්තමානයේ කාර්යාංශය විසින් විගමනික සේවකයින් රක්ෂණය කිරීමේ කටයුතු සිදුකරනු ලැබේ. |
| ඈ) කාර්යාංශය විසින් 2012 වර්ෂයේදී රු.මිලියන 20 ක ණය මුදලක් සමාගම වෙත ලබා දී තිබුණු අතර කාර්යාංශය විසින් රැස්කර සමාගම වෙත ගෙවනු ලබන රක්ෂණ වාරික මුදලින් එම ණය මුදල් පියවා ගැනීම සිදුකර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී දේශීය ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු හිඟ බදු මුදල් ගෙවීම සඳහා තවත් අතිරේක ණය මුදලක් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමකට අනුව 2014 අගෝස්තු 19 දින රු.මිලියන 20 ක ණය මුදලක් සමාගම වෙත කාර්යාංශය විසින් ගෙවා තිබුණි. | මෙම හිඟ බදු මුදල් නියමිත දිනයේදී නොගෙවුවහොත් විශාල දඩ මුදලක් එම සමාගමට ගෙවීමට සිදු වන බවට දැනුම් දී තිබූ නිසා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ඉල්ලීම මත අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය සහිතව රුපියල් මිලියන 20ක දෙවන ණය මුදලක් අදාළ හිඟ බදු මුදල් ගෙවා නිරවුල් කිරීම සඳහා පරිපාලිත සමාගම වෙත ගෙවන ලද අතර ඒ සඳහා 5% බැගින් වාර්ෂික පොලියක් කාර්යාංශය විසින් අයකරනු ලැබේ. වර්තමානයේ මෙම ණය මුදල අදාල පොලිය සමග වාරික 36 කින් ගෙවා නිම කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන අයකර ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතී. |
| **2.2.1. සම්බන්ධිත පාර්ශවයන් සමග ඇති ගනුදෙනු හෙළිදරව් නොකිරීම** | |
| ගෘහස්ථ නොවන සේවාවන්ට විදේශගත වන ශ්‍රමිකයින් සඳහා අවශ්‍යවන වෛද්‍ය වාර්තා ලබා ගැනීමට ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය විසින් වෛද්‍ය මධ්‍යස්ථානයක් සමග ගිවිසුමකට එළඹ,එය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිල්ල,ගෘහ භාණ්ඩ ඇතුළු අනෙකුත් මූලික යටිතල පහසුකම් සපයා දෙනු ලබන අතර අදාළ වෛද්‍ය මධ්‍යස්ථානයේ සම්පූර්ණ දළ ආදායමෙන් සියයට 30ක මුදලක් ඒජන්සිය වෙත ලබා දෙනු ලැබේ. යථෝක්ත ගනුදෙනුව සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 ප්‍රකාරව හෙළිදරව් කර නොතිබුණි. | මීට අදාල හෙළිදරව් කිරීම 2015 මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. |

| | |
|---|---|
| **2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - කාර්යාංශය** | |
| ------------------------------------------------------------ | |
| **2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති** | |
| ---------------------------------- | |
| පහත කරුණු නිරීක්ෂණය කෙරේ. | |
| අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 | |
| ---------------------------------- | |
| මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කළයුතු මූලික තොරතුරු හා අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පිළිබඳ ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි. | මෙය නිවැරදි කරමින් 2016 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ආකෘතියද සංශෝධනය කිරීමට කටයුතු කර ඇත. |
| ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 | |
| ---------------------------------- | |
| අදාළ ආකෘතිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| i. පෙර වර්ෂයේ ගැලපීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපීමේදී රු.36,609 ක් වැඩියෙන් සටහන් කර තිබුණි. | 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණ වල අදාල ගැලපුම් සිදු කර ඇත. |
| ii. කාරක ප්‍රාග්ධන සංචලනයන් ගැලපීමේ දී රු.36,735,785 ක දිගුකාලින සේවක ණය අදාළ කර ගෙන තිබුණි. | 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණ වල අදාල ගැලපුම් සිදු කර ඇත. |

| | |
|---|---|
| iii. සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව පාරිතෝෂික ගෙවීම රු.9,711,794 ක් වුවත්, ලෙජරය අනුව රු.9,168,874 ක් මුදලින් ගෙවා තිබුණි. ඒ අනුව මූල්‍ය කටයුතු වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.542,920 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණ වල අදාල ගැලපුම් සිදු කර ඇත. |
| ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08<br>-----------------------------------<br>ඉකුත් වර්ෂවලට අදාළ වැරදි නිවැරදි කිරීම් අතීතානුයෝගීව ගලපා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ප්‍රතිස්ථාපනය කිරීමට කටයුතු නොකර රු.71,586,550 ක වැරදි නිවැරදි කිරීම් ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ගලපා තිබුණි. | 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණ වල අදාල ගැලපුම් සිදු කර ඇත. |
| ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12<br>-----------------------------------<br>විලම්භිත බදුහා ආදායම් බදු සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. | 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණ වල අදාල ගැලපුම් සිදු කිරීමට බලාපොරොත්තු වෙමි. |
| ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16<br>-----------------------------------<br>යම් වත්කමක අපේක්ෂිත තත්වය පූර්ව ඇස්තමේන්තුවලට සාපේක්ෂව වෙනස් වන්නේ නම් වත්කමක අවශේෂ වටිනාකම, ප්‍රයෝජනවත් ජීවිත කාලය, ක්ෂය කිරීමේ ක්‍රමය අවම වශයෙන් සෑම මුදල් වර්ෂයක් අවසානයේම සමාලෝචනය කළ යුතු වුවත් පිරිවැය රු.2,029,472,463 ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ක්‍රියා කරමින් පවතින අතර 2016 වර්ෂයේදී අදාළ ප්‍රමිතියට අනුකූල වන ආකාරයට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමි. |

| | |
|---|---|
| ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19<br>----------------------------------<br>සමාලෝචිත වර්ෂය තුළ ආයුගණක තක්සේරුව මත ලාභය ගණනය කිරීමේ දී (Gain on activation) පාරිතෝෂික සඳහා ගෙවීම රු.9,711,794 ක් සැලකිල්ලට ගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19ට අනුකූලව Projected Unit Credit Method ක්‍රමයට අනුකූලව පාරිතෝෂික සඳහා වෙන් කිරීම් ගණනය කර ඇති අතර සංශෝධිතමූල්‍ය ප්‍රකාශයන්හි මෙම ගෙවීම සැලකිල්ලට ගෙන ඇත. |
| උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20<br>----------------------------------<br>2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයෙහි විලම්භිත විදේශාධාර හා ප්‍රදාන යටතේ දක්වා තිබූ රු.777,591 ක ප්‍රදානයේ ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳ අවශ්‍ය ගැලපීම් සිදු කර නොතිබුණි. | විලම්භිත විදේශීය ආධාර හා ප්‍රදාන යටතේ දක්වා ඇත්තේ විවධ ජාත්‍යන්තර සංවිධාන හා දේශීය සංවිධාන මඟින් ලබා දී ඇති ක්ෂයවීම් සිදු කරනු ලබන වත්කම්වල අගය වන අතර මේ පිළිබඳ අදාල ගැලපුම් 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණවල  වල සිදු කර ඇත. |
| ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 36<br>----------------------------------------<br>නිශ්චිත කාලයකට වරක් වත්කම්වල හානිකරණ තත්වයක් පෙන්වයි නම් එම වත්කම්වල පොත්වල අගය හා වෙළඳපල අගය සංසන්දනය කර පොත්වල අගය වෙළඳපල අගයට වඩා අඩුනම් එම වෙනස් ප්‍රමාණය කපා හැරීම සිදුකල යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. | 2016 දී මේ පිළිබඳව විශ්ලේෂණයක් කර මූල්‍ය ප්‍රකාශණවල ආදල ගැලපුම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38<br>-----------------------------------<br>අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය වන  ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | මෙම වත්කම සංශෝධිතමූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අස්පෂ්‍ය වත්කමක් ලෙස දක්වා ඇත. |

| | |
|---|---|
| ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39<br>-----------------------------------<br>ආයෝජනවල අගයන් ක්‍රමක්ෂය කරන ලද අගයට මූල්‍ය ප්‍රකාශනවල පෙන්විය යුතු වුවත්, රු.8,559,105,769 ක් වූ ආයෝජන සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණ වල අදාල ගැලපුම් සිදු කිරීමට බලාපොරොත්තු වෙමි. |
| **2.3.2 ගිණුම්කරණ අඩුපාඩු**<br>-------------------------<br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| ආ) සමාලෝචිත වර්ෂයට අදාළව ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.3,899,535 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණවල අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කර ඇත. |
| ආ) අබුඩාබි තානාපති කාර්යාලයේ කම්කරු සුභසාධන අංශයේ සිදු වී ඇති එමිරේට්ස් ඩිරාම්29,295 ක් වූ (ආසන්න ලෙස රු.1,058,276) මුදල් වංචාව සම්බන්ධයෙන් කළ යුතු ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි. | මෙම මුදල් වංචාව පිළිබඳව ගිණුම් සඳහා සටහන් 2014 සංශෝධිත මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇත. 2015 වර්ෂයේදී අදාල ගැලපුම් සිදුකිරීමට කටයුතු කර ඇත. |
| **2.3.3 නොසැසඳු පාලන ගිණුම්**<br>----------------------------<br>මූල්‍ය ප්‍රකාශන හා ඒ සමඟ ඉදිරිපත් කළ උපලේඛන අනුව වත්කම් ගිණුම් 05 ක හා වගකීම් ගිණුම් 02 ක පිළිවෙලින් රු.8,108,532 ක් හා රු.2,534,377 ක නොසැසඳීම් නිරීක්ෂණය වූ අතර ඒවා හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ සඳහා අවශ්‍ය සැසඳුම් පිළියෙල කිරීමට වරලත් ගණකාධිකාරී ආයතනයක සහාය ලබාගෙන ඇත.ඔවුන් විසින් ඉදිරිපත් කරන නිර්දේශ අනුව අවශ්‍ය ගැලපුම් 2016 වසරේදී නිම කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| **2.3.4** | **පැහැදිලි නොකළ වෙනස්කම්**<br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| අ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ගෙවිය යුතු කුවේට් වන්දි අරමුදල් වටිනාකම රු.2,975,504,815 ක් වුවද එහි වත්කම්වල වටිනාකම රු.2,829,570,793 ක් විය. එම අරමුදල හා වත්කම අතර රු.145,934,022 ක වෙනසක් නිරීක්ෂණය විය | වෙනසට හේතු වී ඇත්තේ අදාල පොලී ආදායම් ලැබීමේදී එම මුදලටම සමානව වත්කම්වල ආයෝජනයන් සිදුකර නොමැති වීමයි. නමුත් කාර්යාංශය සතුව මෙම මුදල් වෙනත් ආයෝජනයන්හි යොදවා ඇති බව තහවුරු වේ. |
| ආ) | විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල පිහිටුවා ඇති කම්කරු සුභසාධන අංශවලට අදාළ මුදල් ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.81,987,794 ක් වුවද ධූතමණ්ඩල විසින් සහතික කල මුදල් පොත්වලට අනුව ශේෂය රු.84,728,193 ක් විය. මෙම වෙනස ජර්නල් සටහන් පිටපත් කිරීමේදී සිදුවී තිබුණද එම වැරදි නිවැරදි කිරීමේ කටයුතු කර නොතිබුණි. | විනිමය හුවමාරුව හේතුවෙන් මෙම වෙනස ඇති වී ඇත. 2015 වර්ෂයේදී අදාල ගැලපුම් සිදුකිරීමට කටයුතු කර ඇත. |
| **2.3.5** | **විගණනය සඳහා සාක්ෂි නොවීම්.**<br>වටිනාකම රු.150,219,284 ක් වූ ශේෂ 06 ක් පරීක්ෂා කිරීම සඳහා උපලේඛණ හා තහවුරු කිරීම් ලේඛණ විගණනයට ඉදිරිපත් නොවිය. | මේ සඳහා අවශ්‍ය සැසඳුම් පිළියෙල කිරීමට වරලත් ගණකාධිකාරී ආයතනයක සහාය ලබාගෙන ඇත.ඔවුන් විසින් ඉදිරිපත් කරන නිර්දේශ අනුව අවශ්‍ය ගැලපුම් 2016වසරේදී නිම කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| 2.4 | **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**<br>------------------------------------<br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| ඇ) | 2003 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විදේශ දූත මණ්ඩල සුභසාධන අංශ විසින් අයකර මහාභාණ්ඩාගාරය හරහා කාර්යාංශයට ප්‍රේෂණ කරනු ලැබූ කම්කරු කොන්ත්‍රාත් ගිවිසුම් ගාස්තු වලින් රු.1,185,548,646 ක මුදලක් තවදුරටත් මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතුව තිබුණි. | මෙම මුදල් අයකර ගැනීම සඳහා කාර්යාංශය භාණ්ඩාගාරය වෙතින් නිරන්තරව ඉල්ලීම් කර ඇත.එහෙත් මෙම මුදල් නිදහස් කිරීම සඳහා භාණ්ඩාගාරය වාර්ෂිකව වෙන් කරනු ලැබූ මුදල රුපියල් මිලියන 175 ක් පමණි.2015.12.31 ට ලැබිය යුතු මුදල රු.1,010,548,646.කි. |
| ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 02 ඉක්ම වූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු රු. 583,680 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් පිළිබඳව තැන්පත්කරුවන් දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ගගැනීමට පියවර ගනු ලැබේ. |
| ඇ) | විදේශ රැකියා නියෝජිත ආයතන 144 කින් සමාලෝචිත වර්ෂය අවසානයට අයකර ගත යුතුව පැවති රු.368,750 ක මුදලක් 2015 ජූනි වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් අයකරගනු ලබන්නේ රැකියා නියෝජිතායතනය මඟින් ඉදිරිපත් කරනු ලබන 70% ඒජන්සි භාගය ආපසු ගෙවන විටයි. ආපසු ගෙවීම් මත සෙස් බදු මුදල් කාර්යාංශය වෙත අය කර ගැනීම සිදු කරනු ලබන අතර 2015.12.31 දිනට රු.328,750ක මුදලින් රු.50,250 ක වටිනාකමක් අයකරගෙන ඇත. එම වටිනාකමින් එසේ තවදුරටත් අයවීමට ඇති වටිනාකම රු.278,500කි. |
| ඈ) | විදේශ රැකියා නියෝජිත ආයතන විසින් ලියාපදිංචිය සඳහා අයදුම් කිරීමට 2008 - 2013 කාල පරිච්ඡේදයේදී ලබා දී තිබු රු.4,930,000 ක් වූ බලපත්‍ර ගාස්තු ආපසු ගෙවීමට කටයුතු නොකර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් ආදායමට ගෙන තිබුණි. | ගිණුම්කරණයේ පැවති දූර්වලතාවයන් නිසා විදේශ රැකියා නියෝජිතායතන විසින් ලියාපදිංචිය අයදුම් කිරීම සඳහා ගෙවන ලද රු.2,320,000/- ක මුදලක් ආදායමට මාරු කර නොමැත.අදාල සටහන මගින් කර ඇත්තේ එය ආදායමට ගැනීමය.තවද එකී මුදල ආපසු නොගෙවනු ලබන ගාස්තුවකි. |

| | | |
|---|---|---|
| ඉ) | ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය විසින් 2006 ජුනි සිට 2007 ජනවාරි දක්වා කොරියානු විගමණිකයින් වෙත ආපසු ගෙවිය යුතු රු.18,350,000 ක් වූ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට ලැබී ඇති සියලුම ඉල්ලීම් සඳහා ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය විසින් අදාල මාසය තුලදීම ගෙවීම් සිදුකරනු ලබයි.මේ වන තෙක් ඉල්ලුම් කර නොමැති විගමණිකයින් ඉල්ලුම්කර නොමැත්තේ ඔවුන් තවම ලංකාවට නොපැමිණීම නිසා හෝ අනවසරයෙන් කොරියාව තුළ රැඳී සිටින නිසා විය හැකි බවට අනුමාන කෙරේ. මේ වනවිට ප්‍රමාදයකින් තොරව අදාල මුදල් ගෙවීම් සඳහා කටයුතු කර ඇත. |
| ඊ) | ඒකාබද්ධ ශේෂ පත්‍රයට අනුව කාර්යාංශයට ලැබියයුතු රු.1,210,968 තැන්පතු සම්බන්ධව කිසිදු පසුවිපරමක් කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අය කිරීමේ කටයුතු සිදුකර ගැනීම සඳහා අදාල ආයතන සමග කටයුතු කරනු ලැබේ. |
| උ) | සමාලෝචිත වර්ෂය අවසානයට වසර 6 ක කාලයක් තිස්සේ විගමණිකයින්ගේ පැමිණිලි / ආරවුල් සමතයකට පත්කර ගැනීම සඳහා නියෝජිත ආයතන විසින් එකතුව රු.19,886,101 ක් තැන්පත් කර තිබූ අතර, එම ශේෂයන් නිරවුල් කිරීමට 2015 ජුනි වන විටත් කටයුතු කර නොතිබුණි. | 2015.12.31 දිනට අදාල මුදලින් රු.6,564,979/- ශේෂයක් ගෙවීමට ඇති අතර,මේ සඳහා අවශ්‍ය මූලාශ්‍ර ලියකියවිලි වල අසම්පූර්ණවීම හේතුවෙන් ගෙවීම් ප්‍රමාදවීම සිදුව ඇත. |
| ඌ) | 2009 සිට 2013 දක්වා රක්ෂණ වන්දි ලෙස රක්ෂණ ආයතනයෙන් ලද මුදලින් රු.3,455,474/- ක මුදලක් අදාළ විගමණිකයින්ට ගෙවීමට කාර්යාංශය විසින් පියවර ගෙන නොතිබුණි. | 2015.12.31 දිනට අදාල මුදලින් රු.1,001,735/- ශේෂයක් ගෙවීමට ඇති අතර,මේ සඳහා අවශ්‍ය මූලාශ්‍ර ලියකියවිලි වල අසම්පූර්ණවීම හේතුවෙන් ගෙවීම් ප්‍රමාදවීම සිදුව ඇත. |

**2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | |
|---|---|---|---|
| අ) | 1985 අංක 21 දරන විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත 15 වන වගන්තිය | අරමුණුගත නොවූ ව්‍යාපෘතියක් වෙනුවෙන් 2013 හා සමාලෝචිත වර්ෂවල රු.134,484,433 ක් වැය කර තිබුණි. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 14.1 වගන්තිය අනුව කාර්යාංශයෙන් ඉටුවිය යුතු කරුණු පිළිබඳව අමාත්‍යවරයා විසින් කාර්යාංශය වෙත ලිඛිත විධාන දෙනු ලැබිය හැකි අතර කාර්යාංශය විසින් එම විධාන ක්‍රියාවේ යෙදිය යුතුය.<br>මේ අනුව රටවිරු ටැලන්ට්ස්ටාර් වැඩසටහන සම්බන්ධයෙන් එවකට අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි කාර්යාංශ අධ්‍යක්ෂක මණ්ඩලය දැනුවත් කර අවසරය ඇතුව ක්‍රියාත්මක කරන ලදී. වර්තමානයේ මෙම කාර්යය ක්‍රියාවේ යෙදවීම අත්හැර ඇත. |
| ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | i. මුදල් රෙගුලාසි 371(2) | තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කටයුත්ත නිමකල වහාම පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට රු.3,698,704 ක නිරවුල් නොවූ ශේෂයක් පැවති අතර එම ප්‍රමාණයෙන් රු.1,999,500 ක් 2015 පෙබරවාරි 28 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය මගින් පරීක්ෂණයක් සිදුරකමින් පවතී. එමගින් ලැබෙන වාර්තාවේ නිර්දේශයන් මත ඉදිරියේදී ක්‍රියා කරනු ඇත. |

| | |
|---|---|
| ii. මුදල් රෙගුලාසි 395(ඈ) — කාර්යාංශයේ හා විදේශ තානාපති කාර්යාලවල කම්කරු සුභසාධන අංශවල පවත්වා ගෙන යනු ලබන බැංකු සැසඳුම් ප්‍රකාශයන් ඊළඟ මාසයේ 15 දිනට පෙර පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. | වර්තමානයේදී තානාපති කාර්යාලවල බැංකු සැසඳුම් ඊලග මස 15 දිනට ප්‍රථමව පිලියෙල කර **e-mail** මගින් යොමු කරනු ලබයි. මෙය ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ඇත. |
| iii. මුදල් රෙගුලාසි 757<br>**i.** විදේශ තානාපති කාර්යාලවල පවත්වා ගෙන යනු ලබන කාර්යාංශයේ කම්කරු සුභසාධන අංශ 12 ක හා කාර්යාංශයේ පුහුණු මධ්‍යස්ථාන සහ පළාත් කාර්යාලවල සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2015 වර්ෂයේ සියළුම භෞතික සමීක්ෂණ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | | ii. පුහුණු මධ්‍යස්ථානවල තිබූ පාවිච්චියට ගත නොහැකි ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ඒකක 521 ක් අපහරණය කිරීමට විගණන දිනය වූ 2015 මාර්තු 31 දින වන විටද කටයුතු කර නොතිබුණි. | කාර්යාංශ අපහරණ කමිටුව නිර්දේශිත භාණ්ඩ අපහරණය 2015 වසරේ වරින් වර සිදුකර ඇත. |
| ඇ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.11 ඡේදය | සමාලෝචිත වර්ෂයේ දී වාහන 51 ක් කාර්යාංශයේ ධාවනය සඳහා යොදාගෙන තිබුණද මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | මේ වන විට ඉන්ධන දහනය පරීක්ෂා කිරීම සඳහා ලංකා ඔටෝමොබයිල් ඇසෝසියේෂන් වෙතින් විමසීම් කරන ලදුව එම ආයතනය විසින් දන්වා ඇත්තේ එලෙස දහනය පරීක්ෂා කිරීම ඔවුන් විසින් සිදු නොකරන බවයි.වෙනත් ආයතනයක් මගින් ඉහත පරීක්ෂාව සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| ඈ) | 1999 පෙබරවාරි 26 දිනැති අංක 02/99 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 ඡේදය | රේඛීය අමාත්‍යාංශයේ ලේකම් නිර්දේශ කිරීමකින් තොරව 2013, 2014 හා 2015 පෙබරවාරි දක්වා කාර්යාංශයේ නිලධාරීන් සඳහා රු.854,611 ක ජංගම දුරකථන 101 ක් මිලදී ගෙන තිබුණි. | වර්තමානයේ කාර්යාංශ නිලධාරීන් සඳහා ජංගම දුරකථන ලබා දීම නතර කර ඇත. |

| | | |
|---|---|---|
| ඉ) 2003 ජුනි 02 දිනැති අංක පිඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ<br>9.3.1 (viii) ඡේදය | කළමනාකරණ තනතුරක ඇතිවන පුරප්පාඩු පිරවීම අනුප්‍රාප්තික සැලැස්මකට අනුව කළයුතු නමුත් කාර්යාංශයට එවැනි සැලැස්මක් නොමැතිවීම හේතුවෙන්, පුරප්පාඩු වන තනතුරු සඳහා ස්ථිර නිලධාරින් පත්කිරීමට නොහැකි වී තිබුණි. | 2015.11.26 සංශෝධිත නව බඳවාගැනීම් පටිපාටිය සඳහා අනුමැතිය ලැබී ඇති බැවින් ඒ අනුව මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරුවල පවත්නා පුරප්පාඩු පිරවීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.ඉදිරියේදී අනුප්‍රාප්තික සැලැස්මක් පිලියෙල කිරීමටද කටයුතු කරනු ඇත. |
| 8.3.9 ඡේදය | රාජ්‍ය ව්‍යාපාර විසින් රේඛීය අමාත්‍යාංශයේ හෝ අනෙකුත් රාජ්‍ය ආයතනවල වියදම් නොදැරිය යුතු බවට උපදෙස් දී තිබියදී අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරින් 04 දෙනෙකුගේ රු.88,790 ක ජංගම දූරකථන ගාස්තු නිරවුල් කර තිබුණි. | විගමණික ශ්‍රමිකයන්ගේ සුභසාධන කටයුතු වෙනුවෙන් සිදු කළ ව්‍යාපෘති වල යෙදීම සඳහා මෙම රියදුරන් අමාත්‍යාංශ හා වෙනත් ආයතනවලට නිදහස් කර තිබූ අතර, අවශ්‍යතාවය මත ඔවුන්ගේ ජංගම දූරකථන බිල්පත් රු.500.00ක් දක්වා පමණක් මාසිකව කාර්යාංශය දරා ඇති අතර, ඉතිරිය එය ඉක්මවන ප්‍රමාණය ඔවුන්ගේ වැටුපෙන් අයකරගෙන ඇත.වර්තමානයේදී දූරකථන ගාස්තු ප්‍රතිපූර්ණය නොකරේ. |

| | | | |
|---|---|---|---|
| ඊ) | 2011 පෙබරවාරි 11දිනැති අංක පිඊඩී/57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 06 ඡේදයේ (iii) උප වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව කාර්යාංශය විසින් සංගීත වැඩමුළුවක් සඳහා රු.1,000,000 ක මුදලක් අනුග්‍රාහකත්වයක් ලෙස ගෙවා තිබුණු අතර විද්‍යාලයක ආදි ශිෂ්‍ය සංගමය වෙත රු.1,000,000 ක් පරිත්‍යාග කර තිබුණි. | දැන්වීම් සහ ප්‍රචාරණ වියදම් සඳහා කාර්යාංශයේ මුල්‍ය කළමණාකරණයට අනුව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සභාපතිතුමා වෙත පවරා ඇති අධිකාර බලය යටතේ මෙම ගෙවීම් සිදුකර ඇත. මෙම ගෙවීම සිදුකර ඇත්තේ පාසල් සංවර්ධනය සඳහා වන ව්‍යාපෘතියකටයි. |
| උ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය5.4.12 ඡේදය | වැට් බදු ආවරණය කිරීම සඳහා මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 වන දින හෝ ඊට පෙර එකී ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | වැට්බදු ගෙවීම් පිළිබඳ වාර්තා කාර්තුමය වශයෙන් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත යැවීමට පියවර ගෙන ඇති අතර සිදු කරන ගෙවීම් පිළිබඳ වාර්තා විගණකාධිපතිවරයා වෙත යැවීමට අවශ්‍ය පියවර ගෙන ඇත. |

| | | |
|---|---|---|
| ඌ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොත අංක 19 | අළුත්වැඩියා වියදම් රු.200,000 ට වැඩි නම් ඒ සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවදසමාලෝචිත වර්ෂයට අදාළව අවස්ථා 06 කදී රු.1,536,646 ක අළුත්වැඩියා සඳහා අදාළ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | කාර්යාංශයේ මුල්‍ය කළමණාකරණයට අනුව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සභාපතිතුමාට පවරන ලද බලතල වලට අනුව මූල්‍යමය අනුමැතියට යටත්ව සිදුකර ඇත.වර්තමානයේදී අදාල වියදම් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අනුමැතියට යටත්ව සිදුකරනු ලැබේ. |
| එ) 2010 සැප්තැම්බර් 01 දිනැති අංක පීෆ්/එෆ්ඒ/05(viii) දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛයේ 3.3 ඡේදය | අන්තර්ජාල පහසුකම් ලබාගැනීමට අවශ්‍ය උපකරණ හා උපාංග මිලදී ගැනීමේ පිරිවැය නිලධාරීන් විසින් පෞද්ගලිකව දැරිය යුතු වුවද කාර්යාංශයේ නිලධාරීන් 66 දෙනෙකු සඳහා ඩොංගල් කාර්යාංශයේ මුදලින් මිලදී ගෙන තිබුණි. | කාර්යාංශයේ කටයුතු නව තාක්ෂණය ආශ්‍රිතව වඩාත් ඵලදායී ලෙසත් කාර්යක්ෂම ලෙසත් ඉටු කිරීමේ අරමුණ ඇතිව අදාළ නිලධාරීන් වෙත මෙම උපකරණ සපයා ඇත. කාර්යාංශ නිලධාරීන් සඳහා ඩොංගල් ලබාදීම 2015.09.09 වන දින සිට නතර කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | 2.3.2 (ii) ඡේදය | රජයේ වියදමින් බිල්පත් නිරවුල් කරනු ලබන ජංගම දුරකථනවල අංක, ආයතනයේ අභ්‍යන්තර දුරකථන නාමාවලියට ඇතුළත් කළයුතු වන බවට උපදෙස් දී තිබුණද, කාර්යාංශයේ මාණ්ඩලික නිලධාරින්ගේ ජංගම දුරකථන අංක පමණක් දුරකථන නාමාවලියට ඇතුළත් කර තිබුණි. | කාර්යාංශයේ අභ්‍යන්තර දුරකථන නාමාවලියට දුරකථන අංක ඇතුලත් කිරීමේදී ඒ ඒ අංශ වල සෘජු දුරකථන අංක හා ෆැක්ස් අංකයන් ද කළමණාකරු, සහකාර කළමණාකරුවන්ගේ ජංගම දුරකථන අංකයන් සහ තාක්ෂණික හා විශේෂ රාජකාරීන්ට අදාල නිළධාරින්ගේද නම් ඇතුලත් කර ඇත. මීට අමතරව කාර්යාංශයේ අභ්‍යන්තර වෙබ් අඩවියේ කාර්යාංශය විසින් ජංගම දුරකථන ලබා දී ඇති සියලුම රියදුරු මහතුන්ගේ ජංගම දුරකථන අංක ඇතුලත් කිරීමට කටයුතු කර ඇත.<br><br>කාර්යාංශයේ අභ්‍යන්තර දුරකථන නාමාවලිය සකස් කිරීමේදී මෙසේ සීමා සහිතව අංක ඇතුලත් කිරීමට හේතු වූයේ මුද්‍රණ වියදම් අවම කර ගැනීමටය. |
| ඒ) | අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 04/0427/020/002 හා 2004 මැයි මස 12 වැනි දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ | නියැදි පරීක්ෂණයට අනුව සමාලෝචිත වර්ෂය තුළ ප්‍රචාරණය හා ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව රු.30,909,020 ක මුදලක් රාජ්‍ය නොවන මාධ්‍ය ආයතන වෙත ගෙවා තිබුණි. | කාර්යාංශයට අදාල තොරතුරු මැද පෙරදිග ඇතුළු විදේශ රටවල ප්‍රචාරණය සඳහා සැටලයිට් තාක්ෂණය හරහා විකාශනය වන නාලිකාවක් භාවිත කරන ලදී.<br>එසේම කාර්යාංශයේ දැන්වීම් රජයේ නාලිකාවන් වන ජාතික රූපවාහිණිය,ස්වාධින රූපවාහිණිය,අයි නාලිකාව, වසන්තම් නාලිකාවෙහි ප්‍රචාරය කළ බව සඳහන් කරමි. ශ්‍රී ලංකාවේ විද්‍යුත් ප්‍රචාරක මාධ්‍ය පද්ධතිය තුළ ඇති සුවිශේෂ ලක්ෂණයක් වන්නේ සෑම නාලිකාවකම නිශ්චිත,ග්‍රාහක, ග්‍රාහක ශ්‍රාවක නරඹන්නන් පිරිසක් සිටින බවයි.අනෙකුත් පෞද්ගලික නාලිකා භාවිතා කර ඇත්තේ එකවර විශාල පිරිසකට කාර්යාංශයේ කාර්යයන් ප්‍රචාරය කිරීමේ අරමුණ පෙරදැරිවයි. |

| | | |
|---|---|---|
| ඔ) 2014 නොවැම්බර් 22 දිනැති අංක පීආර්ඊ/2015/43දරන මැතිවරණ කොමසාරිස්ගේ ලිපිය ඡේද අංක 05 (ii) | i. බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවල 2014 දෙසම්බර් 01 සිට 2015 ජනවාරි 31 දක්වා රටවිරු සංවිධාන බලගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කාර්යාංශ සේවයේ නියුක්ත නිලධාරීන් 116 දෙනෙකු බදුල්ල පළාත් කාර්යාලයට අනුයුක්ත කර කුළී පදනම මත වාහන 10 ක් සපයා තිබූ අතර එම කාලය වෙනුවෙන් නිලධාරීන්ට වැටුප් හා දීමනා ලෙස රු.4,314,111 ක් හා වාහන කුලී ගාස්තු රු.5,125,824 ක් වශයෙන් එකතුව රු.9,439,935 ක් මැතිවරණ කොමසාරිස්ගේ ලිපියට පටහැනිව ගෙවා තිබුණි. | 2014 ජූනි මස සිට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාවට නන්වන ලද ප්‍රජා සත්කාර සේවා වැඩසටහන් වලදී කාර්යාංශයට අයත් විෂයපථයට අදාළව ක්ෂේත්‍ර වැඩසටහන් ක්‍රියාවට නැංවීම සහ කාර්යාංශයේ සමාජ විද්‍යා අංශය මගින් ක්‍රියාත්මක කල ක්ෂේත්‍ර වැඩසටහන් සඳහා අදාල නිලධාරීන් සේවයේ යෙදවීම සහ කුලී රථ භාවිත කර ඇත.<br>අංක154/2014 (M10) දරණ 2014 නොවැම්බර් 18 දිනැති අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව මගින් මේ සඳහා අනුමැතිය ලබාගෙන ඇත. මේ සඳහා අනුමැතිය ලබාගෙන ඇත්තේ මැතිවරණ කොමසාරිස්වරයාගේ PRE/2015/43හා 2014 නොවැම්බර් 22 දිනැති ලිපිය ඉදිරිපත් කිරීමට පෙරදී වූ බැවින් එකි ව්‍යාපෘතීන් ක්‍රියාවට නැංගීමට කටයුතු යොදන ලදි. |

| | | |
|---|---|---|
| | ii. චක්‍රලේඛයට පටහැනිව ජනාධිපතිවරණ කාල සීමාවේදී කාර්යාංශයේ සුබසාධන අංශය විසින් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව අවස්ථා 02 කදී රටවිරුවන් 43 දෙනෙකුගේ නිවාස ණය ඉල්ලුම්පත් කොළඹ දිස්ත්‍රික් සහකාර සමෘද්ධි කොමසාරිස් වෙත ඉදිරිපත් කර තිබුණි. | අදාල වැඩසටහන විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශයත්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයත් ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම සඳහා අංක 01/2013 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය 2013.01.16 වන දින අමාත්‍ය මණ්ඩල වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා 2013.01.24 වන දින අනුමැතිය ලබාදී ඇත.මෙම වැඩසටහන 2013 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරමින් පැවැති අතර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් නිවාස ණය මුදල් ලබා නොදෙන අතර කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශගත වන විගමණික සේවකයින් අතුරින් නිවසක් සදා ගැනීමට අදහස් කරන අයගේ තොරතුරු දිවිනැගුම දෙපාර්තුමේන්තුව වෙත යොමු කිරීම පමණක් සිදුකරන අතර ඉන් අනතුරුව සියළුම කටයුතු සිදුකරනු ලබන්නේ එම ආයතනයෙන් වේ.<br>ජනාධිපතිවරණයක් නිවේදනය කිරීමට ප්‍රථමව ආරම්භ කල වැඩසටහනක් බැවින් හා අප සමාජයේ සුවිශේෂි වූ කාණ්ඩයක් සඳහා මෙයින් සෙත සැලසෙන බැවින් එකී වැඩසටහන් ඉදිරියට පවත්වාගෙන ගිය බව දන්වමි. |
| ඡේදඅංක 07 (i) | චක්‍රලේඛ විධි විධානවලට පටහැනිව ජනාධිපතිවරණය සඳහා නාම යෝජනා කැඳවා ඇති කාල සීමාව තුළ, කාර්යාංශයට නිලධාරීන් 13 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. | මොවුන් කාර්යාංශයේ සේවයට බඳවා ගැනිමට අදාළ සම්මුඛ පරීක්ෂණ 2014 අගෝස්තු හා ඔක්තෝබර් කාල සීමාව අතර සිදු කර ඔවුන්ගේ පත්වීමේ ලිපි සකස් කර අධ්‍යක්ෂ (පරිපාලන) වෙත ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්කිරිමට පෙර ලබා දී ඇත.<br>ඔවුන් සේවයට වාර්තා කිරීම පමණක් දෙසැම්බර් මුල් සතිය තුල සිදුව ඇත. |

| | |
|---|---|
| **2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**<br>---------------------------------------------------------------<br>ජපානයේ කම්කරු සුභසාධන අංශයට කම්කරු සුභසාධන නිලධාරි තනතුරක් අනුමත කර නොතිබූ අතර 2012 සිට 2014 දක්වා අනුමත නොවූ තනතුරක් සඳහා එකතුව රු.10,521,835 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | ජපානයේ කම්කරු සුභසාධන නිළධාරියාව පත් කිරීමේ මූලික අරමුණ අදහස වූයේ එරට තුළ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා රැකියා අවස්ථා ප්‍රවර්ධනය කර ගැනීමයි. ඒ සඳහා අනුමත සේවක සංඛ්‍යාව තුල ප්‍රතිපාදන නොමැතිව වුවත් නිලධාරියකු අනුයුක්ත කරන ලද්දේ කාර්යාංශයේ අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ඇතිවය. මෙම නිලධාරියාගේ සේවා කාලය 2015.04.12 වන දිනෙන් අවසන් කර ඇත. |
| **3. මූල්‍ය සමාලෝචනය**<br>---------------------<br>**3.1. මූල්‍ය ප්‍රතිඵල**<br>---------------<br>සමාලෝචිත වර්ෂයේ කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ බදු පෙර මූල්‍ය ප්‍රතිඵලය රු.459,974,615 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.326,198,141 ක අතිරික්තයක් වුයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසදීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.133,776,474 ක් හෙවත් සියයට 41 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. මෙම වර්ධනයට ආදායමේ වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. | |
| **3.2. කාර්යාංශයට එරෙහිව හෝ කාර්යාංශය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි.**<br>---------------------------------------------------------------------------<br>විදේශ සේවා නියුක්ති කාර්යාංශයට එරෙහිව සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට බාහිර පාර්ශවයන් හා කාර්යාංශ නිලධාරින් විසින් නඩු 15 ක් ගොනු කර තිබූ අතර නඩු 04 ක් සඳහා කාර්යාංශය විසින් බැරකමක් ලෙස හඳුනාගෙන ඇති වටිනාකම රු.1,348,596 කි. ඒ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | සංශෝධිත මූල්‍ය ප්‍රකාශනයන්හි මෙම බැරකම් ගිණුම්වලට සටහනක් ලෙස දක්වා ඇත. |

| | |
|---|---|
| **4. මෙහෙයුම් සමාලෝචනය.**<br>----------------------------<br>**4.1 කාර්යයසාධනය**<br>------------------<br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| අ) කාර්යාංශයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව ව්‍යාපෘති 7 ක මූල්‍ය ප්‍රගතිය සියයට 46 සිට සියයට 94 දක්වා වූ පරාසයක පැවති අතර ව්‍යාපෘති 08 ක් කාර්යාංශය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද ව්‍යාපෘති 05 ක අපේක්ෂිත ඇස්තමේන්තුගත වියදමට වඩා තථ්‍ය වියදමේ වැඩිවීම සියයට 82 ත් සියයට 170 ත් අතර වූ පරාසයක විය. | ආයතනයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කරනු ලබන්නේ පෙර වර්ෂවල පැවති දත්තයන් උපයෝගී කරගෙනයි. මේ නිසා විචලනයන් අපේක්ෂා කල යුතුය. 82% -170% දක්වා විචලනයන් සාධාරණීකරනය කල නොහැක. සමහර ව්‍යාපෘති ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබුනත් ප්‍රායෝගිකව ක්‍රියාවෙහි යෙදවීමේදී පැවති දුෂ්කරතා නිසා ආරම්භකර නොමැත.<br><br>නව ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කිරීමේදී මෙම විචලනයන් මගහරවා ගැනීමට කටයුතු කර ඇත. |

ආ) විදේශීය සුහසාධන අංශයේ සමාලෝචිත වර්ෂයේ වියදම් විශ්ලේෂණය පහත දැක්වේ.

| වියදම් වර්ගය | මුදල<br>රු. | ප්‍රතිශතය |
|---|---|---|
| විදේශීය දූත මණ්ඩලවල සිටින කාර්යාංශයේ කාර්ය මණ්ඩලයේ ඍජු වියදම් | 419,300,801 | 57.63 |
| විගමණිකයන් වෙනුවෙන් දරන ලද ඍජු වියදම | 232,978,562 | 32.02 |
| අනෙකුත් කාර්ය මණ්ඩල සුහසාධන ක්‍රියාකාරකම් | 75,281,190 | 10.35 |
| | 727,560,553 | 100.00 |

සමස්ථ විදේශීය සේවක සුභසාධන අංශය විසින් එහි විගමණික සේවක සුභසාධනය වෙනුවෙන් සියයට 32 ක පමණ අඩු පිරිවැයක් දරා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට නොවිසඳී ඇති පැමිණිලි සංඛ්‍යාව 7,556 ක් ද ආරක්ෂිත නිවාසවල රඳවා ඇති රැඳවියන් සංඛ්‍යාව 431 ක්ද මියගිය සංඛ්‍යාව 315 ක් සහ බන්ධනාගාරගතව, පොලිස් අත්අඩංගුවේ හා රෝහල්ගතව 75 දෙනෙකු සිටින බව නිරීක්ෂණය විය. මෙම හේතුන් නිසා එම විගමනික ප්‍රජාවගේ ගැටළු වෙනුවෙන් කාර්යාංශයේ දායකත්වය ඉතාම අවම තත්වයක පවතින බව නිරීක්ෂණය විය.

විදේශ රටවල සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයින් සඳහා සුභසාධන පහසුකම් සැපයීමේදී ඒ සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් යෙදවීමට සිදු වන අතර ඔවුන් වෙනුවෙන් ගෙවිය යුතු වැටුප් ගමන් වියදම් නිවාස කුලී ආදිය විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ද අනුගමනය කරනු ලබන රෙගුලාසි හා නියමයන්ට අනුකූලව කාර්යාංශයට ගෙවීමට සිදු වේ.

ඒ අනුව එම වියදම් සාධාරණ පදනමක් ඇතිව සිදු කර ඇති බව පැහැදිලි වේ. එමෙන්ම සේවක සුභසාධනය සඳහා වන අනෙකුත් වියදම් ද අවශ්‍යතාවයන්ට අනුකූලව කාර්යාංශය මඟින් සිදු කිරීමට පියවර ගෙන ඇත.

විදේශ දූත මණ්ඩලවල සේවයේ නියුතු කාර්යාංශ නිලධාරීන් සඳහා අදාල වියදම් දරා ඇත්තේ විගමණිකයන්ගේ ගැටළු නිරාකරණය කිරීමට සහ සුභ සාධන කටයුතු ඉටු කිරීමේදීය.එබැවින්, විදේශ සේවක සුභ සාධන අංශය විසින් ඉටු කරනු ලබන සේවාවන් මූල්‍ය පදනමින් පමණක් ඇගයීම් කිරීම ප්‍රායෝගික නොවේ.

| | | |
|---|---|---|
| ඇ) | ජපානයේ කම්කරු සුභසාධන අංශය වෙත සමාලෝචිත වර්ෂයේ රු.6,342,582 ක අග්‍රිමයක් නිකුත් කර තිබුණු අතර ඉන් රු.5,385,002 ක මුදලක් වැයකර තිබුණි. එය කාර්යාංශයේ කාර්යය මණ්ඩලය වෙනුවෙන් රු.5,098,056 ක් හා විගමණික ශ්‍රමිකයන්ගේ සුභසාධනය වෙනුවෙන් රු.286,946 ක් යොදවා තිබුණි. මේ අනුව විගමණික ශ්‍රමික සුභසාධනය වෙනුවෙන් සියයට 4 ත් සියයට 6 ත් අතර ප්‍රමාණයක් වැය කර තිබු අතර 2012 සිට සමාලෝචිත වර්ෂය දක්වා ජපානයට විදේශගත වු ලියාපදිංචි ශ්‍රමිකයන් 337 දෙනෙකු වන අතර පැමිණිලි සංඛ්‍යාව 30 ක් විය. | ජපානයේ තානාපති කාර්යාලයට කම්කරු සුභසාධන නිලධාරියෙක්ව පත් කර ඇත්තේ කාර්යාංශයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ඇතිව ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සඳහා රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම වෙනුවෙනි. නමුත් අදාල නිලධාරියා විසින් ශ්‍රමිකයින්ගේ සුභ සාධන කටයුතුද සිදුකර ඇත.<br>ජපානය වැනි පළවෙනි ලෝකයේ රටක විගමණික ගැටළු අවම මට්ටමක පවතින බැවින් අදාල වියදම් ඉතාම පහළ අගයක් ගෙන ඇත. |
| 4.2 | **කළමනාකරණ අකාර්යක්ෂමතා**<br>--------------------------------<br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ. | |
| අ) | අභ්‍යන්තර විගණන වාර්තාවන්ට අනුව අබුඩාබි හා ලෙබනන් දූත මණ්ඩලවල කම්කරු සුභසාධන අංශවල කටයුතුවල මූල්‍ය පාලනය දුර්වල තත්වයක පවතින බවත් භෞතික වත්කම් උපයෝජනය සහ කාර්යසාධනය ප්‍රමාණාත්මක නොවන බව වාර්තා වී තිබුණි. | කාර්යාංශයේ විදේශීය සේවක සුභසාධන අරමුදලේ කටයුතු සිදු කරනු ගිණුම් කටයුතු පිළිබඳ නිසි පුහුණුවක් ඇති නිලධාරින්ගේ හිඟකම නිසා මෙවැනි ගැටළු ඇති වී තිබෙන අතර, නිසි පළපුරුද්දක් ඇති නිලධාරීන් මෙම අංශයට බඳවා ගැනීමට මේ වන විට පියවර ගෙන ඇති අතර ඉදිරියේදී මෙවැනි ගැටළු ඇති නොවන ආකාරයට රාජකාරී සිදු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. විදේශ තානාපති කාර්යාල විගණනය හා නිලධාරීන්ට එම ගැටළු පිළිබඳව විගණනයේදී වඩාත් සැලකිලිමත් වන ලෙසත් දැනුම් දී ඇත. |
| ආ) | නිලධාරින් 31 දෙනෙකු වෙත ලබා දි තිබු රු. 2,352,771ක ණය මාස 11 සිට මාස 110 දක්වා හිඟ හිටව තිබුණි. | මෙම මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පරිපාලන හා මානව සම්පත් අංශය විසින් කටයුතු සිදුකරමින් පවතී. |

| | |
|---|---|
| ඇ) සමාලෝචිත වර්ෂයේ රු.3,757,661 ක් ආර්ථික සේවා ගාස්තු වශයෙන් ගෙවා තිබුණු අතර එම මුදල වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගෙන ඇතත් එම ගෙවීම ආදායම් බදු ගණනයේදී බදු බැරක් අඩුවීමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. | මෙම ගෙවීම අදාල වර්ෂයේදී බදු බැරක් ලෙස ආදායම් බදු ගණනයේදී අඩුකර ඇත. |
| **4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**<br>---------------------------------<br>පහත සඳහන් කරුණු අනාවරණය විය. | |
| අ) විගමනික ශ්‍රමිකයින් 10 දෙනෙකු සඳහා ගෙවිය යුතු වූ රු. 2,065,000 ක මුදල සඳහා රක්ෂණ වන්දි මුදල් ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය වෙත 2013 වර්ෂයේ ලැබී ඇතත්, කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම මුදල් අදාළ වන්දි හිමියන්ට නිදහස් කිරීමට විධිමත් පියවර ගෙන නොතිබුණි. | මෙම මුදලින් රු.800,000 මේ වන විට ගෙවා ඇත.ගෙවීම් ප්‍රමාදය සිදුව ඇත්තේ ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසාවෙනි. |
| ආ) 1990 වර්ෂයේ දී ඉරාකය විසින් කුවේට් ආක්‍රමණය කිරීමෙන් එහි රැකියාවන්හි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ට සිදු වූ ආපදාවන්ට වන්දි ගෙවීම සඳහා එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසමෙන් ලැබී ඉතිරිවී තිබූ රු.2,975,504,815 ක මුදල අදාළ ශ්‍රමිකයින් වෙත ගෙවා අවසන් කිරීමට විධිමත් වැඩපිළිවෙලක් කාර්යාංශය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. | කාර්යාංශය විසින් අවස්ථා ගණනාවකදීම පුවත්පත් නිවේදන මගින් හා ලිපි මගින් වන්දිලාභීන් දැනුවත් කර ඇත. රැකියා සඳහා යලි විදේශගතවීම , ප්‍රමාණවත් ලිපිලේඛණ ඉදිරිපත් නොකිරීම වැනි කරුණු මත මෙම පුද්ගලයින්ට වන්දි ලබා ගැනීමට නොහැකි වී ඇත.වර්තමානයේ මෙහි ඇති ශේෂය අදාල මුදල ආයෝජනයෙන් ලැබූ පොළී ආදායම වන අතර ආදල වන්දි සඳහා ප්‍රමාණවත් තොරතුරු මත ඉල්ලුම් කරන්නන් හට රු.75,000/- ක මුදලක් වන්දි වශයෙන් ගෙවීම් කරනු ලබයි. |

| | | |
|---|---|---|
| ඇ) | ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 95 ක් වූ සී/ස කහගොල්ල ඉංජිනේරු සේවා සමාගමට අයත් ඉඩමක් 99 අවුරුදු බදු පදනම මත ලබා ගැනීම සඳහා කාර්යාංශය විසින් 2013 වර්ෂයේ රුපියල් මිලියන 20 ක අත්තිකාරමක් සී/ස රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවට ගෙවා තිබුණි. අංක 10/2013 (M-01) හා 2013 ජනවාරි 17 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව රු.මිලියන 20 ක් ගෙවා ගොඩනැගිලිවල හා ඉඩමේ නිරවුල් භුක්තිය භාරගන්නා ලෙස දන්වා තිබුනද ඉඩමේ නිරවුල් භුක්තිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම අත්පත් කර ගැනීම වෙනුවෙන් අවස්ථා කිහිපයකදී විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභ සාධන අමාත්‍යාංශයේ ලේකම් විසින් රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපිගණනාවක් යොමු කර ඇත.මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා නීතිමය උපදෙස් ලබා ගැනීමට කටයුතු සිදුවෙමින් පවතී. |
| ඈ) | විගමනික ශ්‍රමිකයන් සඳහා කාර්යාංශය විසින් පවත්වාගෙන ගොස් තිබූ අර්ථ සාධක අරමුදල් යෝජනා ක්‍රමය වර්තමානයේ අක්‍රීය තත්ත්වයේ පවතින අතර සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කාර්යාංශය විසින් රඳවා ගෙන තිබූ විගමනිකයින් 1620 කට අයත්රු.6,572,054 ක දායක මුදල මුදාහැරීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් වෙනම තැන්පත් ලෙස පවත්වාගෙන යනු ලබන අතර අදාළ ශ්‍රමිකයින් ඉල්ලුම්කරනු ලබන ආකාරයට අනුව නිදහස් කරනු ලැබේ. වාර්ෂිකව පොලී මුදල් එම ශේෂයන් මත බැර කිරිමට ද පියවර ගෙන ඇත. මෙම තැන්පතුකරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් සහ ප්‍රමාණවත් නිවැරදි තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ගෙවීම් ප්‍රමාදය සිදුවී ඇත. |
| **4.4** | **අරමුණට පටහැනි ගෙවීම්**<br>-----------------------------<br>කාර්යාංශය විසින් රටවිරු ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.84,527,351 ක් දරා තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | |

| | | |
|---|---|---|
| අ) | මැතිවරණය පවත්වනු ලැබූ කාල සීමාව වූ අප්‍රේල් හා දෙසැම්බර් මාසවල වියදම් පිළිවෙලින් රු.17,731,248 ක් හා රු.17,148,865 ක් ලෙස සියයට 151.7 කින් හා සියයට 143 කින් වැඩි වී තිබූ අතර මැයි හා නොවැම්බර් මාසවල දී වියදම සාමාන්‍ය වියදමට සාපේක්ෂව සියයට 46 කින් හා සියයට 43 කින් වැඩි වී තිබුණි. මුළු වියදමින් වවුචර් 10 කට අදාළව රු.10,800,750 ක් වූ සියයට 13 ක් ව්‍යාපෘතියට අදාළ නොවන ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් වැය කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් තමා දැනුවත්ව නොසිටි බව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රචාරක හා විදේශ සම්බන්ධතා) විසින් දන්වා තිබුණි. | මෙම වියදම් රටවිරු ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම් වන අතර කාර්යාංශට අදාල වාර්තා අනුව මෙම මාසවල වියදම් වැඩි වී ඇත්තේ රටවිරු පවුල්වල තොරතුරු ජංගම සේවා මගින් ලබාගැනීමට සිදු වූ බැවිනි. |
| ආ) | රටවිරු බක්මහ උළෙල සඳහා පෝස්ටර්, ප්‍රදර්ශණ පුවරු, බැනර් මුද්‍රණය කිරීමට ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව රු.6,014,450 ක ගෙවීම් කර තිබුණු අතර ඉන් රු.1,399,975 ක් වටිනා පෝස්ටර් කාර්යාංශ සභාපතිවරයාගේ අනුමැතිය ලැබීමට ප්‍රථම මුද්‍රණය කර බෙදා හැර තිබුණි. තවද එහි සජීවී රූපවාහිනී විකාශය සඳහා මිල ගණන් කැඳවීමකින් තොරව රු.1,399,975 කට පෞද්ගලික මාධ්‍ය ආයතනයක් තෝරා ගෙන ගෙවීම් කර තිබුණි. | ගරු අමාත්‍යතුමාගේ සහ අධ්‍යක්ෂක (පරිපාලන)ගේ උපදෙස් පරිදි මෙම කාර්යයන් ඉතා ඉක්මනින් සිදුකල යුතුව තිබුනු නිසා ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව කටුයුතු කිරීමට සිදුවිය.නමුත් අප විසින් අදාල ආකාරයේ කටයුතු සිදුකරනු ලබන ආයතන අතුරින් අවම මිල ගණන් යටතේ සේවාව ලබාදෙන ආයතනයක් මේ සඳහා තෝරා ගන්නා ලදී.අදාල උළෙලේ කටයුතු විදේශ රටවල ප්‍රචාරය කිරීම අවශ්‍ය වූ නිසා සැටලයිට් තාක්ෂණයෙන් විකාශනය කරනු ලබන පෞද්ගලික මාධ්‍ය ආයතනයක් මේ සඳහා තෝරා ගන්නා ලදී. |
| ඇ) | මාතර දිස්ත්‍රික් රටවිරු සවිබල ගැන්වීමේ වැඩසටහන සඳහා රු.4,844,000 ක පිරිවැය ඇස්තමේන්තුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණද එම පිරිවැය ඇස්තමේන්තුව තුළ ඇතුළත් නොවූ රු.2,048,850 ක් වූ කුඩ හා ටී ෂර්ට් 1600 ක් මිලදී ගෙන බෙදාහැර තිබූ අතර බෙදාහැරීම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. තවද 2014 අප්‍රේල් 8 දකුණු පළාත් සභා මැතිවරණය පැවති කාලය ආසන්නයේ කුඩ හා ටී ෂර්ට් එම ප්‍රදේශයේ බෙදා හැර තිබූ අතර කාර්යාංශයේ අරමුණුවලට පටහැනි ගෙවීමක් බව විගණනයේ දී නිරීක්ෂණය විය. | සමස්ථ වැඩසටහන සඳහා පිරිවැය ලෙස රුපියල් මිලියන 30 ක මුදලක් අධ්‍යක්ෂක මණ්ඩලය මගින් අනුමත කර ඇත. නමුත් මාතර පැවති මූලික වැඩසටහන සඳහා ඇති ඇස්තමේන්තුවේ කුඩ හා ටීෂර්ට් බෙදා දීම අන්තර්ගතකොට නැත.අදාල වියදම දරා ඇත්තේ රටවිරු සංවිධාන ශක්තිමත් කිරීම, කාර්යාංශය හා ඔවුන් අතර සම්බන්ධතාවය ගොඩනැංවීමේ අරමුණු පෙරදැරිවයි. |

| | | |
|---|---|---|
| **4.5** | මත භේදයට තුඩු දෙන ගනුදෙනු<br>-----------------------------------<br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| අ) | කාර්යාංශයේ සමාලෝචිත වර්ෂයට අදාළ රු.5,301,873 ක වියදම් ගිණුම්ගත කර තිබුණද එම ගනුදෙනු සම්බන්ධයෙන් මතභේදාත්මක තත්වයක් පවතින බැවින් එම ගණුදෙනුවලට අදාළ චෙක්පත් භාරදීම් සිදුකර නොතිබුණි. | මෙම විස්තර මූල්‍ය ප්‍රකාශනවලට සටහන් ලෙස ගිණුම් වල හෙළිදරව් කර ඇති අතර 2015 සහ 2016 වර්ෂව වලදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව ගෙවීම් සිදුකර ඇත. |
| ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.4,667,368 ක් වූ වියදම් මැතිවරණ කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු සීමා කරන ලද කාල පරිච්ඡේදයට අදාළ වූ බැවින් ගෙවීම් කර නොතිබුණි. | 2015 වර්ෂයේ උපචිත වියදම් ලෙස මෙම විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති අතර 2015 සහ 2016 වර්ෂව වලදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව ගෙවීම් සිදුකර ඇත. |
| ඇ) | ලෙබනනයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ කම්කරු සුබසාධන අංශයේ උපදේශකවරයෙකු ලෙස කොන්ත්‍රාත් පදනමට පත්කර තිබූ නිලධාරියෙකු වෙත පත්වීමේ ලිපිය ප්‍රකාරව මාසයකට ප්‍රවාහන දීමනාව ලෙස ඇ.එ.ජ.ඩොලර් 350 ක් හිමි වුවද ඊට අතිරේකව ඇ.එ.ජ.ඩොලර් 2,793.32 ක් කුලී රථ ගාස්තු ප්‍රතිපූර්ණය කර තිබුණි. තවද උක්ත නිලධාරියාට සහ පවුලේ අයට මිල ගණන් කැඳවීමකින් තොරව උපරිම දින 14 ක් හෝටලයක නවාතැන් පහසුකම් සැපයීමට කටයුතු කර තිබුණු අතර එම කාල සීමාවට අමතරව දින 14 ක් හෝටලයේ නවාතැන් ගැනීම හේතුවෙන් ඇමරිකානු ඩොලර් 2,450 ක් වැඩිපුර ගෙවා තිබුණි. 2014 පෙබරවාරි 10 දිනැති හිටපු කම්කරු අංශ ප්‍රධානිගේ ලිපිය ප්‍රකාරව ඇමරිකානු ඩොලර් 1,500 ක මාසික කුලියකට නිවසක් සපයා දීමට එකඟ වී තිබියදී, අමතර දින 14 ක් හෝටලයක නවාතැන් ගෙන තිබුණි. මෙම නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් ඩොලර් 5,050 ක චෙක්පතකින් ගෙවීම්කර තිබුනද හෝටලය මගින් ඉදිරිපත් කර තිබූ රිසිට් පත්‍ර අනුව ලෙබනන් පවුම් වලින් මුදල් ලද බවට සහතික කර තිබුණි. | 2014 මාර්තු මස 07 වන දින අදාල නිලධාරියා විසින් කරන ලද ඉල්ලීමකට අනුව සභාපතිතුමා විසින් සේවක සුභ සාධන අරමුදල් කමිටුව මගින් අනුමැතිය ලබා ගන්නාතුරු අංක OAD/02/02/03/10-11,2014.04.03 දිනැතිලිපිය ප්‍රකාරව 2014 පෙබරවාරිමස 07 වනදිනසිට 2014.03.06 දක්වා ඔහු සහ පවුලේ අයට කම්ෆර්ට් හෝටලයේ නවාතැන් ගැනීමට අවසර ලබා දී ඇත.පසුව එම ඉල්ලීම 2014.02.26 වන දින් පැවති සේවක සුභ සාධන අරමුදල් කමිටුව යොමුකර අනුමැතිය ලබාගෙන ඇති අතර එම කමිටු වාර්තාව 2014 මැයි මස 22 වන පැවති අධක්ෂක මණ්ඩල රැස්වීම් සඳහා යොමු කරන ලදී. ඔහු විසින් කම්ෆර්ට් හෝටලයේ නවාතැන් ගැනීමට හේතුන් ලෙස දක්වා ඇත්තේ ලෙබනනයේ හිටපු උපදේශකතුමා විසින් තෝරාගත් නිවසට යාම සඳහා හිටපු තානාපතිතුමා අවසර ලබා නොදීම නිසා බවයි. අදාල නිලධාරියාට මසකට ප්‍රමාණවත් සංයුක්ත දීමනාව ලෙස ඇමරිකානු ඩොලර් 350ක් හිමිය. ඔහුට දෛනිකව රාජකාරී සඳහා නිවසේ සිට තානාපති කාර්යාලයට යාමත් , තානාපති කාර්යාලයේ සිට නිවසට යාම සඳහා ලෙබනනයේ තිබෙන වාහනය තිබුනත් රියදුරෙකු නොමැති නිසා එය භාවිතා නොකරන නිසා කුලී රථ ප්‍රතිපූර්ණය කිරීමට සිදුවූ ඇත. |

| | | |
|---|---|---|
| **4.6** | **දෘෂ්‍ය අක්‍රමිකතා**<br>-------------------<br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| අ) | කාර්යාංශයේ අරමුණුගත කාර්යයක් නොවූ මාධ්‍යවේදීන් දැනුවත් කිරීම සඳහා පැවති වැඩමුළු 02 කට සහභාගීවන මාධ්‍යවේදීන්ට ත්‍යාග ලෙස ප්‍රදානය කිරීම සඳහා රු.479,000 ක් වූ ඩොන්ගල් 175 ක් මිලදී ගෙන තිබුණි. | ආයතනයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව පැවැත්වූ මාධ්‍යවේදී වැඩමුළුවලදී අදාල ඩොන්ගල් ලබාදීම සිදුකර ඇත. මෙමගින් මාධ්‍යවේදීන්ට තාක්ෂණික සහායක් ලැබෙන අතර තොරතුරු සන්නිවේදනය සඳහා පහසුකම් සැලසීම මගින් මාධ්‍යවේදීන් සමග ඉහළ සම්බන්ධතාවයක් පවත්වා ගැනීම සඳහා අමාත්‍යතුමාගේ උපදෙස් මත සභාපතිතුමාගේ අනුමැතිය යටතේ අදාල වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. |
| ආ) | 2014 අප්‍රේල් 27 හා 29 යන දිනයන්හිදි විදේශ රැකියා පිළිබඳ දැනුවත් කිරීම් පා ගමන ගම්පහ හා කොළඹදී පැවැත්වීමේ දී එයට සහභාගීවන 5200 දෙනෙකුට ආහාර සැපයීම වෙනුවෙන් රු.2,854,000 ක් ද ටී ෂර්ට් හා තොප්පි මිලදී ගැනීම වෙනුවෙන් රු.3,627,000 ක් ද ගෑස් පිරවූ බැලුන් 3000 ක් හා බැනර් 30 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.925,304 ක් වශයෙන් රු.7,406,304 ක් පෞද්ගලික ආයතන වෙත ගෙවා තිබුණි. මේ සඳහා අනුමත වැඩ සටහනක් හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද ලබා ගෙන නොතිබුණු අතර ක්‍රමවත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කර නොතිබුණි. තවද උක්ත ගෙවීම්වලට අදාළව ඉදිරිපත් කර තිබූ ලේඛන පිළිගත නොහැකි වූ අතර මිලදී ගැනීම් විධිමත් පරිදි කාර්යාංශ ගබඩාව හරහා සිදු කර නොතිබීමෙන් එම භාණ්ඩ කාර්යාංශයට ලැබුණු බවටද සාක්ෂි නොවීය. | ප්‍රසම්පාදන අංශය මගින් මෙම කාර්යය කෙටිකාලයක් තුල සිදුකර තිබුඅතර මෙම කාර්යය ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත්ව ඇත. ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. මෙම භාණ්ඩ ප්‍රධාන ගබඩාවට ලබා ගැනීමට ප්‍රමාණවත් කාලයක් නොතිබූ බැවින් වැඩසටහන භාරව කටයුතු කල කාර්යාංශයේ වගකිවයුතු නිලධාරියෙකු වන අලෙවි ප්‍රවර්ධන විධායක සෘජුවම මෙම භාණ්ඩ භාරගෙන ඇති බව සඳහන් කරමි. |

| | | |
|---|---|---|
| ඇ) | 2014 මැයි 09 දින හම්බන්තොට දිස්ත්‍රික්කයේ විදේශ රැකියා අපේක්ෂකයින් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමේ ප්‍රචාරක කාර්යය වෙනුවෙන් රු.1,713,600 ක් සැලසිනේ ආයතනයට ගෙවා තිබුණද මෙවැනි වැඩසටහනක් පැවැත්වූ බවට සනාථ වන කිසිදු ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් නොවිය. | අදාල ආයතනය රජයට අනුබද්ධ නිසා මිල ගණන් කැදවීමකින් තොරව සභාපතිවරයාගේ අනුමැතිය යටතේ අදාල ගෙවීම් සිදුකර ඇත. |
| ඈ) | හාලි ඇළ විගමණික සම්පත් මධ්‍යස්ථානයට මුල්ගල තැබීමේ උත්සවයේ වියදම් වෙනුවෙන් සභාපතිගේ මූල්‍ය බලතල සීමාව ඉක්මවා රු.12,612,500 ක් අනුමත කර තිබූ අතර එම මුදලින් රු.9,157,060 ක් වැය කර ඇති බව දක්වා තිබුණද ඉන් රු.8,048,648 ක් උක්ත කාර්යයට යොදවා නොතිබුණි. | හාලිඇළ විගමණික සම්පත් මධ්‍යස්ථානය ඉදිකිරීම ආරම්භ කිරීමේ මුල්ගල තැබීමේ උත්සවය සදහා රු.12,612,500/- ක වියදම් ඇස්තමේන්තුව සදහා 2014.09.25 දිනැති අංක 117/2014 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් 2014.09.25 දින මේ සදහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ඇත. දින දෙකක කෙටි කාලයක් තුල මෙම කාර්යයන් සිදුකරන ලෙසට දන්වා ඇති බැවින්, ප්‍රසම්පාදන පිළිවෙත්වල අඩුපාඩු සිදුවී ඇති බවත් ඉදිරියේදී අඩුපාඩු ඇති නොවන අයුරින් කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බවත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(පරිපාලන හා මානව සම්පත්)ගේ නිර්දේශය මත කළමණාකරු (ප්‍රසම්පාදන) විසින් දැනුම් දී ඇත. |
| ඉ) | සංක්‍රමණික දින සැමරුම වෙනුවෙන් උතුරු, නැගෙනහිර, සබරගමුව හා මධ්‍යම පළාත් 04 හි තෝරාගත් රටවිරු පවුල් 9375 ක පාසල් දරුවන් 11,000 කට පාසල් පොත් හා උපකරණ කට්ටල බෙදා දීමේ ආධාර වැඩසටහන සඳහා සැපයුම් කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකම රු.16,550,100 ක් පළාත් 04 වෙනුවෙන් ප්‍රසම්පාදන 04 ක් යටතේ කොටස්කර ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීම නිසා අමාත්‍යාංශ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැර වී තිබුණු බව නිරීක්ෂණය විය. | කෙටිකාලයක් තුල මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකල යුතුව තිබූ බැවින් ප්‍රසම්පාදන 04ක් යටතේ කොටස්කර සභාපතිතුමාගේ අනුමැතිය ලබාගෙන සිදුකරන ලදී.අමාත්‍යාංශ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරවී ඇති බවට එකග වන අතර ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදුනොවන ආකාරයට කටයුතු කිරීමට බලාපොරොත්තුවෙමි. |

| | | |
|---|---|---|
| ඊ) | නාය යෑම වෙනුවෙන් විපතට පත් මීරියබැද්ද, කොස්ලන්ද ප්‍රදේශයේ රටවිරු පවුල්වලට සහන සැලසීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී අධ්‍යක්ෂ මණ්ඩල පූර්ව අනුමැතියකින් තොරව රු.1,000,000 ක් බදුල්ල විගමණික සම්පත් මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරී වෙත බැංකු අණකරයකින් ගෙවා තිබුණි. | හදිසි ආපදා තත්වයක් යටතේ මෙම ගෙවීම සිදුකර ඇත. මේ සම්බන්ධ දැනට පරීක්ෂණ කටයුතු සිදුකරන අතර කාර්යාංශ නිලධාරියෙකුගේ වැඩ තහනමට ලක්කර ඇත. ඉදිරියේදී මෙවැනි කටයුතු සිදු නොවීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වමි. |
| උ) | කොළඹ දිස්ත්‍රික්කයේ අවදානම් හා හැකියා සංගණනය හා පුහුණු වැඩමුළුව වෙනුවෙන් ලබාගන්නා ලද රු.1,985,100 ක අත්තිකාරම් මුදල පියවීමට ඉදිරිපත් කරන ලද ජර්නල් වවුචරය මගින් සාවද්‍ය කොරතුරු පදනම්ව කාර්යාංශයේ මුදල් අයථා පරිහරණය කර තිබූ බවට අභ්‍යන්තර විගණන අංශයෙන් සිදුකරනු ලැබූ පරීක්ෂණයේදී අනාවරණය වී තිබුණි. තවද පීආර්ඊ/2015/43 හා 2014 නොවැම්බර් 22 දිනැති මැතිවරණ කොමසාරිස්ගේ ලිපියේ ඡේද අංක 05(i) ට පටහැනිව 2015 ජනාධිපතිවරණ කාල සීමාව තුළ මෙම වියදම් දරා තිබුණි. | මේ සම්බන්ධ දැනට පරීක්ෂණ කටයුතු සිදුකරන අතර කාර්යාංශ නිලධාරියෙකුගේ වැඩ තහනමට ලක්කර ඇත. ඉදිරියේදී මෙවැනි කටයුතු සිදු නොවීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වමි. |
| **4.7** | **ඌන උපයෝජිත වත්කම්**<br>---------------------------<br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| අ) | 2004 වර්ෂයේ ස්ථාපිත කර තිබූ රු.60,831,694 ක් වටිනා මලාපවහන පද්ධතිය සඳහා නැවත 2009 වර්ෂයේ රු.492,796 ක උපකරණ ලබාගෙන තිබූ අතර එය ප්‍රයෝජනයට නොගෙන අනාරක්ෂිතව ගබඩාවේ තබා තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා මෙම අමතර උපකරණය ක්ෂණිකව ලබාගැනීම අපහසු නිසා අදාල සේවා සැපයුම්කරන ආයතනය නිර්දේශ මත මෙම ඇණවුම කර ඇත. මේ වනවිට එය ආරක්ෂිතව තැබීමට කටයුතු කර ඇත. |

| | |
|---|---|
| ආ) 1999 හා 2009 වර්ෂවල මිලදීගත් වාහන 05 ක් නිශ්කාර්යව පැවති අතර 2009 වර්ෂයේ මිලදී ගන්නා ලද වාහන 02 ක් ඌන උපයෝජිත තත්වයේ තිබුණි. | මෙම වාහන අළුත්වැඩියාව සඳහා විශාල මුදලක් වැයවන බැවින් අළුත්වැඩියා කටයුතු සිදුකර නොමැත.මේ වන විට විධිමත් ප්‍රසම්පාදන පටිපාටියට අනුව අපහරණය සඳහා කටයුතු කරමින් පවතී. |
| **4.8 ආර්ථික නොවූ ගනුදෙනු**<br>---------------------------<br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| අ) කාර්යාංශය විසින් ගාල්ල දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය සඳහා ඉදිකිරීම් කටයුතු අවසන් නොකළ ගොඩනැගිල්ලක් රු.300,000 ක මාසික කුලියට, ලබාගෙන තිබුණි. එම බදුකරු ගොඩනැගිලි ඉදිකිරීම් අවසන් කළ පසු රජයේ තක්සේරු වටිනාකම වූ රු.400,000 ක්, ලෙස මාසික බදු කුලිය වැඩිකර තිබුණු අතර කාර්යාංශය විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ එකඟ වූ තීරණය අභිබවා මාසික බදු කුලිය ඉහළ නැංවීමට කටයුතු කර තිබුණි. | රු.300,000 ක මාසික කුලියට ලබාගත් ගොඩනැගිල්ල පසුව පුහුණු මධ්‍යස්ථානයකට සුදුසු පරිදි කාර්යාංශයේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කරන ලදී. විශාල වටිනාකමකින් මෙම වෙනස් කිරීම සිදු වූ බැවින්,රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ගොඩනැගිලි හිමිකරු විසින් පසුව ලබාගෙන ඉදිරිපත් කළ තක්සේරු වටිනාකමෙහි වැඩිවීමක් සිදුව ඇත. ඒ අනුව තක්සේරු වටිනාකම වූ රු.400,000 ක මාසික බදු කුලිය ගෙවා ඇත. |
| ආ) තොරතුරු තාක්ෂණ උපදේශකයෙකුගෙන් හා නිලධාරීන් 24 දෙනෙකුගෙන් සමන්විත තොරතුරු තාක්ෂණ ඒකකයක් කාර්යාංශය තුළ පිහිටුවා තිබියදී, විවෘත වෙළඳපල මිල ගණන් කැඳවා කාර්යාංශයේ වෙබ් අඩවිය නැවත නිර්මාණය කිරීම සඳහා රු.780,000 ක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි. | කාර්යාංශයේ කටයුතු සම්බන්ධයෙන් නිපුණතාවයෙන් යුතු වුවද වෙබ් අඩවි නිර්මාණය සම්බන්ධයෙන් කාර්යාංශ නිලධාරීන් සතුව ප්‍රමාණවත් පුහුණුවක් නොතිබූ බැවින් ඉහළ කළමණාකාරීත්වයේ නිර්දේශ මත ලියාපදිංචි සැපයුම්කරුවන් වෙතින් මිල ගණන් කැඳවා අදාල කාර්යය සිදු කරගන්නා ලදී. |
| ඇ) රටවිරු ටැලන්ට් ස්ටාර් ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දරන ලද රු.27,545,985 ක් අදාළ ව්‍යාපෘතිය අත්හැර දැමීම හේතුවෙන් ආර්ථික නොවන වියදමක් ලෙසට විගණනයට නිරීක්ෂණය විය. | වර්තමානයේ මෙම වැඩසටහන ක්‍රියාවෙහි යෙදවීම අත්හැර දමා ඇත |

| | |
|---|---|
| ඇ) ගිවිසුම් අත්සන් කිරීමේ කාර්යාල පරිශ්‍රය වෙනුවෙන් ගොඩනැගිල්ලක් බදු ගැනීම් ක්‍රියාවලියේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සලකා බැලිය යුතු කරුණු කෙරෙහි අවධානය යොමු නොකර කටයුතු කිරීම හේතුවෙන් ගොඩනැගිලි දෙකක් සඳහා 2014 දෙසැම්බර් මස සිට 2015 මාර්තු 13 දින දක්වා කාල පරිච්ඡේදයට පිළිවෙලින් රු.2,625,000 ක් සහ රු.1,926,000 ක් කුලී ගෙවීමට කාර්යාංශයට සිදුවී තිබුණි. | කාර්යාංශයේ අවශ්‍යතාවය අනුව නව ගොඩනැගිල්ල සකස්කර ගත යුතු නිසා එම ගොඩනැගිල්ල සඳහා බදු ගිවිසුමකට සම්බන්ධ වී ප්‍රසම්පාදන මාර්ගයන් ඔස්සේ අදාල කටයුතු සිදුකර ගැනීමට කාලයක් ගතවී ඇත. අදාල කාල පරිච්ඡේදය සඳහා ගොඩනැගිලි දෙක සඳහාම බදුකුලී ගෙවා ඇත. |
| **4.9 හඳුනාගන්නා ලද පාඩු**<br>------------------------<br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| අ) 2011 හා 2012 වර්ෂවලට අදාළව ජාතික රක්ෂණ අරමුදල් භාරයට හා ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය වෙත රක්ෂණ වාරික ලෙස ගෙවා තිබූ රු.218,681,760 ක මුදලෙහි ඇතුළත් රු.23,430,210 ක් වූ යෙදවුම් බදු සහ කංගල්ල විගමනික පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ගෙවන ලද රු.58,549,800 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලෙහි ඇතුළත් රු.5,635,915 ක් වූ වැට් බදු, යෙදවුම් බදු ලෙස අඩුකර ගැනීමට කටයුතු කර නොතිබීමෙන් කාර්යාංශයට රු.29,066,125 ක අලාභයක් සිදු වී තිබුණි. | එවකට සිටි සභාපතිතුමා විසින් අදාල කාර්යාංශ නිලධාරීන් එම මුදල් වංචා කර නොමැති බැවින් ඔවුන් වෙත චෝදනා පත්‍ර නිකුත් කිරීම අනවශ්‍ය බවත් එම නිලධාරීන්ට අවවාදාත්මක ලිපි නිකුත් කරන ලෙසත් නියෝග දී තිබූ අතර ඒ අනුව 2015.08.13 වන දින හිටපු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(මුදල්) වෙත සහ විෂය භාර නිලධාරී වෙත පරිපාලන හා මානව සම්පත් අංශය මගින් අවවාදාත්මක ලිපි නිකුත් කර ඇත. |

| | |
|---|---|
| ආ) අබුඩාබිහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන කාර්යාංශයේ කම්කරු සුභසාධන අංශයේ ලිපිකරු නිලධාරිනිය විසින් 2014 ජුනි 03 සිට 09 දින දක්වා වූ කාල සීමාව තුළදී රැස්කරගන්නා ලද එමිරේට්ස් ඩිරාම්29,295 ක් වූ (ආසන්න ලෙස රු.1,058,276 ක) මුදල , මුදල් රෙගුලාසි 187(3) ප්‍රකාරව අප්‍රමාදව බැංකු ගත කිරීමට කටයුතු නොකිරීම හා එම ප්‍රමාණයෙන් කම්කරු සුභසාධන අංශයේ මුදල් හිඟයක් පැවතීම සම්බන්ධයෙන් විධිමත් පියවරක් කාර්යාංශය විසින් ගෙන නොතිබුණු අතර යථෝක්ත නිලධාරිනියකාර්යාංශ සේවයෙන්ද නිදහස් කර තිබුණි. | මේ සම්බන්ධව අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඇත. විමර්ශන කටයුතු සිදුවෙමින් පවතී. |
| **4.10 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් කාර්යාංශයේ සම්පත්**<br>------------------------------------------------------------<br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| අ) 2003 ජුනි 02 දිනැති අංක පිඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව කාර්යාංශයට අයත් හා කුළී පදනම මත ලබා ගන්නා ලද වාහන 04 ක් අදාළ අමාත්‍යාංශය හා වෙනත් රජයේ ආයතන වෙත ලබා දී තිබූ අතර කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.4,126,716 ක් වැය කර තිබුණි. | රේඛීය අමාත්‍යශයේ රාජකාරී සඳහා වාහන වෙන් කොට තිබුනද පසුව එලෙස වාහන ලබා නොදීමට කටයුතු කර ඇත. |
| ආ) කාර්යාංශයේ නිලධාරින් 10 දෙනෙකු අමාත්‍යාංශයේ හා රජයේ අනෙකුත් ආයතනවල සේවයේ යොදවා තිබුණු අතර 2013 හා 2014 වර්ෂවල පිළිවෙලින් රු.5,425,814 ක් හා රු. 5,637,205 ක් වැටුප් හා වේතන ලෙස ගෙවා තිබුණි. | අදාල නිලධාරීන්ගෙන් අටදෙනෙකු මේ වන විට කාර්යාංශයේ සේවයට වාර්තා කර ඇති අතර දෙදෙනෙක් සේවයෙන් ඉවත් වී ඇත. |

| | |
|---|---|
| **4.11 කාර්ය මණ්ඩල පරිපාලනය**<br>------------------------------<br>2014 දෙසැම්බර් 31 දිනට කාර්යාංශයට අදාළව කාර්ය මණ්ඩල විස්තර පහත සඳහන් පරිදි වේ. | |
| අ) 2014 දෙසැම්බර් 31 දිනට කාර්යාංශයේ තනතුරු 22 ක් සඳහා 1216 ක ස්ථිර කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණද තථ්‍ය ස්ථිර කාර්ය මණ්ඩලය 1116 ක් වීමෙන් 100ක පුරප්පාඩු නිරීක්ෂණය වූ අතර අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර කොන්ත්‍රාත් හා ද්විතික පදනම මත පිළිවෙලින් නිලධාරීන් 70 ක් හා 21 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණි | කාර්යාංශයේ සේවා අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා අදාල නිලධාරීන් සේවයේ යොදවාගෙන ඇත. මේ අතුරින් සැලකිය යුතු ප්‍රමාණයකගේ සේවා කොන්ත්‍රාත්තු අවලංගු කර ඇත.අදාල තනතුරුවල කටයුතු කල නිලධාරීන් සතුව මූල්‍ය කළමණාකරණය, ගුවන් ටිකට්පත් අලෙවිය සහ තොරතුරු තාක්ෂණය වැනි සුවිශේෂි කෙෂ්ත්‍රයන් සම්බන්ධයෙන් අදාල දැනුම නොතිබූ නිසා කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගැනීම සිදුකර ඇත. |
| ආ) අනුමත නොවූ තනතුරු 08 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 167 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර ඒ සඳහා රු. 60,188,791 ක මුදලක් 2014 වර්ෂය තුළදී වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | අදාල තනතුරුවල කටයුතු කල නිලධාරීන් සතුව මූල්‍ය කළමණාකරණය, ගුවන් ටිකට්පත් අලෙවිය සහ තොරතුරු තාක්ෂණය වැනි සුවිශේෂි කෙෂ්ත්‍රයන් සම්බන්ධයෙන් අදාල දැනුම නොතිබූ නිසා කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගැනීම සිදුකර ඇත. මේ අතුරින් සැලකිය යුතු ප්‍රමාණයකගේ සේවා කොන්ත්‍රාත්තු අවලංගු කර ඇත. |

| | |
|---|---|
| **5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය** | |
| **5.1 සංයුක්ත සැලැස්ම** | |
| කාර්යාංශය විසින් 2011-2015 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද 2007 දෙසැම්බර් 18 දිනැති පිඊඩී/47 දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2003 ජුනි 02 දිනැති අංක පිඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය අනුව,ඒ ඒ වර්ෂ අවසානයට සංයුක්ත සැලැස්මේ කාර්යයන් ඉටු කිරීම පිළිබඳ ප්‍රගතිය හා ක්‍රියාත්මක නොවුණු හා මන්දගාමී අංශ පිළිබඳ ඇගයීමක් කර ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් පිළියෙල කර නොතිබුණ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයටද ලක්කර නොතිබුණි. | 2014 වර්ෂයේ ක්‍රියාත්මක නොවූ හා මන්දගාමී අංශ පිළිබඳ ඇගයීමක් සිදුකර එමගින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රගති වාර්තාව සකස්කර විදේශසේවා අමාත්‍යාංශය, රජයේ විගණන දෙපාර්තමේන්තුව හා ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.තවද අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමුකර ඇත. |
| **5.2 ප්‍රසම්පාදන සැලැස්ම** | |
| පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| අ)2013 සැප්තැම්බර් සිට 2014 සැප්තැම්බර් කාල පරිච්ඡේදය තුළ දකුණු කොරියානු රැකියා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා විගමණිකයන්ට ටී ෂර්ට් හා ශීත කබා මිලදී ගැනීම සඳහා රු.මිලියන 20 ක් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 පරිච්ඡේදය ප්‍රකාරව මෙම වියදම් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 28 හා 2014 ජුලි 04 දිනැති මාර්ගෝපදේශ යොමුව 2.14.1 ප්‍රකාර වෙළඳපල මිල සැදහුම් ක්‍රමය අනුගමනය කල හැකි සීමාව රු.මිලියන 5 ක් දක්වා වුවත් රු.6,840,000 ක් වූ යථෝක්ත මිලදී ගැනීම් සඳහා එම ක්‍රමය අනුගමනය කර තිබුණි.තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12 පරිච්ඡේදය ප්‍රකාරව ලංසුකරුවන්ගේ පූර්ව සුදුසුකම් පරීක්ෂා නොකිරීම හේතුවෙන් ශීත කබා සඳහා වූ ඇණවුම ලබා දීමට ටෙන්ඩර්කරු අපොහොසත් වී තිබුණි. | අදාල ඇණවුම ලබාදීමට සැපයුම්කරු අපොහොසත් වීම නිසා කාර්ය සාධන බැදුම්කරය කාර්යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කරන ලදී. |

| | |
|---|---|
| ආ) කාර්යාංශය විසින් නිලධාරින්ගේ නිල ඇඳුම් සඳහා සාරි මිලදී ගැනීමේ දී රු.20,563 ක් වැයකර සාරි පිරිවිතරයක් සකස් කර තිබියදී දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් එයින් බැහැරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12 ඡේදයට පටහැනිව වෙනත් ආයතනයක් වූ බදුල්ල දිස්ත්‍රික් රටවිරු ව්‍යවසායකත්ව හා සංවර්ධන සමුපකාර සමිතිය වෙත එකී කොන්ත්‍රාත්තුව ලබා දී තිබුණි. මේ අනුව මුලින් පිලියෙල කල සාරි පිරිවිතරය වෙනුවට වෙනත් පිරිවිතරයක් සහිත සාරි මිලදී ගෙන තිබීම හේතුවෙන් එම වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණු අතර පිරිවිතරයන් වෙනස් කිරීම හේතුවෙන් සාරි මිලදී ගැනීම වෙනුවෙන් රු.1,279,200 ක් වැඩිපුර ගෙවා තිබුණි. | සියළුමශ්‍රේණි සඳහා අත්යන්ත්‍ර සාරි ලබා ගන්නා ලෙසට අමාත්‍යාංශ ලේකම්තුමා විසින් දී තිබූ උපදෙස් මත අත්යන්ත්‍ර සාරි මිලදී ගැනීමට තීරණය විය. එම නිසා මිලෙහි වෙනසක් සිදුවිය.තවද අදාල සැපයුම් ආයතනය රටවිරුවන් දිරිමත් කිරීම සඳහා ලබාදෙන දායකත්වය මෙහිදී සැලකිල්ලට ගෙන ඇත. |
| ඇ) 2013 මාර්තු සිට 2014 මාර්තු දක්වා කොරියානු නේවාසික පුහුණුලාභීන්ට ආහාරපාන සැපයීම වෙනුවෙන් ආහාර සැපයීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 21 හා 2012 පෙබරවාරි 23 දිනැති මාර්ගෝපදේශ 3.4 ට පටහැනිව රු.38,306,628 ක් ගෙවා තිබුණි. | මෙම කාර්යය ආරම්භ කිරීමේදී කොරියානු රැකියාලාභීන්ට ගිවිසුම් ලැබීම පිළිබඳ නිශ්චිත තීරණයක් නොවීම නිසා අදාල ප්‍රසම්පාදනය පුවත් පත් දැන්වීමක් සිදුනොකර ලියාපදිංචි සැපයුම්කරුවන් 10කුට ලියාපදිංචි තැපෑලෙන් ටෙන්ඩර්පත් යොමු කිරීමෙන් අවශ්‍ය ප්‍රසම්පාදනය සිදුකරන්නා ලදී.වර්තමානයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහ අනුව මේ සඳහා සැපයුම් කරුවන් තෝරා ගැනීම සිදු කරනු ලැබේ. |
| ඈ) 2014 මාර්තු සිට 2014 ජුනි දක්වා වූ වැඩසටහන් 28 ක පුහුණුලාභීන් 1,244 ක් සඳහා රු.9,526,603 ක් වූ ආහාර සැපයීම් කොන්ත්‍රාත්තුව ගිවිසුමක් හෝ ප්‍රසම්පාදන කමිටු අනුමැතියකින් තොරව ලබා දී තිබුණි. | ප්‍රසම්පාදන පිළිවෙත් අනුව නව සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට කාලය ගතවන බැවින් වරින් වර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය අනුව පැරණි සැපයුම් කරුගෙන් මෙම සේවාව ලබා ගැනීම සිදුකර ඇත. |

| | | |
|---|---|---|
| ඉ) | රු.මිලියන 10 දක්වා මාස 03 ක කාල පරිච්ඡේදයක් සඳහා ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුවට අදාළ ගිවිසුමට එළඹීමේ දී එය වර්ෂයක කාල පරිච්ඡේදයක් ලෙසට ලබා දී තිබූ අතර 2014 ජූලි 04 දිනැති ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය සඳහා වූ අතිරේක 28 හි  මාර්ගෝපදේශ 2.14.1 අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව නොසලකා ඒකක මිල පමණක් සැලකිල්ලට ගෙන සැපයුම්කරු තෝරා ගෙන තිබුණි. | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මාස 03 ක කාලයක් සඳහා සැපයුම්කරුට අනුමැතිය ලබා දී ඇති අතර, ප්‍රසම්පාදන අංශය අත්වැරදීමකින් වසරක කාලයකට ගිවිසුම සකස්කර ඇති බව සඳහන් කරමි. |
| ඊ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 ට පටහැනිව සැපයුම්කරු සමඟ ගිවිසුමකට ඇතුලත් නොවී රු.2,127,655 ක් ආහාර සැපයීම සඳහා ගෙවීම් කර තිබුණි. | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම සැපයුම්කරුවෙත  සේවාවාන් සැපයීමට මාස 01 ½ කට වැනි කෙටි කාලයකට අනුමැතිය ලබා දී ඇති බැවින්  කාර්යය සාධන බැදුම්කරයක්  හා ව්‍යාපාර ලියාපදිංචි සහතිකයක් ලබා ගැනීමට නොහැකි වී ඇත. |
| **5.3** | **අයවැය ලේඛනමය පාලනය**<br>---------------------------------<br>කාර්යාංශයේ අයවැයගත ඇස්තමේන්තුවල නිවැරදිතාව සම්බන්ධයෙන් විගණනයට සෑහීමට පත්විය නොහැකි වූ අතර2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කාර්යාංශයේ ප්‍රචාරණ වියදම්වල ඇතුළත් රූපවාහිනි වැඩසටහන් සඳහා වියදම සියයට 900 කින් සහ ගුවන් විදුලි වැඩසටහන් සඳහා වියදම සියයට 517 කින් ඉහළ ගොස් තිබුණි.තවද ව්‍යාපාර ප්‍රවර්ධන වියදම්වල වෙළඳපොළ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා වියදම සියයට 394 කින් ද කොරියානු ව්‍යාපෘති වියදම සියයට 203 කින් ඉහළගොස් තිබූ අතර අයවැය ලේඛනය මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බැව් නිරීක්ෂණය විය. | අයවැය වියදම් සම්බන්ධව සිදුකර ඇස්තමේන්තුවකි. එය කළමණාකාරීත්වයේ අවශ්‍යතාවය මත ගනුලබන තීරණ ක්‍රියාත්මක කිරීමේදී ඇස්තමේන්තුගත වියදම්වල විචලනයන් සිදුවිය හැක.ඉදිරි වර්ෂයන්හිදී අයවැය ලේඛණය පිළියෙල කිරීමේදී මෙවැනි විචලනයන් අවම වන ආකාරයට වියදම් ඇස්තමේන්තු සැකසීමට අපේක්ෂා කරමි. |

| | |
|---|---|
| **5.4 නොවිසඳී ඇති විගණන ඡේද**<br>--------------------------------<br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| අ) මුදල් රෙගුලාසි අංක 371(2) ඇ ඡේදයට පටහැනිව 2003 හා 2004 වර්ෂවල අවස්ථා 10 කදී ලබා දෙන ලද රු. 129,500 ක අත්තිකාරම් මුදල් වසර 10 කට වඩා වැඩි කාලයක් පියවා නොතිබුණි. | මෙම අත්තිකාරම් නිරවුල් නොකර පැවති නිසා කාර්යාංශයේ නීති අංශය වෙත යොමු කළ අතර එම අත්තිකාරම් ලබාගත් නිලධාරීන් සේවය හැරගොස් තිබූ නිසාත් ඔවුන්ගේ වත්මන් ලිපිනයන් පිළිබඳව පැහැදිලි තොරතුරු සපයා ගැනීම අසීරු වූ නිසාත් නෛතික පියවර ගැනීමට නොහැකිව මෙම අත්තිකාරම් තවදුරටත් නිරවුල් නොවූ අත්තිකාරම් ලෙස පවතී. කෙසේ වුව ද තවදුරටත් මෙම අත්තිකාරම් නිරවුල් කර ගැනීම සඳහා උත්සහයන් ගනිමින් පවතී. |
| ආ) 2009 සැප්තැම්බර් මාසයේ දී ව්‍යාජ ලෙස අත්සන් යොදා ලබාගත් රු.400,000 ක් වූ චෙක්පත් 2 ක හඳුනානොගත් හර ශේෂ ලෙස දක්වා තිබූ අතර එම වංචාව සම්බන්ධයෙන් අප්‍රමාදව කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් විනය පරීක්ෂණ වාර්තා නැවත කැඳවා ඇති අතර ලැබෙන පරීක්ෂණ වාර්තාව අනුව විනය නියෝගයක් නිකුත් කිරීමට කටයුතු යොදා ඇත. |
| ඇ) 2007 හා 2008 වර්ෂවල කොරියාවට ශ්‍රමිකයන් විදේශ ගත කිරීමේදී, විදේශගත නොවූ ශ්‍රමිකයන් 62 ක් සඳහා මිලදීගත් යානාපත්‍ර ආපසු ඔවුනට භාර නොදීම හේතුවෙන් සිදු වූ රු.2,264,660 ක මූල්‍ය පාඩුවක් සම්බන්ධයෙන් කාර්යාංශය විසින් විධිමත් ක්‍රියාමාර්ගයක් අප්‍රමාදව ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අදාල පරීක්ෂණයේ නිර්දේශ අනුව සිදුවී ඇති අලාභය අදාල නිලධාරීන්ගෙන් අය කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව කටයුතු සිදු කර ඇත.මාසිකව අදාල අයකර ගැනීම් සිදුවෙමින් පවතී. |

| | |
|---|---|
| ඇ) සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි විගමනික පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව කතරගම, හෝමාගම, කහගොල්ල, සහ දඹුල්ල විගමනික සම්පත් මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා 2007 වර්ෂයේ සිට 2010 දක්වා කාල සීමාව තුළදී රු.50,372,816 ක මුදලක් වැය කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය තෙක් එම ඉදිකිරීම් ව්‍යාපෘතිවල වැඩ නිමකර නොතිබුණි. | විවිධ හේතූන් මත මෙම ප්‍රමාදයන් සිදුවී ඇති බැවින් විගණන විමසුමේ සඳහන් කරුණු නිවැරදි වන අතර මේ වන විට කතරගම විගමණික සම්පත් මධ්‍යස්ථානය ඉදිකිරීමට ගන්නා ලද තීරණය වෙනස් වී එම ඉඩමෙහි විගමණික සේවකයින් සහ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සංචාරක නිකේතනයක් ඉදිකිරීමට තීරණය කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතී.හෝමාගම සහ කහගොල්ල ඉඩම් පිලිබඳ නීතිමය තත්වයන් නිරාකරණය වූ පසු ගොඩනැගිලි ඉදිකිරීමට බලාපොරොත්තුවේ.දඹුල්ල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇති කොන්ත්‍රාත් ආයතනය සඳහා මුදල් අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා දී නොමැත. |
| **6. පද්ධති හා පාලනයන්**<br>-----------------------<br>විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමු කළයුතු වේ. | |
| අ) ගිණුම්කරණය. | කාර්යාංශයේ ආදායම් හා වියදම් විධිමත් ලෙස ගිණුම් පොත්වලට ඇතුළත් කිරීමට හැකි උපරිම වශයෙන් පියවරගෙන ඇත. මේ සඳහා නව ගිණුම්කරණ පද්ධතියක් හඳුන්වාදීමට කටයුතු කිරීමත් වරලත් ගණකාධිකාරී ආයතනයක උපදේශන සේවය ලබාගනිමින් ගිණුම්කරණ කටයුතු විධිමත් කිරීමට කටයුතු කෙරෙමින් පවතී. |
| ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය. | විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු හා නිර්දේශයන් ඇගයීමකට ලක්කර ඉදිරියේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් ආකාරයට පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. |

| | |
|---|---|
| ඇ) වාහන පරිපාලනය. | රාජකාරී කටයුතු සඳහා වාහන අයදුම් කිරීම සහ යෙදවීම පරිඝණක පද්ධතිය ආශ්‍රයෙන් සිදු කරනු ලබන අතර එම සියළු තොරතුරු දත්තගත කර ඇත. |
| ඈ) විදේශ දූත මණ්ඩල මගින් උපයන ආදායම් හා සේවා සැපයුම්. | විදේශදූත මණ්ඩල සඳහා උපයන ආදායම් පරිපාලන කටයුතු බොහෝ විට අදාල දූත මණ්ඩල කළමණාකරණය සඳහා යොදා ගන්නා අතර අතිරික්ත වූ විට එම මුදල් කාර්යාංශය ගිණුමට බැරකර ගනී. විදේශ දූත මණ්ඩල මගින් රැස්කරන මුදල් කාර්යාංශ ගිණුම් වලට බැර කිරීම සඳහා අවශ්‍ය නිසි උපදෙස් හා ක්‍රියා පිළිවෙත් පිළිබඳව අදාළ දූත මණ්ඩලවල කම්කරු අංශ දැනුවත් කර ඇති අතර එම මුදල් යෙදවීමේදී ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව ඔවුන් දැනුවත් කර ඇත. |
| ඉ) විදේශ රැකියා නියෝජිත ආයතනවල කටයුතු. | රැකියා නියෝජිතායතන සඳහා නව බලපත්‍ර ලබා දීමේදී සහ පවතින බලපත්‍ර අළුත් කිරීමේදී අනුගමනය කලයුතු ක්‍රියා පටිපාටි මේ වනවිට අදාල අංශ දැනුවත් කර ක්‍රියාවෙහි ක්‍රියාත්මක වෙමින් පවතී. |
| ඊ) වත්කම් උපයෝජනය. | වත්කම් භෞතික පරීක්ෂාව වාර්ෂිකව සිදුකරනු ලබයි.එහිදී වත්කම්වල ආරක්ෂාව සහ උපයෝජනය සඳහා සෑම විටම උපදෙස් ලබා දීමට කටයුතු කර ඇත. ඉදිරියේදී උපදෙස් පත්‍රිකා පිළියෙල කර අවශ්‍ය උපදෙස් ලබා දීමට කටයුතු කරමි. |